# ප්‍රගති වාර්තාව
# விருத்தி அறிக்கை
# PROGRESS REPORT 2024

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சு
**Ministry of Agriculture, Livestock, Lands and Irrigation**

වාරිමාර්ග අංශය / நீர்ப்பாசன பிரிவு / **Irrigation Division**

# ප්‍රගතිය 2024

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

වාරිමාර්ග අංශය

# පටුන


| | පිටු අංකය |
|---|---|
| හැඳින්වීම | 01 |
| දැක්ම | 01 |
| මෙහෙවර | 01 |
| අමාත්‍යාංශයේ අරමුණු | 02 |
| අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් | 03 |

විශේෂ ව්‍යාපෘති හා වැඩසටහන්

| | |
|---|---|
| **1.** මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP) | 04 |
| **2.** උමාඔය බහුකාර්යය සංවර්ධන ව්‍යාපෘතිය | 07 |
| **3.** මොරගහකන්ද සහ කළුගඟ ජලාශ ව්‍යාපෘතිය | 07 |
| **4.** දේශගුණික බලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන (CResMPA) | 09 |
| **5.** ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP) | 14 |
| **6.** දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය (වැව් ගම් පුබුදුව) (CRIWMP) | 18 |
| **7.** නකල්ස් කඳුවැටියේ අවදානමට ලක්ව ඇති ගංගා ද්‍රෝණි, දිය ඇළි ආශ්‍රිත ප්‍රදේශ සහ පහළ ජල පෝෂක ප්‍රදේශයේ වාසය කරන ගොවීන් සහ වැවිලි ප්‍රජාවගේ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ ශක්තිය වැඩි දියුණු කිරීම (හරිත දේශගුණික අරමුදල) (GCF Knuckles) | 21 |

ක්‍රියාත්මක ආයතන - ව්‍යාපෘති හා වැඩසටහන්

| | |
|---|---|
| ➢ වාරිමාර්ග දෙපාර්තමේන්තුව (ID) | 23 |
| ➢ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය (MASL) | 39 |
| ➢ වාරිමාර්ග කළමනාකරණ අංශය (IMD) | 50 |
| ➢ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) | 58 |
| ➢ මධ්‍යම ඉංජිනේරු සේවා පෞද්ගලික සමාගම (CESL) | 63 |
| ➢ කොත්මලේ ජාත්‍යන්තර පුහුණු ආයතනය (KITI) | 66 |
| ➢ ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව (ECSL) | 71 |
| ➢ මහවැලි උපදේශන කාර්යංශය (MCB) | 74 |

ඇමුණුම්

ඇමුණුම I - වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති

ඇමුණුම II - ක්‍රියාත්මක ආයතන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති / වැඩසටහන්

# කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

## වාරිමාර්ග අංශය

වාරිමාර්ග අමාත්‍යාංශය ලෙස ක්‍රියාත්මක වෙමින් පැවති මෙම අමාත්‍යාංශය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2403/53 හා 2024 සැප්තැම්බර් මස 27 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධනය කර කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය ස්ථාපිත කරන ලදී. පසුව 2024 නොවැම්බර් මස 25 වැනි දින අංක 2412/08 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් එය කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය ලෙස නැවත සංශෝධනය කරන ලදී.

ඒ අනුව, පෙර පැවති වාරිමාර්ග අමාත්‍යාංශය මේ වන විට කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයෙහි වාරිමාර්ග අංශය ලෙස සිය කාර්යභාරය ඉටුකරයි.

### දැක්ම



**තිරසාර ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය තුළින් සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීම**

### මෙහෙවර

**ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය තුළින් බහුවිධ අවශ්‍යතා ඉටු කරමින් ප්‍රජාවගේ හා පරිසරයේ යහපැවැත්ම සැලසීම**



# අරමුණු



i. රටේ සියලු ජල පරිභෝජන හා බලශක්ති අවශ්‍යතා සඳහා අවශ්‍ය වන ජල සම්පත සංවර්ධනය හා කළමනාකරණය

ii. ඉඩම් හා ජල භාවිත කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම

iii. ගංගා ද්‍රෝණි හා ජල මුලාශ්‍ර සංරක්ෂණය මගින් ජලයේ ගුණාත්මක බව හා තිරසාර බව ආරක්ෂා කිරීම

iv. ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමට අවශ්‍ය වාරි ජල හා කෘෂිකාර්මික උපදේශන පහසුකම් සැලසීම

v. සියලු ශ්‍රී ලාංකිකයන්ට සෞඛ්‍ය ආරක්ෂිත ගෘහස්ත ජල සැපයුමක් තහවුරු කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම

vi. පාරිසරික සමතුලිතතාව හා සංවර්ධනය සඳහා අවශ්‍ය ජල පහසුකම් සැලසීම

vii. වාරි පද්ධති ආශ්‍රිත ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම තුළින් කෘෂිකර්මාන්තයේ තිරසාර බව තහවුරු කිරීම

viii. කර්මාන්ත, සංචාරක සේවා අංශ වල ජල අවශ්‍යතා සපුරාලීම

xi. ශ්‍රී ලංකාවේ භූගත ජල සම්පත් සංවර්ධනය, සංරක්ෂණය හා කළමනාකරණය

x. මහවැලි විශේෂ ආර්ථික බලප්‍රදේශ මගින් ජාතික ආහාර නිෂ්පාදන ක්‍රියාවලියට සක්‍රීය දායකත්වයක් ලබාදීම



# ප්‍රධාන කාර්යයන්

i. අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්හි විෂයන්ට අදාල ප්‍රතිපත්ති සම්පාදනය, ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සමාලෝචනය හා ඇගයීම.

ii. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව සහ මහජන හිතකාමී අයුරින් ලබාදීම.

iii. ජල සම්පත් හා වාරි පද්ධති සංවර්ධනය.

iv. මෙහෙයුම හා නඩත්තුව ද ඇතුළුව වාරිමාර්ග පද්ධති හා ගංගා ද්‍රෝණි කළමනාකරණය

v. ජල මූලාශ්‍ර හා වාරිමාර්ග පද්ධති සංරක්ෂණය හා ආරක්ෂා කිරීම.

vi. වෙරළ ආරක්ෂණ විධිවිධාන සම්පාදනය කිරීම.

vii. බහුවිධ අවශ්‍යතා සඳහා අවශ්‍ය ජල ප්‍රමාණයන් වෙන්කිරීම සඳහා තාක්ෂණික මගපෙන්වීම හා නිර්ණායක සකස් කිරීම.

viii. ජල මූලාශ්‍ර හා ආශ්‍රිත පරිසර දූෂණය වැළැක්වීමට හා ජලයේ ගුණාත්මක බව තහවුරු කිරීම සඳහා උපාය මාර්ගික වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

ix. ගොඩබිමට කරදිය ගලා ඒම වැළැක්වීමේ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

x. අපවහනය සහ ගංවතුර ආරක්ෂණය.

xi. ඉංජිනේරුමය උපදේශන සේවා ලබා දීම.

xii. රාජ්‍ය අංශයේ ප්‍රධානතම ඉදිකිරීම් සේවා සැපයුම්කරු ලෙස ප්‍රමිතිගත ඉදිකිරීම් කාර්යයන්හි නිරතවීම.

xiii. වාරිමාර්ග පද්ධති වල ආයතනික සංවර්ධනය හා ඵලදායීතාවය ප්‍රවර්ධනය කිරීම.

xiv. භූගත ජලය සංවර්ධනය අධීක්ෂණය හා කළමනාකරණය.

xv. වැසි ජල සංරක්ෂණය, වැසි ජලය රැස්කිරීම ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

xvi. ජාතික විදුලිබල සැපයුමෙහි ප්‍රධාන පුනර්ජනනීය බලශක්ති සැපයුම්කරු ලෙස මහවැලි ජලාශ පද්ධති කළමනාකරණය

xvii. දේශීය ආහාර නිෂ්පාදන ක්‍රියාවලියේ ප්‍රධාන කොටස්කරුවෙකු ලෙස මහවැලි විශේෂ බල ප්‍රදේශ හරහා ලබාදෙන දායකත්වය පුළුල් කිරීම

xviii. දේශීය වාරිමාර්ග ඉංජිනේරු සේවාව ආරක්ෂා කරමින් වාරිමාර්ග ක්ෂේත්‍රයේ වෘත්තීය සේවා පුළුල් කිරීම.

# කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
# වාරිමාර්ග අංශය යටතේ ඇති ව්‍යාපෘති

## 1. මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP)

| | | | |
|---|---|---|---|
| **ඇස්තමේන්තුගත මුදල (රු.මි.)** | 160,356.00<br>(සංශෝධිත වැඩසටහන් පිරිවැය - ඇ.ඩො.මි. 976)<br>(ආසියානු සංවර්ධන බැංකුව විසින් සහතික කළ ණය මුදල - ඇ.ඩො.මි. 539) | **ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක** | මාතලේ, මහනුවර, අනුරාධපුර, කුරුණෑගල, පොළොන්නරුව |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | ආසියානු සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකා රජය | **ජලාශ ධාරිතාව (ඝන මීටර මිලියන)/ වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)** | **<u>ජලාශ ධාරිතාව (ඝන මීටර මිලියන)</u>**<br>• **උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය - ඝන මීටර** මිලියන 190<br>• **වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය - ඝන මීටර** මිලියන 130<br>**<u>වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)</u>**<br>• වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය - 13,000 (හෙක්.)<br>• උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය - 12,300 (හෙක්.)<br>• මිණිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය - 7,500 (හෙක්.) |
| **ව්‍යාපෘති කාලය** | 2015 - 2025 (ජුනි) | **ප්‍රතිලාභීන්** | **<u>අදියර 1 (ප්‍රතිලාභීන් ප්‍රමාණය)</u>**<br>• වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය - 300,000<br>• උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය - 700,000<br>• මිණිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය - 62,000 |
| **ප්‍රතිපාදන 2024 (රු.මි.)** | 28,460.00 | **2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය (රු.මි.)** | 24,690.69 |

| | | | |
|---|---|---|---|
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය (රු.මි.)** | 118,858.00 | **සමස්ථ භෞතික ප්‍රගතිය (%)** | 68.00% |
| **2024 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන** | **ඉදිකිරීම් පැකේජවල තත්ත්වය පහත පරිදි වේ.**<br>• දැනට ක්‍රියාත්මක වෙමින් පවතින කොන්ත්‍රාත් පැකේජවල 2024 දෙසැම්බර් 31 වන දින දක්වා භෞතික ප්‍රගතිය පහත පරිදි වේ,<br>➢ MLBCRP-ICB-1 - වම් ඉවුර සහ දකුණු ඉවුරු ඇළ මාර්ග සඳහා ජල පාලනය සහ මිනුම් පහසුකම් ඇතුළුව මිණිපේ අමුණ එසවීම - සමස්ථ ප්‍රගතිය - 100%<br>➢ NWPCP-ICB-2 නැබඩගහවත්ත සිට මහකිතුල පිවිසුම් උමඟ දක්වා ප්‍රධාන ඇළ ඉදිකිරීම (කි.මී. 5+250 සිට කි.මී. 22+300) - 2024 ප්‍රගතිය - 97%, සමස්ථ ප්‍රගතිය - 99.73%<br>➢ UEC-ICB-2B - කළු ගඟ/මොරගහකන්ද යා කරන කි. මී. 8.8 උමඟ ඉදිකිරීම (කි.මී 0+100 සිට 08+830 km) - 2024 ප්‍රගතිය - 79%, සමස්ථ ප්‍රගතිය - 97.92%<br>➢ UEC-ICB-2A- ඇළෙහි කි.මී.27+509 සිට කි.මී.55+600 දක්වා උමඟ ඉදිකිරීම - 2024 ප්‍රගතිය - 58%, සමස්ථ ප්‍රගතිය - 47.68%<br>➢ MLBCRP-6 ස්වයංක්‍රියකරණ කොන්ත්‍රාත් පැකේජය ඇතුළුව මූලස්ථායී වැඩ මිණිපේ දකුණු ඉවුර ඇළ වැඩිදියුණු කිරීම - 2024 ප්‍රගතිය - 29%, සමස්ථ ප්‍රගතිය - 21.75%<br>• පහත කොන්ත්‍රාත් පැකේජය තාවකාලිකව නතර කර ඇත,<br>➢ NWPCP-ICB-1 මහකිතුල පිවිසුම් උමඟ, මහකිතුල, මහකිරුළ ජලාශ හා මහකිතුල, මහකිරුළ යා කෙරෙන පෝෂක ඇළ මාර්ගය ඉදිකිරීම. - කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරීත්වය හේතුවෙන් 2023 මැයි 26 දින සිට බලපැවැත්වෙන පරිදි කොන්ත්‍රාත්තුව තාවකාලිකව නතර කර ඇත.<br>➢ MLBCRP-ICB-1 කොන්ත්‍රාත් පැකේජය භෞතිකව සම්පූර්ණ කර ඇති අතර, මූල්‍ය ගෙවීම් සැකසීම දැනට සිදුවෙමින් පවතී. - 2024 ප්‍රගතිය - 4%, සමස්ථ ප්‍රගතිය - 100%<br>**මහවැලි පද්ධතිවල ආර්ථික අර්බුදයෙන් පීඩාවට පත් ගොවීන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීම**<br>• මහවැලි පද්ධතියේ බී, සී, ඩී, ඊ, ජී, එච් සහ හුරුළු වැව හි ගොවීන් 200 දෙනෙකුට SMART කෘෂිකර්ම පැකේජ 200ක් ලබාදීම.<br>• මහවැලි පද්ධතියේ බී, සී, ඩී, ඊ, ජී, එච්, හුරුළුවැව සහ වලව ගොවීන් 1927 කට කුකුළු ආහාර කිලෝග්‍රෑම් 700,000 ක් සමඟ මාසයක් වයසැති අභිජනන පැටවුන් 100,000 ක් ලබාදීම (බිත්තර නිෂ්පාදනය සඳහා). | | |
| **2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි.)** | අයවැය සැලැස්ම ණය වාරික 1,2,3 සඳහා - 20,700<br>අයවැය සැලැස්ම අදියර 2 නව ව්‍යාපෘතිය- 21,000 | | |
| **2025 වර්ෂය සඳහා යෝජිත වැඩසටහන** | • UEC-ICB-2A සහ MLBCRP-6 හැර, ප්‍රදානය කරන ලද සියලුම කොන්ත්‍රාත්තු 2024 වසර තුළදී සාර්ථකව නිම කර ඇත.<br>• පහත සඳහන් ප්‍රධාන ව්‍යාපෘති 2025 වසර දී (NWPCP-ICB2, KMTC, MLBCRP-ICB1, MLBCRP-6) භෞතිකව සහ මූල්‍යමය වශයෙන් සම්පූර්ණ | | |

| | |
|---|---|
| | කිරීමට සැලසුම් කර ඇති අතර පසුව 2025 වර්ෂය තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට භාර දෙනු ඇත.<br>• සැලසුම් කළ ප්‍රගතියට අනුව, UEC-ICB-2A කොන්ත්‍රාත් පැකේජයේ භෞතික ප්‍රගතිය 2025 අවසන් වන විට 85%ක් වනු ඇත.<br>• මහවැලි පද්ධතිවල ආර්ථික අර්බුදයෙන් විපතට පත් ගොවීන්ගේ ජීවනෝපාය නගා සිටුවීම සඳහා ක්‍රියාත්මක කළ සියලු කටයුතු සාර්ථකව අවසන් කිරීම.<br>• මහවැලි පද්ධතියේ B කලාපයේ මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය ඉදිකිරීම<br>• ගොවීන් 375ක් සඳහා මහවැලි පද්ධතියේ B, C, D, E, G, H සහ හුරුළුවැව තුළ කිරි ගව පාලනය වැඩිදියුණු කිරීම. මේ යටතේ තෘණ බිම් පිහිටුවීම, අපජල ටැංකි සහ ඇසොල්ලා ටැංකි ඉදිකිරීම, එක් ගොවියකුට තහවුරු කරන ලද කෘත්‍රිම සිංචන වාර 4ක් සඳහා මුදල් ගෙවීම්<br>• සාන්ද්‍රණ ආහාර, තණබිම් වටා ආරක්ෂිත වැට සඳහා ද්‍රව්‍ය, තණකොළ කුඩා කැබලි වලට කපන යන්ත්‍ර, ක්ෂුද්‍ර වාරි පද්ධති, ගව ආහාර දමන ප්ලාස්ටික් බැරල් (Silage barrels) සහ කිරි දොවන යන්ත්‍ර ලබාදීම. |
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ | • මහවැලි පද්ධතියේ ගබඩා කර ඇති ජල සම්පත් උපරිම ප්‍රයෝජනයට ගැනීම<br>• උතුරු මැද පළාත තුළ කෘෂි ආහාර පද්ධති පරිවර්තනය කිරීමේ අවස්ථාව<br>• ආර්ථික පුනර්ජීවනය සඳහා දායකත්වය<br>➢ නිෂ්පාදනය වැඩි කරන ලද ආහාරවල වටිනාකම<br>➢ ආහාර ආනයනයේ වටිනාකම ආදේශ කර ඇත<br>➢ ආහාර අපනයනය ඉහළ යාමේ අගය<br>➢ ගෘහස්ථ ජල සැපයුම සඳහා ප්‍රවේශය වැඩි කිරීම<br>➢ රැකියා අවස්ථා වැඩි කිරීම<br>• වන සතුන් සඳහා ජලය ලබා ගැනීමේ හැකියාව වැඩි වීම. |

**මහවැලි කලාප වල ආර්ථික අර්බුදයෙන් පීඩාවට පත් ගොවීන් සඳහා ජීවනෝපාය වැඩිදියුණු කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම.**

| මහවැලි කලාපය | සුහුරු කෘෂිකාර්මික කට්ටල (SMART Packages) - 200 | | මසක් වයසැති කිකිළි පැටව් (100,000) සමඟ කුකුල් කෑම (කි.700,000) | | | |
|---|---|---|---|---|---|---|
| | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය | |
| | | | | | කුකුළු පැටවු | කුකුල් කෑම (කි.ග්‍රෑ) |
| බී | 100% රු.17.77 | 40 කට්ටල/ගොවීන් - 100% | ගොවීන් - 300 | 100% රු. 21.84 | 15,000 - 100% | කි. 94,800 - 100% |
| සී | 100% රු.8.88 | 20 කට්ටල/ගොවීන් - 100% | ගොවීන් - 294 | 100% රු. 23.35 | 14,400 - 100% | කි. 105,000 - 100% |
| ඩී | 100% රු.22.21 | 50 කට්ටල/ගොවීන් - 100% | ගොවීන් - 300 | 90% රු. 22.10 | 15,000 - 100% | කි. 96,000 - 91.5% |
| ඊ | අදාල නොවේ | අදාල නොවේ | ගොවීන් - 100 | 85% රු. 7.08 | 5,000 - 100% | කි. 30,000 - 86% |
| ජී | 100% රු.8.88 | 20 කට්ටල/ගොවීන් - 100% | ගොවීන් - 100 | 100% රු. 7.78 | 5,000 - 100% | කි. 35,000 - 100% |
| එච් | 100% රු.17.77 | 40 කට්ටල/ගොවීන් - 100% | ගොවීන් - 297 | 100% රු. 23.29 | 14,700 - 100% | කි. 104,000 - 100% |
| හුරුළු වැව | 100% රු.13.32 | 30 කට්ටල/ගොවීන් - 100% | ගොවීන් - 200 | 100% රු. 15.53 | 10,000 - 100% | කි. 70,000 - 100% |
| වලව | අදාල නොවේ | අදාල නොවේ | ගොවීන් - 336 | 100% රු. 31.14 | 13,600 - 100% | කි. 140,000 - 100% |

## 2. උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

| | | | |
|---|---|---|---|
| **ඇස්තමේන්තුගත මුදල (රු.මි.)** | 89,748.00 | **ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක** | බදුල්ල, මොණරාගල, හම්බන්තොට |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | ඇ.ඩො.මි. 50 ඉරාන ජනරජයෙන් සහ ශ්‍රී ලංකා රජයෙන් | **ජලාශ ධාරිතාව (ඝන මීටර මිලියන)/ වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)** | • පුහුල්පොල ජලාශය - ඝන මීටර් මිලියන 0.63<br>• ඩයරබා ජලාශය – ඝන මීටර් මිලියන 0.92<br>• ප්‍රතිලාභී ප්‍රදේශ - පවතින ඉඩම් හෙක්ටයාර 1500 හා නව ඉඩම් හෙක්ටයාර 4500 |
| **ව්‍යාපෘති කාලය** | 2010 - 2025 | **ප්‍රතිලාභීන්** | පවුල් 6,000 |
| **ප්‍රතිපාදන 2024 (රු.මි.)** | 4,500.00 | **2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය (රු.මි.)** | 1,687.68 |
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය (රු.මි.)** | 82,007.21 | **සමස්ථ භෞතික ප්‍රගතිය (%)** | 99.97% |
| **2024 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන** | වාරිමාර්ග අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ව්‍යාපෘතියේ ඉතිරි වැඩකටයුතු සිදු කරගෙන යාම සහ දෝෂ නිවැරදි කිරීමේ කටයුතු සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට හා ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය වෙත භාර දීම. | | |
| **2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි.)** | 2,514.00 | | |
| **2025 වර්ෂය සඳහා යෝජිත වැඩසටහන** | අවශේෂ ඉදිකිරීම් හා දෝෂ නිවැරදි කිරීම | | |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • 120 MW විදුලි ජනනය තුළින් වසරකට 230 GWhක විදුලි බලය ජාතික විදුලි බල පද්ධතියට එකතු කිරිම<br>• මොණරාගල දිස්ත්‍රික්කයේ පවතින ඉඩම් හෙක්ටයාර 1500ක් සහ නව ඉඩම් හෙක්ටයාර 4500ක් සඳහා වාරි ජලය සැපයීම<br>• බදුල්ල, මොණරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල පානීය ජල අවශ්‍යතාවය සඳහා ඝන මීටර මිලියන 39 MCM ජලය සැපයීම | | |

## 3. මොරගහකන්ද සහ කළු ගඟ ජලාශ ව්‍යාපෘතිය

| | | | |
|---|---|---|---|
| **ඇස්තමේන්තුගත මුදල (රු.මි.)** | 120,700.00 | **ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක** | මාතලේ, පොළොන්නරුව සහ අනුරාධපුරය |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | ශ්‍රී ලංකා ජනරජය,සංවර්ධනය සඳහා සෞදි අරමුදල, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල, අරාබි ආර්ථික සංවර්ධන සඳහා කුවේට් අරමුදල | **ජලාශ ධාරිතාව (ඝන මීටර මිලියන)/ වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)** | • මොරගහකන්ද - ඝන මීටර මිලියන 557.87<br>• කළුගඟ - ඝන මීටර මිලියන 248.00 |

| | | | |
|---|---|---|---|
| **ව්‍යාපෘති කාලය** | 2007 ජනවාරි - 2024 මාර්තු | **ප්‍රතිලාභීන්** | මාතලේ, පොළොන්නරුව සහ අනුරාධපුරය දිස්ත්‍රික්ක වල ජනතාව |
| **ප්‍රතිපාදන 2024 (රු.මි.)** | 1,372.00 | **2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය (රු.මි.)** | 793.57 |
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය (රු.මි.)** | 119,896.64 | **සමස්ථ භෞතික ප්‍රගතිය (%)** | 99.90 |
| **2024 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන** | • මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වන්දි ගෙවීම.<br>• නව සංවර්ධන ප්‍රදේශයේ වාරි ඉඩම් රජ මට්ටම් කිරීම<br>• මොරගහකන්ද නව සංවර්ධන ප්‍රදේශයේ නව පදිංචිකරුවන් සඳහා පානීය ජලය සහ ගෘහස්ථ ජලය සැපයීම. | | |
| **2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි.)** | 80.00 | | |
| **2025 වර්ෂය සඳහා යෝජිත වැඩසටහන** | • ව්‍යාපෘතියේ ඉදිකිරීම් අවසන්ව ව්‍යාපෘති කාර්යාලය වසා ඇත.<br>• ලග්ගල, ඇළහැර සහ නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආශ්‍රිතව ඉඩම් අත්පත් කර ගැනීම සහ නැවත පදිංචි කිරීමේ කටයුතු ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් සිදු කරනු ලබයි. | | |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • ඝන මීටර මිලියන 557ක ධාරිතාවයෙන් යුතු මොරගහකන්ද ජලාශය<br>• ඝන මීටර මිලියන 248ක ධාරිතාවයෙන් යුතු කළුගඟ ජලාශය<br>• **විදුලි උත්පාදනය -** වසරකට ගිගාවොට් පැය 114.5ක ජල විදුලි නිෂ්පාදනයක් සිදු කිරීමට අපේක්ෂිතය. එමගින් වාර්ෂිකව ඉන්ධන සඳහා පිරිවැය රු.මි. 1,545ක් ඉතිරිවේ.<br>• පොදු පරිහරණය සඳහා ගොඩනැගිලි 465<br>• කි.මි.276කින් යුත් මාර්ග පද්ධතිය<br>• කි.මි.330කින් යුත් ඇළ මාර්ග පද්ධතිය<br>• කුඩා වැව් 11ක් ස්ථාපිත කිරීම<br>• සුළු වැව් 20ක් ස්ථාපිත කිරීම<br>• **කෘෂිකාර්මික කටයුතු සඳහා හෙක්ටයාර 5,000ක අමතර බිම් ප්‍රමාණයක් එක්වීම.**<br>• **රට තුළ කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩිකිරීම.**<br>ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමත් සමඟ දැනට 100% සිට 154% පමණ වන වගාතීව්‍රතාව 181% දක්වා ඉහළ යනු ඇත. හෙක්ටයාරයකට වී අස්වැන්න වැඩි කිරීම ඇතුළු සෘජු ප්‍රතිලාභ මගින් වාර්ෂිකව ටොන් 123,000ක අතිරේක කෘෂිකාර්මික නිෂ්පාදනයක් ලබා දෙනු ඇත. එමගින් ලැබෙන වාර්ෂික ශුද්ධ කෘෂිකාර්මික ප්‍රතිලාභ රු.මි. 4,000ක් ලෙස ගණනය කර ඇත.<br>• මාතලේ, පොළොන්නරුව, අනුරාධපුර සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කවලට පානීය හා කාර්මික ජල පහසුකම් සැපයීම. | | |

| | |
|---|---|
| | • **මිරිදිය ධීවර කර්මාන්තය -** සාමාන්‍ය මත්ස්‍ය නිෂ්පාදන විභවය වසරකට ටොන් 4,700ක් පමණ වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇති අතර වාර්ෂික ශුද්ධ ප්‍රතිලාභය රු.මි. 940කි.<br>• **රැකියා අවස්ථා වැඩි කිරීම -** පුද්ගලයින් 650ක් සෘජුවම ව්‍යාපෘතියට බඳවා ගනු ලැබේ. මැණික් හා ස්වර්ණාභරණ, හෝටල් කළමනාකරණ හා ස්වයං රැකියා පුහුණු ආදිය පැවැත්වීමෙන්/ සංවිධානය කිරීමෙන් වැඩි තරුණ තරුණියන් පුහුණු කරනු ලැබේ.<br>• **පාරිසරික සංචාරක ව්‍යාපාරය වැඩිදියුණු කිරීම -** වස්ගමුව ජාතික වනෝද්‍යානය, මින්නේරිය ජාතික වනෝද්‍යානය සහ රිවර්ස්ටන් ආදිය සංවර්ධනය කිරීමෙන් පරිසර සංචාරක ව්‍යාපාරය වැඩි දියුණු කිරීම.<br>• **ගංවතුර පාලනය -** සෝමාවතිය සහ මනම්පිටිය ප්‍රදේශවල ඇති වූ ගංවතුර හානි පාලනය කිරීම |

## 4. දේශගුණික බලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන (CResMPA)

| | | | |
|---|---|---|---|
| ඇස්තමේන්තුගත මුදල (රු.මි.) | 26,970.00 | **ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක** | ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක |
| **මුල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | IBRD - ලෝක බැංකුව | **ජලාශ ධාරිතාව (ඝන මීටර මිලියන)/ වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)** | ඝන මීටර් මිලියන 56<br>හෙක්ටයාර 25,000<br>පවුල් 35,000 |
| **ව්‍යාපෘති කාලය** | අවුරුදු 6<br>(2021 - 2026) | **ප්‍රතිලාභීන්** | • මිලියන 3.5 ක ජනතාවක් - වැඩිදියුණු කළ කාලගුණ සහ ගංවතුර අනතුරු ඇඟවීම් වලින්<br>• පුද්ගලයින් 1,800,000ක් - කැලණි ගංගා ද්‍රෝණියේ ගංවතුර සහ දේශගුණයට ඔරොත්තු දීමේ හැකියාව සඳහා බහුකාර්ය ජල යටිතල පහසුකම්වලින්<br>• පවුල් 35,000ක් - ආහාර සුරක්ෂිතතාව තහවුරු වීම. |
| **ප්‍රතිපාදන 2024 (රු.මි.)** | 7,019.00 | **2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය (රු.මි.)** | 2,241.43 |
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය** | 2,918.86 | **සමස්ථ භෞතික ප්‍රගතිය (%)** | 41.60 |
| **2024 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන** | නිරීක්ෂණ ජාලය වැඩිදියුණු කිරීම සඳහා :<br>• කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (DOM): සපයා ඇති හයිඩ්‍රජන් ජනක යන්ත්‍ර, තියඩොලයිට්, PABX පද්ධති, IBL මෘදුකාංග, DOM සඳහා කාර්යාල ගෘහභාණ්ඩ, සහ ස්වයංක්‍රීය වැසි මාපක ලබා දීම. | | |

- වාරිමාර්ග දෙපාර්තමේන්තුව (ID): ජල විද්‍යාත්මක අධීක්ෂණ පද්ධතින් ඒකාබද්ධ කොට වෙබ් පාදක අධීක්ෂණ පද්ධතියක් ලෙස ඒකාබද්ධ කිරීම, රසායනාගාර සහ කාර්යාල පරිශ්‍ර ප්‍රතිසංස්කරණය කිරීමෙන් ජල විද්‍යාගාරය වැඩිදියුණු කිරීම, රසායනාගාර උපකරණ, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) උපකරණ, ARC GIS මෘදුකාංග, සහ LIDAR ඩ්‍රෝන යානා 3 ක් ලබා දීම, නව ජල විද්‍යාත්මක මධ්‍යස්ථාන 100ක් හඳුනා ගැනීම සඳහා උපදේශන සේවාව ප්‍රදානය කිරීම, ප්‍රාදේශීය ප්‍රධාන ජල විද්‍යාත්මක මධ්‍යස්ථාන 19 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම.
- ජල ශක්ති (Hydraulic) රසායනාගාරය වැඩිදියුණු කිරීම: ජල ශක්ති රසායනාගාරය සහ කාර්යාලය ප්‍රතිසංස්කරණය කිරීම, විදුලි පද්ධතිය සහ පාලක පැනලය ප්‍රතිස්ථාපනය කිරීම, රසායනාගාර උපකරණ සැපයීම සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම.
- ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය (NBRO): ස්වයංක්‍රීය වැසි මාපක 330ක් සැපයීම සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදී. හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය (EOC) ස්ථාපන කරන ලදී, මේ සඳහා ICT උපකරණ, ප්‍රදර්ශන පැනල් ලබා දෙන ලදී. රට තුළ වායුවල ගුණාත්මකභාවය පරික්ෂා කිරීමට තත්ත්ව සංවේදක ජාල 100ක් ස්ථාපිත කිරීමට අවශ්‍ය උපකරණ, කාර්යාලීය ගෘහ භාණ්ඩ, gINT, ZodST20, Arc GIS, MATLAB, SarProz, GMS ground water pro, Arc Hydro භූගත ජලය, අනාවැකි සහ පූර්ව අනතුරු ඇඟවීම සඳහා VR SIMLAB, Pix4d මෘදුකාංගය සපයන ලදී.
- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (DMC): 5 KV ජනක යන්ත්‍ර, ආපදා වලදී ගලවා ගැනීමේ නල, මෙගාෆෝන්, වාහන කළමණාකරනය සඳහා GPS වාහන ලුහුබැඳීමේ පද්ධතිය සැපයීම සහ ප්‍රධාන කාර්යාලය සහ දිස්ත්‍රික් කාර්යාල නවීකරණය සඳහා මාර්ග සිතියමක් සැකසීම සඳහා උපදේශන කොන්ත්‍රාත්තුවක් ලබා දී ඇත.

**ලවණතා බාධකය ඉදිකිරීම:**

අඹතලේ කැළණි ගඟ හරහා ස්ථිර ලවණතා බාධකයක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු බඳවා ගැනීමට අවශ්‍ය සැලසුම් සහ ටෙන්ඩර් ලියකියවිලි අවසන් කිරීම සඳහා CRIP යටතේ සංවර්ධනය කරන ලද මූලික සැලසුමක් සමාලෝචනය කර වැඩිදියුණු කිරීම සඳහා EGIS ඉංජිනේරු සමාගම උපදේශන සේවාව සඳහා බඳවා ගන්නා ලදී.

මෙම උපදේශන සේවාව විසින් දැනට සකස් කර ඇති සැලසුම සහ අදාළ ලියකියවිලි සමාලෝචනය කර, මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ ඉදිකිරීම් පිරිවැය-ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සඳහා පවතින සැලසුමට කරන ලද වෙනස්කම් ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කර ඇත. උපදේශක සේවාව බඳවා ගැනීම සඳහා භාවිතා කරන ලද මුල් TOR යටතේ ආවරණය නොවන අමතර වැඩ විෂය පථයක් සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කර ඇත.

අතිරේක වැඩ විෂය පථය පිළිබඳ යෝජනාව ලෝක බැංකුව වෙත ඉදිරිපත් කර

| | |
|---|---|
| | ඇත. ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්කරුවෙකු බඳවා ගැනීමට අදාළ ලිපි ගොනු, ප්‍රමාණ බිල්පත් සහ ටෙන්ඩර් ලියකියවිලි අවසන් කිරීම සඳහා වන අතිරේක කටයුතු සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලදී.<br>**වී ඔය ජලාශ සංවර්ධනය:**<br>පහළ කැලණි ද්‍රෝණියේ ගංවතුර පාලනය කිරීම සඳහා සහ වරාය නගරයට සහ කොළඹ අගනගරයට පානීය ජලය සැපයීම සඳහා අවශ්‍ය කටයුතු සලසමින් වැසි සමයේදී වැසි ජලය ගබඩා කිරීම සඳහා යටියන්තොට වී ඔය ජලාශය ඉදිකිරීම සඳහා සවිස්තරාත්මක සැලසුමක් සකස් කිරීමට ඉරානයේ Mahab Ghodds ආයතනයේ උපදේශන සේවාව ලබා ගන්නා ලදී.<br>උපදේශක සමාගම ආරම්භක වැඩමුළුවක් පවත්වා කෙටුම්පත් ආරම්භක වාර්තාවක් තාක්ෂණික සමාලෝචන කමිටුව (Technical Review Committee) වෙත ඉදිරිපත් කර ඇත. වී ඔය ජලාශය ඉදිකිරීම සඳහා තෝරාගත් ස්ථානයේ නායයෑමේ මුල් සලකුණු දක්නට ලැබෙන බැවින්, නායයෑම් සංවේදීතාව තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා නිර්දේශය ලබා දෙන ලදී. ඒ අනුව, සවිස්තරාත්මක සැලසුම තුළින් නායයෑම අවම කිරීම සඳහා යෝග්‍ය ව්‍යුහාත්මක විසඳුම හඳුනා ගැනීමට NBRO හරහා නායයෑම් සංවේදීතා අධ්‍යයනයක් කිරීමට ප්‍රදානය කර ඇත.<br>වී ඔය ජලාශය ඉදිකිරීම නිසා බලපෑමට ලක් වන ප්‍රජාවන් සඳහා දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් හරහා සියලුම පාර්ශ්වකරුවන් ආවරණය වන පරිදි ජාතික, දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ග්‍රාම නිලධාරී මට්ටම්වල දැනුවත් කිරීමේ වැඩසටහන් සහ උපදේශන රැස්වීම් මාලාවක් මෙම ව්‍යාපෘතිය විසින් පවත්වා ඇත. අවතැන් වූ පවුල් 203 ක් පමණ සඳහා නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම සඳහා පදනමක් සපයන පාරිසරික සහ සමාජ බලපෑම් තක්සේරුව (ESIA) අධ්‍යයනය සඳහා TOR සකස් කරන ලදී. මීට අමතරව, ඉදිකිරීම් හා සම්බන්ධ පාරිසරික බලපෑම් හඳුනා ගැනීම සඳහා පාරිසරික බලපෑම් තක්සේරුවක් (EIA) සකස් කිරීමට සැලසුම් කර ඇත. මෙම තක්සේරු කිරීම් සිදු කිරීම සඳහා උපදේශන සමාගම් දෙකක් බඳවා ගැනීම සඳහා TOR සකස් කර ඇත. |
| **2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 9,845.00 |
| **2025 වර්ෂය සඳහා යෝජිත වැඩසටහන** | • කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නවීකරණය කිරීම සඳහා මාර්ග සිතියමක් සකස් කිරීම.<br>• ඉහළ වායුගෝලයේ නිරීක්ෂණය සඳහා හයිඩ්‍රජන් ජනක යන්ත්‍ර 3ක් ස්ථාපනය කිරීම.<br>• කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වාස්තු විද්‍යාත්මක සැලසුම්, ප්‍රමාණ විස්තර බිල්පත (BOQ) සහ ටෙන්ඩර් ලේඛන සංවර්ධනය කිරීම සඳහා උපදේශක සමාගමක් බඳවා ගැනීම.<br>• උපදේශක විසින් සකස් කරන ලද ටෙන්ඩර් ලේඛන මත පදනම්ව අලුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම |

| | |
|---|---|
| | • ගංවතුර ආකෘති සංවර්ධනය කිරීම සඳහා ගංගා ද්‍රෝණි 22 ක් සඳහා ගං පතුළ සිතියම් ගත කිරීම (bathymetric) සහ LIDAR සමීක්ෂණය කිරීම සහ ඩිජිටල් භූමි ආකෘති (Digital Terrain Models) සැකසීම සඳහා උපදේශන සේවාවක් ලබා ගැනීම.<br>• ගංගා ද්‍රෝණි 20ක් සඳහා ගංවතුර ආකෘති (flood models) සංවර්ධනය සඳහා උපදේශන කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කිරීම.<br>• වාරිමාර්ග දෙපාර්තමේන්තු පරිශ්‍රයේ හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානයක් පිහිටුවීම.<br>• නව ජල විද්‍යා මධ්‍යස්ථාන 100ක් හඳුනා ගැනීම සඳහා උපදේශන සමාගමක් සමඟ ගිවිසුමක් අත්සන් කිරීම.<br>• ප්‍රධාන ජලාශ සඳහා තත් කාලීන ජල මට්ටම මැනීමේ පද්ධති සංවර්ධනය කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් බඳවා ගැනීම<br>• වාරිමාර්ග දෙපාර්තමේන්තුව සඳහා නව ස්වයංක්‍රීය වර්ෂාමාන 100ක් මිලදී ගෙන ස්ථාපනය කිරීම.<br>• නායයෑම් අවදානම් සහිත ප්‍රදේශ 14 ක කිලෝමීටර 900 ක් සඳහා LIDAR සමීක්ෂණය සංවර්ධනය කිරීම සඳහා උපදේශකයෙකු බඳවා ගැනීම.<br>• සැබෑ තත්‍ය කාලීන නායයෑම් බලපෑම අවම කළ හැකි පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා උපදේශන සමාගමක් බඳවා ගැනීම.<br>• නායයෑම් නිරීක්ෂණය කිරීම සඳහා ජංගම දත්ත රැස් කිරීමේ උපකරණ මිලදී ගැනීම.<br>• NBRO සඳහා ඩ්‍රෝන යානා 10ක් මිලදී ගැනීම<br>• ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය නවීකරණය කිරීම සඳහා මාර්ග සිතියමක් සකස් කිරීම සහ භාණ්ඩ, උපකරණ සහ සේවා ලබා ගැනීමෙන් මාර්ග සිතියම ක්‍රියාත්මක කිරීම.<br>• ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා PABX සහ මෙගාෆෝන් මිලදී ගැනීම.<br>• දිස්ත්‍රික්ක 25 ක දැනට ක්‍රියාත්මක සිවිල් වැඩ සඳහා වූ පැකේජ අවසන් කිරීම.<br>• අඹතලේ ලවණ බාධකය (salinity barrier) සහ වී ඔය සඳහා සම්පූර්ණ පාරිසරික බලපෑම් ඇගයීම සඳහා උපදේශකයෙකු බඳවා ගැනීම<br>• වී ඔය සඳහා සමාජ බලපෑම් ඇගයීම් අධ්‍යයනයක් කිරීමට සමාගමක් බඳවා ගැනීම |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • දිස්ත්‍රික්ක 25 ක ක්‍රියාත්මක කරන ලද පැකේජවලින් 373,723 දෙනෙකු ප්‍රතිලාභ ලබා ඇත.<br>• ගංවතුර හා නියඟ අවදානමෙන් කුඹුරු හෙක්ටයාර 14,385 ක් ආරක්ෂාවේ.<br>• ප්‍රධාන, මධ්‍යම හා සුළු වාරිමාර්ග යෝජනා ක්‍රමවල කිලෝමීටර 18.9 ක ඇළ මාර්ග වැඩිදියුණු කර ඇත.<br>• කැළණි ගංගා ද්‍රෝණියේ වාර්ෂික සාමාන්‍ය ගංවතුර හානිය අවම වීම. |

**ව්‍යාපෘති අරමුණු ප්‍රතිඅරමුණුකරණය (Repurposing) යටතේ ක්‍රියාත්මක ප්‍රධාන, මධ්‍යම හා සුළු වාරිමාර්ග ව්‍යාපාර වල හදිසි හා අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතුවල ප්‍රගතිය - 2024**

| අංක | දිස්ත්‍රික්කය | අනුමත ව්‍යාපෘති ගණන | 2024 ට අයත් ව්‍යාපෘති | සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණය (රු. මි.) | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|
| | | | | | භෞතික (%) | මූල්‍ය (රු. මි.) |
| 1 | අම්පාර | 62 | 54 | 433.01 | 73.30% | 103.28 |
| 2 | අනුරාධපුරය | 48 | 46 | 245.77 | 82.50% | 83.09 |
| 3 | බදුල්ල | 50 | 42 | 133.27 | 89.29% | 47.90 |
| 4 | මඩකලපුව | 26 | 25 | 276.21 | 89.60% | 157.65 |
| 5 | කොළඹ | 49 | 46 | 131.13 | 78.91% | 33.70 |
| 6 | මාතර | 69 | 53 | 209.73 | 73.68% | 93.08 |
| 7 | ගාල්ල | 59 | 38 | 187.35 | 94.74% | 79.77 |
| 8 | ගම්පහ | 61 | 38 | 74.90 | 57.11% | 19.25 |
| 9 | හම්බන්තොට | 49 | 49 | 302.79 | 95.31% | 159.43 |
| 10 | කළුතර | 43 | 24 | 51.97 | 50.21% | 17.47 |
| 11 | මහනුවර | 14 | 11 | 27.77 | 95.64% | 12.66 |
| 12 | කෑගල්ල | 31 | 25 | 36.55 | 80.60% | 16.89 |
| 13 | කුරුණෑගල | 47 | 36 | 133.84 | 87.83% | 47.73 |
| 14 | මන්නාරම | 60 | 43 | 167.16 | 76.93% | 45.15 |
| 15 | මාතලේ | 17 | 12 | 46.05 | 86.42% | 15.58 |
| 16 | මොණරාගල | 114 | 89 | 491.82 | 92.11% | 157.69 |
| 17 | නුවරඑළිය | 13 | 8 | 35.16 | 65.63% | 13.24 |
| 18 | පොළොන්නරුව | 143 | 139 | 761.04 | 88.10% | 314.05 |
| 19 | පුත්තලම | 32 | 21 | 153.40 | 71.67% | 49.03 |
| 20 | රත්නපුර | 334 | 172 | 407.96 | 36.63% | 44.17 |
| 21 | ත්‍රිකුණාමලය | 44 | 42 | 263.73 | 90.43% | 150.02 |
| 22 | වවුනියාව | 30 | 30 | 134.99 | 93.47% | 62.22 |
| 23 | කිලිනොච්චිය | 18 | 13 | 88.99 | 85.38% | 10.10 |
| 24 | මුලතිව් | 12 | 7 | 68.09 | 32.14% | 3.52 |
| 25 | යාපනය | 18 | 17 | 92.45 | 79.12% | 11.94 |
| **මුළු ගණන** | | **1443** | **1080** | **4,955.12** | **75.51%** | **1,748.60** |

## 5. ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)

| | | | |
|---|---|---|---|
| ඇස්තමේන්තුගත මුදල (රු.මි.) | 20,308.70 | ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක | සියලුම දිස්ත්‍රික්ක |
| මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය | ලෝක බැංකුව සහ ශ්‍රී ලංකා රජය | ජලාශ ධාරිතාව (ඝන මීටර මිලියන)/ වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) - 201,632 |
| ව්‍යාපෘති කාලය | 2021 මැයි - 2026 ඔක්තෝම්බර් | ප්‍රතිලාභීන් | 1,100,000 |
| ප්‍රතිපාදන 2024 (රු.මි.) | 4,397.00 | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | 3,011.05 |
| සමුච්චිත මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | 6,265.03 | සමස්ථ භෞතික ප්‍රගතිය (%) | 71.75% |
| 2024 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන | ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් වැඩ කටයුතු පහත පරිදිවේ<br>• වැඩ (ඇළ මාර්ග සහ වේලි ප්‍රතිසංස්කරණය)<br>• භාණ්ඩ (උදා - Dam inspection machine)<br>• උපදේශන සේවා<br>• උපදේශන සේවා නොවන (උදා - MIS කළමනාකරණ තොරතුරු පද්ධතිය)<br><br>*** වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ (ID) කොන්ත්‍රාත් වැඩ - ඇළ මාර්ග සහ වේලි ප්‍රතිසංස්කරණ කටයුතු සමස්ත වශයෙන් පැකේජ - 10**<br>පැකේජ 6ක් මේ වනවිටත් නිමකොට ඇති අතර, පැකේජ 4ක ඉදිකිරීම් කටයුතු මේ වන විට සිදුවෙමින් පවතී.<br><br>*** ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ (MASL) කොන්ත්‍රාත් වැඩ - ඇළ මාර්ග සහ වේලි ප්‍රතිසංස්කරණ කටයුතු සමස්ත වශයෙන් පැකේජ - 09**<br>පැකේජ 5ක් මේ වනවිටත් නිමකොට ඇති අතර, පැකේජ 4ක ඉදිකිරීම් කටයුතු මේ වන විට සිදුවෙමින් පවතී.<br><br>*** උතුරු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව (NPC) කොන්ත්‍රාත් වැඩ - ඇළ මාර්ග සහ වේලි ප්‍රතිසංස්කරණ කටයුතු සමස්ත වශයෙන් පැකේජ - 09**<br>පැකේජ 4ක් මේ වනවිටත් නිමකොට ඇති අතර, පැකේජ 3ක ඉදිකිරීම් කටයුතු මේ වන විට සිදුවෙමින් පවතී. පැකේජ 2ක වැඩ කටයුතු ප්‍රසම්පාදන තත්ත්වයේ පවතී.<br><br>*** නැගෙනහිර පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව (EPC) කොන්ත්‍රාත් වැඩ - ඇළ මාර්ග සහ වේලි ප්‍රතිසංස්කරණ කටයුතු සමස්ත වශයෙන් පැකේජ - 10**<br>පැකේජ 7ක වැඩ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.<br><br>*** ජල සම්පත් මණ්ඩලයේ (WRB) වැඩ කොන්ත්‍රාත් - භූගත ජල කළමනාකරණ ඒකක පුළුල් කිරීම සමස්ත වශයෙන් පැකේජ 02**<br>පැකේජ 1ක වැඩ කටයුතු ක්‍රියාත්මක තත්ත්වයේ පවතින අතර, එක් පැකේජයක් ප්‍රසම්පාදන තත්ත්වයේ පවතී. | | |

| | |
|---|---|
| | *** මිලියන 10ක වැඩ කටයුතු ප්‍රතිව්‍යුහගත කිරීම - කුඩා හා මධ්‍ය පරිමාණ වාරි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණ වැඩ කටයුතු (SMIIRW) යටතේ සමස්ත වශයෙන් පැකේජ 782**<br>පැකේජ 758ක වැඩ කටයුතු මේ වන විට නිමවා ඇති අතර, පැකේජ 24ක කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.<br><br>*** උපදේශන සේවා - සමස්ත වශයෙන් පැකේජ 20**<br>පැකේජ 9ක් මේ වනවිටත් නිමකොට ඇති අතර, පැකේජ 6ක ඉදිකිරීම් කටයුතු මේ වන විට සිදුවෙමින් පවතී. පැකේජ 5ක වැඩ කටයුතු ප්‍රසම්පාදන තත්ත්වයේ පවතී.<br><br>*** භාණ්ඩ කොන්ත්‍රාත්තු - සමස්ත වශයෙන් පැකේජ 15**<br>පැකේජ 5ක වැඩ කටයුතු මේ වනවිටත් නිමකොට ඇති අතර, එක් පැකේජයක් ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. පැකේජ 9ක් ප්‍රසම්පාදන තත්ත්වයේ පවතී.<br><br>*** උපදේශන සේවා නොවන - සමස්ත වශයෙන් පැකේජ 4**<br>පැකේජ 2ක් වැඩ නිමවා ඇති අතර, පැකේජ 2ක් ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. |
| **2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි.)** | 5,550.00 |
| **2025 වර්ෂය සඳහා යෝජිත වැඩසටහන** | ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් වැඩකටයුතු<br>• වැඩ<br>• භාණ්ඩ<br>• උපදේශන සේවා<br>• උපදේශන සේවා නොවන යටතේ පහත පරිදිවේ.<br><br>*** වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ (ID) කොන්ත්‍රාත් වැඩ - ඇළ මාර්ග සහ වේලි ප්‍රතිසංස්කරණ කටයුතු සමස්ත වශයෙන් පැකේජ - 18**<br>මූලික අදියරේ පැකේජ 14ක් පවතින අතර ඒවායෙහි ප්‍රගතිය 50% ලෙසද, වැඩ නිම කිරීමට ඇති පැකේජ 4හි 100% ක ප්‍රගතියක් ලබා ගැනීමටද ඉලක්ක කෙරේ.<br><br>*** ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ (MASL) කොන්ත්‍රාත් වැඩ - ඇළ මාර්ග සහ වේලි ප්‍රතිසංස්කරණ කටයුතු සමස්ත වශයෙන් පැකේජ - 14**<br>මූලික අදියරේ ඇති පැකේජ 10 හි ප්‍රගතිය 75% ලෙසද, වැඩ නිම කිරීමට ඇති පැකේජ 4හි 100% ක ප්‍රගතියක් ද ලබා ගැනීමටද ඉලක්ක කෙරේ.<br><br>*** උතුරු පළාත් සභාව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව (NPC) කොන්ත්‍රාත් වැඩ - ඇළ මාර්ග සහ වේලි ප්‍රතිසංස්කරණ කටයුතු සමස්ත වශයෙන් පැකේජ - 11**<br>මූලික අදියරේ ඇති පැකේජ 06 හි ප්‍රගතිය 75% ලෙසද, දැනට වැඩ කරගෙන යනු ලබන පැකේජ 3හි ප්‍රගතිය 100% ක් ලෙසද, ඉතිරි පැකේජ 2ක ප්‍රදානය කිරීමටද ඉලක්ක කෙරේ. |

| | |
|---|---|
| | *** නැගෙනහිර පළාත් සභාව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව (EPC) කොන්ත්‍රාත් වැඩ - ඇළ මාර්ග සහ වේලි ප්‍රතිසංස්කරණ කටයුතු සමස්ත වශයෙන් පැකේජ - 15**<br>මූලික අදියරේ ඇති පැකේජ 08 හි ප්‍රගතිය 70% ලෙසද, දැනට වැඩ කරගෙන යනු ලබන පැකේජ 05හි ප්‍රගතිය 100% ක් ලෙසද, ඉතිරි පැකේජ දෙක නැවත ටෙන්ඩර් කිරීමටද ඉලක්ක කෙරේ.<br><br>*** ජල සම්පත් මණ්ඩලයේ (WRB) වැඩ කොන්ත්‍රාත් - භූගත ජල කළමනාකරණ ඒකක පුළුල් කිරීම සමස්ත වශයෙන් පැකේජ 03**<br>මූලික අදියරේ ඇති පැකේජයෙහි 50% ප්‍රගතියක්ද, තවත් පැකේජයක් ප්‍රදානය කොට 50%ක ප්‍රගතියක්ද, තවත් එක් පැකේජයක් ප්‍රදානය කොට 100%ක ප්‍රගතියක්ද, දැනට වැඩ කරගෙන යන පැකේජයෙහි ප්‍රගතිය 100% ලෙසද ලබා ගැනීමට ඉලක්ක කෙරේ.<br><br>*** මිලියන 10ක වැඩ කටයුතු ප්‍රතිව්‍යුහගත කිරීම. කුඩා හා මධ්‍ය පරිමාණ වාරි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණ වැඩ කටයුතු (SMIIRW) යටතේ සමස්ත වශයෙන් පැකේජ 24**<br>පැකේජ 24 ක කටයුතු මේ යටතේ ඉලක්ක කෙරේ. එහිදී පැකේජ 18ක් ප්‍රසම්පාදන අදියරේ පවතින අතර ඒවායෙහි ප්‍රගතිය 100% ලෙසද, දැනට වැඩ කරගෙන යනු ලබන පැකේජ 6 නිමා කිරීමටද ඉලක්ක කෙරේ.<br><br>*** උපදේශන සේවා - සමස්ත වශයෙන් පැකේජ 20**<br>මූලික අදියරේ පවතින පැකේජ 09 හි ප්‍රගතිය 80% ලෙසද, පැකේජ 5ක් ප්‍රදානය කොට නිමා කිරීමටද, දැනට කරගෙන යනු ලබන පැකේජ 06 නිමා කිරීමටද ඉලක්ක කෙරේ.<br><br>*** භාණ්ඩ කොන්ත්‍රාත්තු - සමස්ත වශයෙන් පැකේජ 14**<br>මූලික අදියරේ පවතින පැකේජ 04 හි ප්‍රගතිය 80% ලෙසද, පැකේජ 9ක් ප්‍රදානය කිරීමෙන් 100% ප්‍රගතියක්ද, දැනට කරගෙන යනු ලබන පැකේජය නිම කිරීමටද ඉලක්ක කෙරේ.<br><br>*** උපදේශන සේවා නොවන - සමස්ත වශයෙන් පැකේජ 03**<br>පැකේජ 1ක් ප්‍රදානය කොට 75%ක ප්‍රගතියක්ද, තවත් පැකේජ 2ක් නිම කිරීමටද ඉලක්ක කෙරේ. |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • අවදානම් සහිත වේලි ප්‍රමාණය 18 සිට 8 තෙක් පහළ නැංවීම<br>• වාරි හෝ ජලාපවහන සේවා ලබා දීම තුළින් නවතම/ සංවර්ධිත ප්‍රදේශයන්හි භූමි වපසරිය හෙක්ටයාර් 110,827.86 දක්වා වර්ධනය කිරීම<br>• වාරි යටිතල පහසුකම් වල ප්‍රතිසංස්කරණ කටයුතු හේතුවෙන් සෘජුවම ප්‍රතිලාභ ලබන පුද්ගලයින් සංඛ්‍යාව 1,100,000 ක් ඉලක්ක කෙරේ.<br>• ප්‍රතිසංස්කරණය කරන ලද වේලි සංඛ්‍යාව 18 ක් ලෙස ඉලක්ක කෙරේ.<br>• ප්‍රතිසංස්කරණය කරන ලද ඇළ මාර්ග සංඛ්‍යාව 14 ක් ලෙස ඉලක්ක කෙරේ. |

**ව්‍යාපෘති අරමුණු ප්‍රතිඅරමුණුකරණය (Repurposing) යටතේ ක්‍රියාත්මක ප්‍රධාන, මධ්‍යම හා සුළු වාරිමාර්ග ව්‍යාපාර වල හදිසි හා අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතුවල ප්‍රගතිය - 2024**

| අංක | දිස්ත්‍රික්කය | අනුමත ව්‍යාපෘති ගණන | 2024 ට අයත් ව්‍යාපෘති | සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණය (රු. මි.) | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|
| | | | | | භෞතික (%) | මූල්‍ය (රු. මි.) |
| 1 | අම්පාර | 70 | 70 | 217.50 | 100% | 130.512 |
| 2 | අනුරාධපුරය | 51 | 51 | 145.00 | 100% | 116.533 |
| 3 | බදුල්ල | 28 | 28 | 107.11 | 100% | 64.717 |
| 4 | මඩකලපුව | 37 | 37 | 136.98 | 100% | 92.957 |
| 5 | කොළඹ | 13 | 13 | 40.31 | 100% | 7.143 |
| 6 | මාතර | 18 | 18 | 40.31 | 100% | 27.893 |
| 7 | ගාල්ල | 23 | 23 | 49.11 | 100% | 20.578 |
| 8 | ගම්පහ | 19 | 19 | 80.52 | 100% | 20.615 |
| 9 | හම්බන්තොට | 38 | 38 | 132.92 | 100% | 89.279 |
| 10 | කළුතර | 8 | 8 | 80.52 | 100% | 12.124 |
| 11 | මහනුවර | 9 | 9 | 40.31 | 100% | 30.086 |
| 12 | කෑගල්ල | 6 | 6 | 46.69 | 98% | 11.845 |
| 13 | කුරුණෑගල | 21 | 21 | 76.56 | 100% | 52.491 |
| 14 | මන්නාරම | 26 | 26 | 120.83 | 100% | 90.332 |
| 15 | මාතලේ | 30 | 30 | 80.62 | 100% | 64.913 |
| 16 | මොණරාගල | 79 | 79 | 283.52 | 95% | 130.717 |
| 17 | නුවරඑළිය | 17 | 17 | 80.52 | 100% | 52.567 |
| 18 | පොළොන්නරුව | 88 | 88 | 320.55 | 100% | 226.601 |
| 19 | පුත්තලම | 13 | 13 | 40.31 | 100% | 33.814 |
| 20 | රත්නපුර | 55 | 55 | 112.04 | 100% | 129.772 |
| 21 | ත්‍රිකුණාමලය | 48 | 48 | 231.13 | 100% | 163.021 |
| 22 | වවුනියාව | 31 | 31 | 145.00 | 100% | 116.096 |
| 23 | කිලිනොච්චිය | 17 | 17 | 80.52 | 100% | 38.126 |
| 24 | මුලතිව් | 8 | 8 | 40.31 | 100% | 33.565 |
| 25 | යාපනය | 29 | 29 | 170.81 | 100% | 79.439 |
| මුළු ගණන | | **782** | **782** | **2,900.00** | **99%** | **1835.74** |

## 6. ඒකාබද්ධ ජල කළමනාකරණ ප්‍රවේශයක් තුළින් ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ කුඩා ඉඩම් හිමි ගොවීන්ගේ දේශගුණික විපර්යාසවලට මුහුණදීමේ ශක්තිය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (වැව්ගම් පුබුදුව - CRIWMP)

| | | | |
|---|---|---|---|
| ඇස්තමේන්තුගත මුදල (රු.මි.) | 12,940.00<br>(ඇ. ඩො 1 = රු. 250)<br>ඇ.ඩො. මි. 52.08 | ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක | අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල, පුත්තලම, වවුනියාව, මන්නාරම, ත්‍රිකුණාමලය |
| මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය | හරිත දේශගුණ අරමුදල / ශ්‍රී ලංකා රජය - සම මූල්‍ය දායකත්වය | ජලාශ ධාරිතාව (ඝන මීටර මිලියන)/ වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | සුළු වාරි පද්ධති - 325<br>හෙක්ටයාර - 5,000 |
| ව්‍යාපෘති කාලය | අවුරුදු 07 (2017 ජූනි - 2024 ජූනි ) | ප්‍රතිලාභීන් | 1,950,374 |
| ප්‍රතිපාදන 2024 (රු.මි.) | 2,531.00 | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | රු.මි 2348.54 (වාරි මාර්ග අමාත්‍යාංශය)<br>රු.මි188.029 (එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන)<br>එකතුව රු.මි 2536.57 |
| සමුච්චිත මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | රු.මි 7575.50 (අමාත්‍යාංශය මඟින්)<br>රු.මි 3246.50 (එක්සත් ජාතීනේග් සංවර්ධන වැඩසටහන මඟින්) ඍජු වියදම්<br>රු.මි : 10,822.00 | සමස්ථ භෞතික ප්‍රගතිය (%) | 93 % |
| 2024 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන | වාරිමාර්ග පුනරුත්ථාපන සංරචකය යටතේ,<br>• 2024 දී, ග්‍රාමීය වාරිමාර්ග පද්ධති (VIS) 26ක උඩුගං සංවර්ධන කටයුතු ආරම්භ කෙරිණි.<br>• පෙර වසරේ සංවර්ධන කටයුතු ආරම්භ කළ වැව් 44ක් ද ඇතුළත්ව මෙම වසරේ උඩු ගං සංවර්ධනය නිම කළ වැව් 49කි.<br>• 2024 දී, ග්‍රාමීය වාරිමාර්ග පද්ධති (VIS) 43ක යටිගං සංවර්ධන කටයුතු ආරම්භ වූ අතර පෙර වසරේ සංවර්ධන කටයුතු ආරම්භ කළ වැව් ද ඇතුළත්ව මේ වසරේ යටිගං සංවර්ධනය නිම කළ වැව් 71කි.<br>• පාරිසරික අයිතිය සහ තිරසාර සංවර්ධනය ඇති කරනු වස් ග්‍රාමීය වාරිමාර්ග පද්ධති 316ක් සඳහා සංරක්ෂණ ප්‍රදේශ සඳහා මායිම් දක්වමින් නීත්‍යානුකූල වශයෙන් බලාත්මක සැලසුම් සකස් කරනු ලැබිණි. | | |

| | |
|---|---|
| | • ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම් දෘශ්‍යකරණයට සහාය වීම සඳහා පුළුල් භූගෝලීය දත්ත ගබඩාවක් නිර්මාණය කර ඇත. මෙය ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට සහ ප්‍රතිලාභීන් හඳුනා ගැනීමට GPS පිහිටීම භාවිතා කරයි.<br>**දේශගුණික සුහුරු කෘෂිකාර්මික සංරචකය යටතේ,**<br>• ග්‍රාමීය වාරිපද්ධති (VIS) 13 ක ජල කළමනාකරණ ආදර්ශන සාර්ථකව නිම කරන ලද අතර පහත ප්‍රධාන තාක්ෂණයන් ඇතුළත් වේ.<br>• ඒකාන්තර තෙත් හා වියළි ජල කලමණාකරණ ක්‍රමවේදය (AWD); ගොවීන් 644ක් සමඟ අඩුවන ජල මට්ටම සඳහා සංවේදී ආලෝක පද්ධති තාක්ෂණය ආදර්ශණය; ගොවීන් 326ක් සමඟ පැරෂුට් වී ගොවිතැන; ජේළි වැපිරීම, බිම් කොටස් ඒකාබද්ධ කිරීම (බිම් කැබලි 1,275 සිට 360 දක්වා අඩු කිරීම) අක්කර 185.9 (හෙක්ටයාර 75.3) ලේසර් මට්ටම් කිරීම.<br>• ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පමණක් කෘෂි තාක්ෂණ ගොවිපළ පිහිටුවීම සිදුකරමින් පවතී.<br>**පානීය ජල සංරචකය යටතේ 2024 වසර තුළ,**<br>• සෑම පාසලකටම වැසි ජලය රැස් කිරීමේ ටැංකි 2ක් බැගින් පාසල් 49ක් සඳහා වැසි ජලය රැස්කිරීමේ ටැංකි සවිකිරීම අවසන් කරනු ලැබිණි.<br>• විශාල පරිමාණ පෙරහන් පද්ධති 10 ක් ස්ථාපනය කරනු ලැබේ. 06ක් ස්ථාපනය අවසන් කර ඇත. සමස්ථය 80% ක භෞතික ප්‍රගතියක් සහිතව සිදු වේ.<br>• කුඩා පරිමාණ පෙරහන් පද්ධති 28ක් ස්ථාපනය කිරීම අවසන් කර ඇති අතර අතිරේක පද්ධති 20ක් ස්ථාපනය කිරීම දැනට සිදුවෙමින් පවතී, සමස්ථය 80% ක භෞතික ප්‍රගතියක් සහිතව සිදු වේ<br>• කාර්යක්ෂම ජල සංරක්ෂණ පිළිවෙත් ප්‍රවර්ධනය කරමින් පවුල් 84 කට සහ පාසල් 19 කට වැසි ජලය රැස් කිරීමේ ටැංකි නඩත්තු කිරීම පිළිබඳ පුහුණුව ලබා දෙන ලදී.<br>**ආපදා ප්‍රතිචාර සහ සූදානම සංරචකය යටතේ,**<br>• කෘෂිකාර්මික කන්න දෙක සඳහා දිස්ත්‍රික් කාලගුණ උපදේශන, දිස්ත්‍රික්කය තුළ දිස්ත්‍රික්කයට ගැළපෙන ලෙස සංවර්ධනය කරන ලදී.<br>• ගැඹුර මැනීමේ මිනුම් උපකරණ 53 ක් සහ ජල ප්‍රවාහ මාපක 132 ක් සවි කර ඇත.<br>• ව්‍යාපෘතිය මගින් ජල පාලකවරුන් 250 දෙනෙකු සාර්ථකව පුහුණු කර ඇත.<br>• දේශගුණයට ඔරොත්තු දෙන ජල සුරක්ෂිතතාව සහ ආරක්ෂක සැලසුම් පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීමේ (TOT) වැඩසටහනක් නිලධාරීන් 51 දෙනෙකු සඳහා පවත්වන ලදී.<br>• කෘෂි කාලගුණ විද්‍යා උපදේශන ගොවීන් 7,000 කට බෙදා හරින ලදී<br>• ගංවතුර කළමනාකරණය සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (SOPs) සකස් කිරීම ව්‍යාපෘතියේ කොටසක් ලෙස ආරම්භ කර ඇත. |
| **2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි.)** | විදේශ අරමුදල (හරිත දේශගුණ අරමුදල) - රු.මි 1041.50<br>ශ්‍රී ලංකා රජය - රු.මි 5.00<br>එකතුව - රු.මි 1046.50 |

| | |
|---|---|
| **2025 වර්ෂය සඳහා යෝජිත වැඩසටහන** | • පෙර වසරේ සංවර්ධන කටයුතු ආරම්භ කළ වැව් ද ඇතුළත්ව වැව් 27ක උඩු ගං සංවර්ධනය නිම කිරීම.<br>• දැනට ක්‍රියාත්මක වැව් පුනරුත්ථාපනයට අදාළව යටිගං සංවර්ධන කටයුතු<br>• ත්‍රිකුණාමලයේ කෘෂි තාක්ෂණ ගොවිපල සංවර්ධනය ඉතිරි කටයුතු නිමකිරීම.<br>• පාසල් වගා උද්‍යාන 7 ක්, වෙළඳපල ඉලක්ක කරගත් ගෙවතු 100 ක් සහ ආහාර සුරක්ෂිතතා ගෙවතු 1,300 ක් සංවර්ධනය කිරීම සඳහා කලින් ලබා දුන් කොන්ත්‍රාත්තු සඳහා රෝපණ ද්‍රව්‍ය බෙදා හැරීම.<br>• දිස්ත්‍රික්ක 7ක යාය වැඩසටහන ක්‍රියාත්මක කිරීම.<br>• කුඩා පෙරහන් පද්ධති සහිත පාසල්වල පෙරහන් නඩත්තුවට උපකාරවීමට වහල මත සූර්ය පද්ධති ස්ථාපනය කිරීම.<br>• කුඩා පෙරහන් පද්ධති 20ක් ස්ථාපනය කිරීම ක්‍රියාත්මක කිරීම.<br>• ගැඹුර මාපක 66 ක් සවි කිරීම.<br>• දැනටමත් ප්‍රදානය කර ඇති කොන්ත්‍රාත්තු හා සම්බන්ධ ආපදා ප්‍රතිචාර සූදානම පිළිබඳ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම දිගටම කරගෙන යාම.<br>• ගංගා ද්‍රෝණි තුනක ගංවතුර කළමනාකරණය සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (SOPs) සකස් කිරීම සම්පූර්ණ කිරීම. |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • ග්‍රාමීය වාරිමාර්ග පද්ධති 325 ක් වැඩි දියුණු කිරීම සහ දේශගුණික සුහුරු කෘෂිකාර්මික පිළිවෙත් මඟින් මෙම සුළු වාරි පද්ධති වල ඇති හෙක්ටයාර 9,750 ක වගා තීව්‍රතාවය 0.8 සිට 1.6 දක්වා වැඩි කර මෙම ප්‍රදේශයේ ජනතාවගේ දේශගුණික විපර්යාසයන්ට අනුහුරු වීමේ හැකියාව නඟා සිටුවීම .<br>• ප්‍රතිලාභීන් 520,000 කට කෘෂි දේශගුණික උපදේශණ ලබා දීම තුළින් දේශගුණික විපර්යාසයනට අනුහුරු වීමේ හැකියාව නඟා සිටුවීම.<br>• දේශගුණයට ඔරොත්තු දෙන, විමධ්‍යගත ජල කළමනාකරණ විසඳුම් වන ග්‍රාමීය ජල සම්පාදන ක්‍රම 07ක් පිහිටුවීම, වැඩි දියුණු කළ ජල පිරිපහදු පද්ධති (විශාල පරිමාණ 70ක් සහ කුඩා පරිමාණ 16ක් ) ස්ථාපනය සහ වැසි ජල රැස්කිරීමේ ටැංකි පද්ධති 4,000ක් ස්ථාපනය, පානීය ජල කලමණාකරණ සැලසුම් සකස් කිරීම හරහා අවදානමට ලක්විය හැකි ප්‍රජාවෙහි පුද්ගලයන් 122,715 කට වසර පුරා සුරක්ෂිත පානීය ජලය සැපයීම.<br>• ඵලදායි කාලගුණික තත්ත්ව අධීක්ෂණ පද්ධති ස්ථාපනය කිරීම, කෘෂි කාලගුණ උපදේශන, ජල කලමණාකරණ උපදේශණ බෙදා හැරීම, පූර්ව අනතුරු ඇඟවීම් පද්ධති ශක්තිමත් කිරීම සහ ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වැඩි දියුණු කිරීම මගින් ගංවතුර සහ නියඟයේ අවදානමට ලක්විය හැකි 450,000ක ප්‍රජාවන්ගේ ඒ සඳහා අනුවර්තනය වීමේ හැකියාව වැඩි දියුණු කිරීම. |

**7. නකල්ස් කඳුවැටියේ අවදානමට ලක්ව ඇති ගංගා ද්‍රෝණි, දිය ඇළි ආශ්‍රිත ප්‍රදේශ සහ පහළ ජල පෝෂක ප්‍රදේශයේ වාසය කරන ගොවීන් සහ වැවිලි ප්‍රජාවගේ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ ශක්තිය වැඩි දියුණු කිරීම (හරිත දේශගුණික අරමුදල)**

| | | | |
|---|---|---|---|
| ඇස්තමේන්තුගත මුදල (රු.මි.) | 14,692.50<br>(ඇ.ඩො. 1 = රු.300)<br>ඇ.ඩො. මි. = 48.975 | ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක | මාතලේ, මහනුවර, අනුරාධපුර, කුරුණෑගල, පුත්තලම |
| මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය | හරිත දේශගුණික අරමුදල සහ ශ්‍රී ලංකා රජය | ජලාශ ධාරිතාව (ඝන මීටර මිලියන)/ වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | කඳුකර ජල පෝෂක හෙක්ටයාර් 166,254<br>වී වගාකළ පහත්බිම් හෙක්ටයාර් 122,150 |
| ව්‍යාපෘති කාලය | අවුරුදු 6 (2023 ජනවාරි - 2029) | ප්‍රතිලාභීන් | ස්ත්‍රී - 138,003<br>පුරුෂ - 130,640 |
| ප්‍රතිපාදන 2024 (රු.මි.) | 1010.00 | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | 410.93 |
| සමුච්චිත මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | 437.39 | සමස්ථ භෞතික ප්‍රගතිය (%) | 6% |
| 2024 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන | • ඉවුරු ආරක්ෂා කිරීම සහ පාරවල් දෙපස ජලය බැසයන කාණු පද්ධති කළමනාකරණය - 1%<br>• ගම්බද වැව්, පොකුණු, සහ වාරි පද්ධති පුනරුත්ථාපනය හා ස්ථාපිත කිරීම - 2%<br>• වනාන්තරවල මොසෙයික් භූ දර්ශන ප්‍රති-ස්ථාපනය කිරීම - 1%<br>• ඉහළ ජල පෝෂක ප්‍රදේශවල මෙන්ම පහළ ජලාධාර ප්‍රදේශවල වාරි ජල සම්පාදිත වී වගාවේ අස්වනු ඉහළ නැංවීම - 2%<br>• කුඩා ඉඩම්හිමි නිෂ්පාදන තිරසරබව ශක්තිමත් කිරීම - 2%<br>• තිරසර වැවිලි ප්‍රතිස්ථාපනය හා අස්වනු වැඩි කිරීම - 8%<br>• විශේෂයෙන් කුඩා ඉඩම්හිමි හා යැපුම් ගොවීන්ගේ නිෂ්පාදන සඳහා දේශීය අගය දාම සිතියම්කරණය සහ හරිත වෙළඳපොළ ඇගැයීම - 1%<br>• උප ගංගා ද්‍රෝණි මට්ටමින් සමෝධානිත ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය හා සැලසුම්කරණ යාන්ත්‍රණය සම්පාදනය කිරීම - 40%<br>• ඉඩම් පරිහරණය සැලසුම් කිරීම, දේශගුණයට අනුවර්තනය වීම, වෙළඳපළ තොරතුරු සහ මැදිහත්වීමේ විකල්පයන්ගේ කාර්යසාධනය අධීක්ෂණය කිරීම සඳහා හවුල් තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීම - 3%<br>• අනුවර්තන විකල්ප සඳහා වන අනුවර්තනීය හා සහභාගිත්ව සම-සැලසුම්කරණ ක්‍රමවේද හා මෙවලම් පිළිබඳ පුහුණුව ලබා දීම - 5%<br>• සන්දර්භයට ගැලපෙන විකල්පයන් සහ තිරසර ඉඩම් කළමනාකරණය, තිරසර ආකාරයට කෘෂි අස්වනු ඉහළ නැංවීම සහ අගය දාම වැඩිදියුණු කිරීමේ විකල්ප ක්‍රියාත්මක කිරීම සඳහා සරල භාවිත මාර්ගෝපදේශ, අත්පොත් සහ මෙවලම් සම්පාදනය කිරීම සහ සකස් කිරීම - 5% | | |
| 2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි.) | 2808.48 | | |

| | |
|---|---|
| **2025 වර්ෂය සඳහා යෝජිත වැඩසටහන** | අඛණ්ඩව,<br>- ඉවුරු ආරක්ෂා කිරීම සහ පාරවල් දෙපස ජලය බැසයන කාණු පද්ධති කළමනාකරණය<br>- ගම්බද වැව්, පොකුණු, සහ වාරි පද්ධති පුනරුත්ථාපනය හා ස්ථාපිත කිරීම<br>- වනාන්තරවල මොසෙයික් භූ දර්ශන ප්‍රති-ස්ථාපනය කිරීම<br>- ඉහළ ජල පෝෂක ප්‍රදේශවල මෙන්ම පහළ ජලාධාර ප්‍රදේශවල වාරි ජල සම්පාදිත වී වගාවේ වගා තීව්‍රතාවය ඉහළ නැංවීම<br>- කුඩා ඉඩම්හිමි නිෂ්පාදන තිරසරබව ශක්තිමත් කිරීම<br>- තිරසර වැවිලි ප්‍රතිස්ථාපනය හා අස්වනු වැඩි කිරීම<br>- විශේෂයෙන් කුඩා ඉඩම්හිමි යැපුම් ගොවීන්ගේ නිෂ්පාදන සඳහා දේශීය අගය දාම සිතියම්කරණය සහ හරිත වෙළඳපොළ ඇගැයීම<br>- ඉහළ කඳුකර ප්‍රදේශවල කුඩා ඉඩම් හිමි ගොවීන්ට හරිත සංවර්ධන අවස්ථාවල විපුල ඵල නෙලාගැනීම පිණිස ව්‍යවසාය සහ ආයතනික සංවර්ධනය උදෙසා තාක්ෂණික සහයෝගය ලබා දීම<br>- දේශගුණික සුහුරු කෘෂිකර්මාන්තයේ නියැලි කුඩා ඉඩම්හිමි යැපුම් ගොවීන් සඳහා අගය දාම ඉහළ නැංවීමේ (Upgrading) විකල්ප හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම<br>- කාර්යසාධනය පාදක මුදල් හුවමාරු යාන්ත්‍රණ පිළිබඳව සම්මුතියකට එළඹීම සඳහා ව්‍යාපාරික සිද්ධි කලඹක් සංවර්ධනය කිරීම<br>- බහු පාර්ශ්වකාර වේදිකාවේ අංගයක් ලෙස පරිසර පද්ධති සේවා ගෙවීම් සඳහා වන අතරමැදි ආයතනයක් සහ එහි පාලන පද්ධතිය ස්ථාපිත කිරීම<br>- ඉහළ ජලාධාර ප්‍රදේශයේ පරිසර පද්ධති සේවා ගෙවීම් සඳහා වන යෝජනාක්‍රම අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම<br>- උප ගංගා ද්‍රෝණි මට්ටමින් සමෝධානිත ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය හා සැලසුම්කරණ යාන්ත්‍රණය සම්පාදනය කිරීම<br>- ඉඩම් පරිහරණ සැලසුම්කරණය, දේශගුණික අනුවර්තනය, වෙළඳපොල තොරතුරු හා මැදිහත්වීමේ විකල්පවල කාර්යසාධනයට සහායවීමට හවුල් (+) තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීම<br>- තිරසර ඉඩම් කළමනාකරණය, තිරසර ආකාරයට කෘෂි අස්වනු ඉහළ නැංවීම සඳහා වන සන්දර්භයට ගැලපෙන විකල්ප රාමුව සම්පාදනය කිරීම සහ ප්‍රතිශෝධනය කිරීම<br>- උප ගංගා ද්‍රෝණි මට්ටමේ සිට ග්‍රාම නිලධාරී මට්ටම දක්වා වූ ඉහළ සිට පහළ ස්ථර දක්වා විහිදුණු බහු-පාර්ශ්වකාර නවෝත්පාදන වේදිකා ස්ථාපිත කිරීම<br>- අනුවර්තන විකල්ප සඳහා වන අනුවර්තනීය හා සහභාගිත්ව සම-සැලසුම්කරණ ක්‍රමවේද හා මෙවලම් පිළිබඳ පුහුණුව ලබා දීම<br>- සන්දර්භයට ගැලපෙන විකල්පයන් සහ තිරසර ඉඩම් කළමනාකරණය, තිරසර ආකාරයට කෘෂි අස්වනු ඉහළ නැංවීම සහ අගය දාම වැඩිදියුණු කිරීමේ විකල්ප ක්‍රියාත්මක කිරීම සඳහා සරල භාවිත මාර්ගෝපදේශ, අත්පොත් සහ මෙවලම් සම්පාදනය කිරීම. |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • මිලියන 1.3 ක ජනතාවක් (51.4% කාන්තාවන්) සඳහා විවිධාංගීකරණය වූ, දේශගුණයට ඔරොත්තු දෙන විකල්ප ජීවනෝපාය මාර්ග හඳුන්වා දීම මගින් ඔවුන් හට දේශගුණික විපර්යයාස වලට අනුහුරු වීමේ හැකියාව වැඩි දියුණු කිරීම.<br>• හෙක්ටයාර 346,000ක් වන කෘෂි පාරිසරික පද්ධති සහ ස්වභාවික පරිසර පද්ධති (උස් බිම් / පහත් බිම් ද ඇතුළුව) දේශගුණික විචල්‍යතා සහ වෙනස්වීම් වලට ප්‍රතිචාර දැක්වීම සඳහා ආරක්ෂා කර ශක්තිමත් කිරීම. |

# වාරිමාර්ග දෙපාර්තමේන්තුව

## දැක්ම



“අහසින් වැටෙන එක දිය බිඳුවකුදු ලෝකෝපකාරයෙන් තොරව මුහුදට ගලා යා නොදෙනු” යන මහා පරාක්‍රමබාහු රජතුමාගේ පාඨය ගුරුතැන්හිලා, පරිසරයද සුරකිමින්, තිරසාර ආර්ථික හා සමාජ සංවර්ධනය සහතික කරනු සඳහා සෑම වැසි ජල බිඳුවක්ම පරිසර හිතකාමී ලෙස තිරසාර අයුරින් මිනිසාගේ යහපත සඳහා යොදා ගැනීමයි.

## මෙහෙවර



කෘෂිකර්මයට සෘජුවමත්, පාරිසරික, ගෘහස්ත, කාර්මික හා විදුලිජනක අවශ්‍යතා සඳහා වක්‍රවත් අවශ්‍ය ජලය සැපයීම සඳහා සමාන්තර ආයතන සමඟ සහයෝගයෙන් රටේ සම්පත් භාවිතයට ගැනීම, සංවර්ධනය, සංරක්ෂණය, පාලනය, බෙදාහැරීම හා කළමනාකරණය මඟින් එම සම්පත් වලින් රටට උපරිම ප්‍රතිලාභයක් ලබාදීම.

# අරමුණු



i. වාරි කෘෂිකර්මය, ජල විදුලි නිෂ්පාදනය, ගංවතුර ආරක්ෂණය, ගෘහස්ත ප්‍රයෝජනය, කාර්මික ප්‍රයෝජනය, ජල ජීවී වගාව ආදිය සඳහා පරිසරයට හිතකාමී ලෙස ජල සම්පත් සහ ඉඩම් සංවර්ධනය.

ii. වාරි හා ජල අපවහන ව්‍යාපෘතිවල ඇති වගා කළ හැකි ඉඩම් සඳහා උස්සාන වාරිමාර්ග පහසුකම් සැපයීම, ජල අපවහන පද්ධතීන් සැපයීම හා මුහුදු ජලය ගලා ඒම වැළැක්වීම.

iii. පානීය ජලය සැපයීම, ගංවතුර අවදානම ඇති ඉඩම්වලට ගංවතුර ආරක්ෂණ හා ජල අපවහන පද්ධතීන් සැපයීම.

iv. ග්‍රාමීය ජනයාගේ ගොවි ආදායම් වැඩි කිරීම තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සහ ග්‍රාමීය ප්‍රදේශවල දිළිඳුකම තුරන් කිරීම.

v. තිරසාර කෘෂිකර්මාන්තය සහ වෙනත් භාවිතයන් සඳහා ජලය ආර්ථික වශයෙන් කළමනාකරණය කිරීම.

vi. විශාල, මධ්‍යම ප්‍රමාණයේ සහ අන්තර් පළාත් සුළු වාරිමාර්ග ව්‍යාපෘතීන් සඳහා ජලය සහ ඉඩම් සඳහා වූ ඵලදායීතා වර්ධනය.

vii. විශාල, මධ්‍යම ප්‍රමාණයේ සහ අන්තර් පළාත් සුළු හා ක්ෂුද්‍ර වාරි පද්ධති සඳහා ඒකාබද්ධ ජලසම්පත් කළමනාකරණය සහ සහභාගීත්ව කළමනාකරණය.

viii. වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පවරා ඇති ගංගා ද්‍රෝණිවල ඒකාබද්ධ ජලසම්පත් කළමනාකරණය සහ සහභාගීත්ව කළමනාකරණය.



# ප්‍රධාන කාර්යයන්

i. පාරිසරික සාධක වලට ප්‍රමුඛතාවය දී ඉඩම් හා ජල සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම සඳහා ගංගා ද්‍රෝණි සංවර්ධනය සම්බන්ධයෙන් ප්‍රධාන සැලසුම් සකස් කිරීම.

ii. වාරිමාර්ග, ජල විදුලිය, ගංවතුර පාලනය සඳහා නව ව්‍යාපෘති සඳහා සවිස්තර සැලසුම් සකස් කිරීම.

iii. නව හා පවතින ගොවිතැන් කළ හැකි ඉඩම් වල අස්වැන්න වැඩි කිරීම සඳහා ගුරුත්ව හා උස්සාන වාරිමාර්ග ක්‍රම යටතේ ජල සංරක්ෂණය, හැරවීම හා බෙදා හැරීම සිදු කිරීම සඳහා නව ව්‍යාපෘති ඉදිකිරීම සහ ගොවීන් පදිංචි කිරීමේ ව්‍යාපෘති සැකසීම

iv. ජලාපවහන, ගංවතුර පාලන සහ ලවණ දිය බැහැර කිරීම සඳහා ව්‍යාපෘති ඉදි කිරීම මඟින් එම බලපෑම් ඇති ඉඩම් වල ගොවිතැන් කිරීමේ කටයුතු කරගෙන යාමට ඉඩ සැලසීම.

v. ගංවතුරෙන් සිදුවන හානිය අවම කිරීම හෝ අවම කිරීම සඳහා ජලාපවහන හා ගංවතුර ආරක්ෂණ පහසුකම් සැපයීම.

vi. මධ්‍යම හා ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම, ජලාපවහන හා ගංවතුර ආරක්ෂණ යෝජනා ක්‍රම, ලවණ ජලය බැහැර කිරීමේ යෝජනා ක්‍රම, මෙහෙයුම්, නඩත්තු, වැඩිදියුණු කිරීම්, පුනරුත්ථාපන හා ජල කළමනාකරණය සහ ප්‍රශස්ත ඵලදායිතාව සඳහා ප්‍රතිලාභීන්ගේ සහභාගීත්වය ලබා ගැනීම. අන්තර් අංශ භාවිතය, ගෘහස්ථ, කාර්මික භාවිතය සහ පාරිසරික අවශතා සඳහා ජලය සැපයීම.

vii. කෘෂිකාර්මික හා ගෘහස්ත පරිභෝජනයේ තිරසාර ජල සැපයුම සඳහා වේලි ඇතුළු ජල යටිතල පහසුකම් නඩත්තු කිරීම හා වැඩිදියුණු කිරීම.

viii. ජල සම්පත් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති සඳහා අවශ්‍ය කරන පර්යේෂණ, ජල ශක්ති, ජල විද්‍යා, ඉංජිනේරු ද්‍රව්‍ය, ඉංජිනේරු භූ විද්‍යා, භූ විද්‍යාත්මක තොරතුරු, ඉඩම් පරිහරණ යන අංශ වල සිදු කිරීම.

ix. මානව සම්පත් උපරිම ලෙස භාවිතා කිරීම සඳහා මානව සම්පත් සංවර්ධනය.

x. රජයේ මූල්‍ය රෙගුලාසි වලට අනුකූලව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ විගණන පද්ධතිය, ගිණුම් වාර්තා කිරීම, මූල්‍ය කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම.

xi. ජල සම්පත් වැඩි දියුණු කිරීම, භූ විද්‍යා අධ්‍යයනයන් සිදුකිරීම, පස් වැඩ වල සහ කොන්ක්‍රීට් වැඩ වල ගුණාත්මකභාවය පාලනය, ජල ශක්ති ආකෘති පරීක්ෂාවට ලක් කිරීම, ඉඩම් පරිහරණ සැලසුම් සෑදීම සම්බන්ධව රාජ්‍ය දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සංස්ථා පොදු හා පෞද්ගලික ආයතන සඳහා උපදෙස් ලබාදීම.

xii. මහාමාර්ග, කුඩා ජල විදුලිය, කාර්මික හා ඉඩම් පිරවීම, හෝටල්, නිවාඩු නිකේතන සහ පානීය ජල ව්‍යාපෘති යනාදී අනෙකුත් රජයේ ආයතන සහ පෞද්ගලික අංශය විසින් මෙහෙයවනු ලබන ව්‍යාපෘති සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අවසරය නිකුත් කිරීම.

# වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති

## 01 යාන් ඔය ව්‍යාපෘතිය

| | | | |
|---|---|---|---|
| ඇස්තමේන්තුගත මුදල | රු.මි. 48,355.30 | ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක | අනුරාධපුරය සහ ත්‍රිකුණාමලය |
| මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය | ශ්‍රී ලංකා ජනරජය | ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය | ඝන මීටර මිලියන 169<br>නව ප්‍රදේශය හෙක්ටයාර 1,515<br>ඇතුළුව හෙක්ටයාර 8,700 |
| ව්‍යාපෘති කාලය | 2012 – 2024* | ප්‍රතිලාභීන් | පවුල් 9,000ක් |
| 2024 සඳහා ප්‍රතිපාදන | රු.මි. 6,000.00 | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය | රු.මි. 2,573.03 |
| සමුච්චිත මූල්‍ය ප්‍රගතිය | රු.මි. 41,956.83 | සමස්ථ භෞතික ප්‍රගතිය (%) | 95.42 |
| 2024 තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන | • ඉස්සන්වැව නව වාරි ඉඩම් සංවර්ධනය කිරීම.<br>• ජයන්තිවැව පහළ නිම්න සංවර්ධනය කිරීම.<br>• දකුණු ඉවුර ඇළ යටතේ ජලය සපයනු ලබන ඇළ පද්ධතිය වැඩි දියුණු කිරීම.<br>• පුල්මුඩේ අමුණ සහ ඒ යටතේ ජලය සපයන ඇළ පද්ධතිය වැඩිදියුණු කිරීම.<br>• ජලාශය සහ වම් ඉවුරු ප්‍රධාන ඇල ඉදිකිරීම සඳහා අත්පත් කර ගත් ඉඩම් සඳහා වන්දි ගෙවීම.<br>• විකල්ප කුඹුරු ඉඩම් සඳහා වන්දි ලබා දීම.<br>• වාහල්කඩ කපුගොල්ලෑව මාර්ගය ඉදි කිරීම.<br>• ඉඳුල්හිටියව කුඹුරු ඉඩම් සංවර්ධනය කිරීම | | |
| 2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන | රු.මි. 2,500.00 | | |
| 2025 සඳහා යෝජිත වැඩසටහන් | • ඉස්සන්වැව නව වාරි ඉඩම් සංවර්ධනය අවසන් කිරීම .<br>• ජයන්තිවැව පහළ නිම්න සංවර්ධනය, දකුණු ඉවුර ඇළ යටතේ ජලය සපයනු ලබන ඇළ පද්ධතිය සංවර්ධනය, පුල්මුඩේ අමුණ සහ ඒ යටතේ ජලය සපයන ඇළ පද්ධතිය වැඩිදියුණු කිරීම අවසන් කිරීම.<br>• ජලාශය සහ වම් ඉවුරු ප්‍රධාන ඇල ඉදිකිරීම සඳහා අත්පත් කර ගත් ඉඩම් සඳහා වන්දි ගෙවීම.<br>• විකල්ප කුඹුරු ඉඩම් ලබා දීම අවසන් කිරීම. .<br>• වාහල්කඩ කපුගොල්ලෑව මාර්ගය ඉදි කිරීම අවසන් කිරීම<br>• යාන් ඔය වාන් ඇළ හරහා ඉදි කිරීමට නියමිත පාලම නිම කිරීම.<br>• ඉඳුල්හිටියාව නව වාරි ඉඩම් සංවර්ධනය අවසන් කිරීම .<br>• විදුලි වැටවල් ඉදිකිරීම අවසන් කිරීම. | | |
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ | • නව ඉඩම් හෙක්ටයාර 1,515 ක් ඇතුළුව වාරි ජල පහසුකම් හෙක්ටයාර 8,700කට සපයා දීම.<br>• අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවුල් 50,000කට සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පවුල් 20,000කට පානීය ජලය සැපයීම.<br>• කිලෝමීටර් 8ක කාපට් මාර්ගය සහ කිලෝමීටර 40ක බොරළු මාර්ග සංවර්ධනය කිරීම.<br>• ජලය, විදුලිය, පාසල්, පොදු ගොඩනැගිලි ආදිය සැපයීම ඇතුළුව මල්පෝරුව, | | |

| | |
|---|---|
| | කජුවත්ත, උරුව, ඕමාරකඩ සහ D6 වාහල්කඩ නැවත පදිංචි කිරීමේ ගම්මාන සංවර්ධනය කිරීම.<br>• කිලෝමීටර 16 ක දිගින් යුතු අලි වැට ඉදිකිරීම<br>• ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පදවිය මහා වාරි යෝජනා ක්‍රමය, යාන්ඔය අමුණ යෝජනා ක්‍රමය සහ කුඩා/මධ්‍යම පරිමාණ වැව්වල ජල හිඟය විසඳීම.<br>• මිරිදිය ධීවර හා පශු සම්පත් කර්මාන්තය සඳහා පහසුකම් සැලසීම.<br>• වාහල්කඩ සහ ත්‍රිකුණාමලය අතර ප්‍රවාහන දුර කිලෝමීටර 60කින් පමණ අවම කිරීම. |

*කාලය දීර්ඝ කිරීමට ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

## 02 මොරාණ ජලාශය

| | | | |
|---|---|---|---|
| **ඇස්තමේන්තුගත මුදල** | රු.මි. 2,900.00 | **ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක** | බදුල්ල |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | ශ්‍රී ලංකා ජනරජය | **ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය** | ඝන මීටර මිලියන 16<br>හෙක්ටයාර 570 |
| **ව්‍යාපෘති කාලය** | 2012 - 2024 | **ප්‍රතිලාභීන්** | පවුල් 1,300 |
| **2024 සඳහා ප්‍රතිපාදන** | රු.මි. 170.00 | **2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 48.08 |
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 2,773.95 | **සමස්ථ භෞතික ප්‍රගතිය (%)** | 99.64 |
| **2024 තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන** | • ඉඩම් අත්පත් කර ගැනීම සහ ජලාශය සහ ඇළ සඳහා අත්පත් කරගත් දේපල සඳහා වන්දි ගෙවීම. | | |
| **2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන** | - | | |
| **2025 සඳහා යෝජිත වැඩසටහන්** | • ඉඩම් බෙදා හැරීම සහ නැවත පදිංචි කිරීම | | |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • ඉඩම් හෙක්ටයාර 570කට සහ පවුල් 1300කට වාරි ජලය සැපයීම.<br>• පවුල් 500කට පානීය ජලය සැපයීම.<br>• කිලෝමීටර් 25ක මාර්ගයක් ඉදිකිරීම.<br>• මීමැසි පාලනය හා මිරිදිය ධීවර කර්මාන්තය සම්බන්ධ වැඩසටහන් පැවැත්වීම.<br>• ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රජා ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීමක් ලෙස ප්‍රජා ශාලා දෙකක් ඉදිකිරීම, තැපැල් කාර්යාල ඉදිකිරීම, යාල්වෙල සහ කුඩාලුණු විද්‍යාල වලට ප්‍රවේශ මාර්ග වැඩිදියුණු කිරීම.<br>• නැවත වන වගා වැඩසටහන. | | |

## 03 ඇල්ල වැව ජලාශ ව්‍යාපෘතිය

| | | | |
|---|---|---|---|
| ඇස්තමේන්තුගත මුදල | රු.මි. 2,950.00 | ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක | රත්නපුර |
| මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය | ශ්‍රී ලංකා ජනරජය | ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය | ඝන මීටර මිලියන 1.91<br>දැනට පවතින ඉඩම් හෙක්ටයාර 456 සහ නව ඉඩම් හෙක්ටයාර 141.6 |
| ව්‍යාපෘති කාලය | 2021 - 2026 | ප්‍රතිලාභීන් | පවුල් 4,000 |
| 2024 සඳහා ප්‍රතිපාදන | රු.මි. 500.00 | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය | රු.මි. 173.17 |
| සමුච්චිත මූල්‍ය ප්‍රගතිය | රු.මි. 474.72 | සමස්ථ භෞතික ප්‍රගතිය (%) | 35.57 |
| 2024 තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන | • ප්‍රධාන බැම්මේ ඉදිකිරීම් 22%ක් අවසන් කර ඇත.<br>• සොරොච්චේ වැඩ කටයුතු 60% කින් අවසන් කිරීම.<br>• සැඳලි වේල්ලෙහි ඉදිකිරීම් 22%ක් අවසන් කර ඇත. | | |
| 2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන | රු.මි. 1,000.00 | | |
| 2025 සඳහා යෝජිත වැඩසටහන් | • ප්‍රධාන වේල්ල ඉදිකිරීම<br>• සොරොච්ච සහ පහළ පිටවාන ඉදිකිරීම<br>• වේල්ල අංක 02 ඉදිකිරීම<br>• වේල්ල අංක 03 ඉදිකිරීම<br>• වාන් නිර්මිතය ඉදිකිරීම<br>• නැවත පදිංචි කිරීම, වන්දි ගෙවීම සහ යටිතල පහසුකම් සැපයීම<br>• පහළ නිම්න සංවර්ධන කටයුතු සිදුකිරීම | | |
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ | • කෘෂිකාර්මික හා ගෘහාශ්‍රිත කටයුතු සඳහා ජලය සැපයීමෙන් ප්‍රදේශයේ වෙසෙන ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.<br>• වියළි කාලවලදී වාරි කෘෂිකර්මාන්තය සඳහා ජල සුරක්ෂිතතාව සහතික කිරීම.<br>• හුලන්දා ඔය සහ පනාමුර ව්‍යාපාර වල වගා තිව්‍රතාවය වැඩි කිරීම සහ නව ඉඩම් අක්කර 350කට වාරි ජල පහසුකම් ලබා දීම.<br>• කොලොන්න ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා පානීය ජල ඉල්ලුම දිනකට ඝන මීටර 7,000ක් සැපයීම.<br>• මිරිදිය ධීවර කර්මාන්තයට සහ පාරිසරික අවශ්‍යතාවලට දායකත්වය සැපයීම. | | |

## 04 මුන්දෙණි ආරු ගංගා ද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය (රුගම් කිතුල් ජලාශය)

| | | | |
|---|---|---|---|
| ඇස්තමේන්තුගත මුදල | රු.මි. 24,140.60 | ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක | අම්පාර, මඩකලපුව |
| මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය | ශ්‍රී ලංකා ජනරජය සහ විදේශ ණය | ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය | රුගම් කිතුල් -ඝන මීටර මිලියන 58<br>මහා ඔය- ඝන මීටර මිලියන 80<br>හෙක්ටයාර 6,500 |

| | | | |
|---|---|---|---|
| ව්‍යාපෘති කාලය | අවුරුදු 06<br>(2021 - 2027) | ප්‍රතිලාභීන් | පවුල් 50,000 |
| 2024 සඳහා ප්‍රතිපාදන | GoSL - රු.මි. 110.00 | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය | රු.මි. 21.39 |
| සමුච්චිත මූල්‍ය ප්‍රගතිය | රු.මි. 383.61 | සමස්ථ භෞතික ප්‍රගතිය (%) | 2.32 |
| 2024 තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන | ඉඩම් අත්පත් කර ගැනීමේ මූලික කටයුතු සිදු කිරීම | | |
| 2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන | රු.මි. 150.00 | | |
| 2025 සඳහා යෝජිත වැඩසටහන් | • ඉඩම් අත්පත් කර ගැනීම සහ නැවත පදිංචි කිරීමේ කටයුතු<br>• පූර්ව සැලසුම් වැඩ<br>• මිනින්දෝරු දෙපාර්තමේන්තු වැඩ (ඉඩම් අත්පත් කර ගැනීමේ අවසන් ඇදීම)<br>• නැවත පදිංචි කිරීමේ ප්‍රදේශයේ මූලික ප්‍රවේශ කටයුතු ක්‍රියාත්මක කිරීම. | | |
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ | • පවුල් 10,000කට අයත් වගා කළ හැකි සහ වගා කටයුතු සිදු කරන ඉඩම් හෙක්ටයාර 6,500ක් සඳහා වාරි පහසුකම් සපයා දීම.<br>• මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කයේ පවුල් 31,000කට පානීය ජලය සැපයීම.<br>• පහළ නිම්නයේ ගංවතුර පාලනය කිරීම.<br>• ජලාශ දෙකෙහිම මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය වසරකට මෙට්‍රික් ටොන් 800කින් වැඩි කිරීම.<br>• කිලෝමීටර් 85ක මාර්ග ජාලයක් ඉදිකිරීම.<br>• නගර සංවර්ධනය කිරීම.<br>• අලි වැට ඉදිකිරීම.<br>• නැවත වන වගා වැඩසටහන.<br>• ආදායම් උත්පාදනය කිරීමේ වැඩසටහන් සහ පුහුණුව (කෘෂිකාර්මික හා පශු සම්පත් ව්‍යාපෘතිය). | | |

## 05 කැළණි ගඟ ආරක්ෂණ බැම් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය

| | | | |
|---|---|---|---|
| ඇස්තමේන්තුගත මුදල | රු.මි. 1,000.00 | ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක | කොළඹ, ගම්පහ |
| මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය | ශ්‍රී ලංකා ජනරජය | ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය | - |
| ව්‍යාපෘති කාලය | 2018 - 2024 | ප්‍රතිලාභීන් | පවුල් 15,000 |
| 2024 සඳහා ප්‍රතිපාදන | රු.මි. 670.00 | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය | රු.මි. 139.57 |
| සමුච්චිත මූල්‍ය ප්‍රගතිය | රු.මි. 601.10 | සමස්ථ භෞතික ප්‍රගතිය (%) | 56.1 |
| 2024 තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන | • කැළණි ගඟ ඉවුරු ආරක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම<br>• ගංවතුර ආරක්ෂණ නිර්මිත වැඩි දියුණු කිරීම. | | |

| | |
|---|---|
| **2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන** | - |
| **2025 සඳහා යෝජිත වැඩසටහන්** | - |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • කැළණි ගඟ ආශ්‍රිතව පවුල් 15,000කගේ පමණ ජීවිත හා ඔවුන්ගේ දේපළ, කර්මාන්ත, මාර්ග හා යටිතල පහසුකම් ගංවතුරෙන් ආරක්ෂා කිරීම. |

## 06 ගොඩිගමුව ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම

| | | | |
|---|---|---|---|
| ඇස්තමේන්තුගත මුදල | රු.මි. 357.00 | ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක | මාතලේ |
| මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය | ශ්‍රී ලංකා ජනරජය | ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය | ඝන මීටර මිලියන 0.25<br>හෙක්ටයාර 195 |
| ව්‍යාපෘති කාලය | 2018 - 2025 | ප්‍රතිලාභීන් | ගොවි පවුල් 265 |
| **2024 සඳහා ප්‍රතිපාදන** | රු.මි. 60.00 | **2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 25.92 |
| සමුච්චිත මූල්‍ය ප්‍රගතිය | රු.මි. 225.37 | සමස්ථ භෞතික ප්‍රගතිය (%) | 61.40 |
| **2024 තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන** | • වැව් බැම්ම ඉදිකිරීම<br>• රළපනාව සහ දිය පෙරනය ඉදිකිරීම<br>• පිටවාන ඉදිකිරීම<br>• වම් ඉවුර සොරොව්ව ඉදිකිරීම | | |
| **2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන** | රු.මි. 90.00 | | |
| **2025 සඳහා යෝජිත වැඩසටහන්** | • රළපනාව සහ දිය පෙරනය ඉදිකිරීම<br>• ප්‍රධාන ඇළ සහ වාරිමාර්ග යටිතල පහසුකම්(IFF) ඉහළ නැංවීම<br>• අමුණ ඉදිකිරීම<br>• පෝෂක ඇළ ඉදිකිරීම | | |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • නව කුඹුරු ඉඩම් හෙක්ටයාර 195ක් සඳහා වාරි පහසුකම් සැපයීම<br>• ගොවීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවන අතර ජාතික නිෂ්පාදනයට දායක වීම | | |

## 07 උමා ඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතිය

| | | | |
|---|---|---|---|
| ඇස්තමේන්තුගත මුදල | රු.මි. 17,914.20* | ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක | මොණරාගල, හම්බන්තොට |
| මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය | ශ්‍රී ලංකා ජනරජය | ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය | අලිකොට ආර - ඝන මීටර මිලියන 6.5<br>කුඩා ඔය - ඝන මීටර මිලියන 22.6<br>හඳපානාගල - ඝන මීටර මිලියන 14<br>නව ඉඩම් හෙක්ටයාර 4,500 සහ පවතින ඉඩම් හෙක්ටයාර 1,500 |
| ව්‍යාපෘති කාලය | 2013 – 2024* | ප්‍රතිලාභීන් | පවුල් 5,700 |

| | | | |
|---|---|---|---|
| **2024 සඳහා ප්‍රතිපාදන** | රු.මි. 2,763.19 | **2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 2,345.11 |
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 17,689.01 | **සමස්ථ භෞතික ප්‍රගතිය (%)** | 97.44 % |
| **2024 තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන** | • කුඩාඔය ජලාශය ඉදිකිරීම - 90%<br>• අලිකොට ආර - කුඩාඔය හරස් ඇළ ඉදිකිරීම (බුදුරුවගල දක්වා) - 72%<br>• කුඩාඔය - සිංහලයාගම හරස් ඇළ ඉදිකිරීම - 67%<br>• හඳපානාගල අමුණ - 100%<br>• ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය සහ නැවත වන වගාව - 100% | | |
| **2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන** | රු.මි. 500.00 | | |
| **2025 සඳහා යෝජිත වැඩසටහන්** | • කුඩාඔය ජලාශය ඉදිකිරීම අවසන් කිරීම.<br>• අලිකොටආර සිට කුඩාඔය හරස් ඇල ඉදිකිරීම අවසන් කිරීම.<br>• කුඩාඔය සිට සිංහලයාගම හරස් ඇල ඉදිකිරීම අවසන් කිරීම.<br>• ග්‍රාමීය වාරි පද්ධති සංවර්ධනය (සුළු වැව් 59)<br>• වැල්ලවාය සහ තණමල්විල ප්‍රදේශවල නව පෝෂිත ඇල පද්ධතියක් ඉදිකිරීම. | | |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • උමා ඔය ද්‍රෝණියේ සිට කිරිදි ඔය ද්‍රෝණියට වාර්ෂිකව ඝන මීටර මිලියන 145ක් ජලය සැපයීම.<br>• නව ඉඩම් හෙක්ටයාර 4,500 කට සහ දැනට පවතින ඉඩම් හෙක්ටයාර 1,500 කට ජලය සැපයීම.<br>• මොණරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික්ක සඳහා ඝන මීටර මිලියන 30 පානීය හා කාර්මික ජලය සැපයීම.<br>• සත්ත්ව ගොවිපොළ සහ මිරිදිය ධීවර සංවර්ධනය<br>• නවීන තාක්ෂණයේ දැනුම හුවමාරු කිරීම<br>කුඩා වැව් 54ක් වැඩි දියුණු කිරීම සහ වැව් 110කට ජලය සැපයීම | | |

*කාලය දීර්ඝ කිරීමට සහ ඇස්තමේන්තු සංශෝධනයට ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

## 08 හිඹිලියාකඩ වාරි යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය

| | | | |
|---|---|---|---|
| **ඇස්තමේන්තුගත මුදල** | රු.මි. 7,155.00 | **ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක** | මාතලේ |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | ශ්‍රී ලංකා ජනරජය | **ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය** | හෙක්ටයාර 744 |
| **ව්‍යාපෘති කාලය** | 2020 - 2024 | **ප්‍රතිලාභීන්** | පවුල් 1,200 |
| **2024 සඳහා ප්‍රතිපාදන** | රු.මි. 250.00 | **2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 34.59 |
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 664.40 | **සමස්ථ භෞතික ප්‍රගතිය(%)** | 6.26 |
| **2024 තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන** | මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ (RAMP) කමිටු තීරණ අනුව හිඹිලියාකඩවැව ඉදිකිරීමේ කටයුතු අවසන් කිරීම | | |

| | |
|---|---|
| **2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන** | - |
| **2025 සඳහා යෝජිත වැඩසටහන්** | - |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • පවතින ඉඩම් හෙක්ටයාර 526කට හා නව ඉඩම් හෙක්ටයාර 409 කට ජලය සැපයීම.<br>• යල සහ මහ දෙකන්නය සඳහාම වාරිජලය සැපයීම මගින් වගා තීව්‍රතාවය 1 සිට 2 දක්වා වැඩි කිරීම.<br>• සුරක්ෂිත පානීය ජලය සහ ගෘහස්ථ ජලය සැපයිම. එමගින් CKD (නිදන්ගත වකුගඩු රෝගය ) වැනි සෞඛ්‍ය ගැටළු අවම කිරීම.<br>• ගොවි පවුල්වල ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම.<br>• භූගත ජල මට්ටම ඉහළ නැංවිම<br>• අලි මිනිස් ගැටුම් අවම කිරීම. |

## 09 තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය

| | | | |
|---|---|---|---|
| **ඇස්තමේන්තුගත මුදල** | රු.මි. 7,226.56 | **ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක** | බදුල්ල /මහනුවර |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | • මූලස්ථායී වැඩ - විදේශීය (අපේක්ෂිත)<br>• ප්‍රාරම්භක වැඩ - දේශීය | **ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය** | ඝන මීටර මිලියන 15.56 බත්මැඩිල්ල ව්‍යාපාරයේ පවතින හෙක්ටයාර 810 සහ නව හෙක්ටයාර 400ක්, මිනිපේ වම් ඉවුර ව්‍යාපාරයේ අර්ධ වශයෙන් හෙක්ටයාර 8000ක් |
| **ව්‍යාපෘති කාලය** | 2018 - 2024 | **ප්‍රතිලාභීන්** | පවුල් 10,000 |
| **2024 සඳහා ප්‍රතිපාදන** | රු.මි. 500.00 | **2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 86.96 |
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 734.20 | **සමස්ථ භෞතික ප්‍රගතිය (%)** | 11.56 |
| **2024 තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන** | • යාලගමුව මාර්ගය වැඩිදියුණු කිරීම<br>• ඉඩම් අත්පත් කර ගැනීම | | |
| **2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන** | - | | |
| **2025 සඳහා යෝජිත වැඩසටහන්** | • යාලගමුව මාර්ගය වැඩිදියුණු කිරීම අවසන් කිරීම<br>• ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ගෙවීම අවසන් කිරීම<br>• ඉංජිනේරුමය සැලසුම් අවසන් කිරීම<br>• නැවත වන වගාව | | |

| | |
|---|---|
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • නව ඉඩම් හෙක්ටයාර 400ක් සඳහා ජලය සැපයීම සහ පවතින ඉඩම් හෙක්ටයාර 810ක් සඳහා අඛණ්ඩව ජලය සැපයීම<br>• ජල විදුලි උත්පාදනය මඟින් වාර්ෂිකව ගිගා වොට් පැය 51.6ක් ජාතික විදුලි පද්ධතියට එක් කිරීම<br>• පානීය ජලය සැපයීම<br>• ධීවර කර්මාන්තය දියුණු කිරීම<br>• ඌව පරණගම සිට කන්දකැටිය දක්වා මාර්ගය වේල්ල මතින් ඉදිකිරීමෙන් දුර ප්‍රමාණය කි.මි. 70ක් පමණ අඩු වීම<br>• මහවැලි පද්ධතියට රොන්මඩ එකතු වීම පාලනය කිරීම |

## 10 පහළ මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතිය

| | | | |
|---|---|---|---|
| **ඇස්තමේන්තුගත මුදල** | රු.මි.22,900.00 | **ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක** | වව්නියාව, මන්නාරම සහ අනුරාධපුර |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | ශ්‍රී ලංකා ජනරජය | **ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය** | ඝන මීටර මිලියන 209<br>හෙක්ටයාර 12,416 (යල කන්නය)<br>හෙක්ටයාර 810 (දෙකන්නයම) |
| **ව්‍යාපෘති කාලය** | 2019 – 2024* | **ප්‍රතිලාභීන්** | අනුරාධපුර, මන්නාරම සහ වවුනියාව දිස්ත්‍රික්කවල ජීවත් වන ජනතාව |
| **2024 සඳහා ප්‍රතිපාදන** | රු.මි. 2,700.00 | **2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 608.22 |
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 1,817.44 | **සමස්ථ භෞතික ප්‍රගතිය (%)** | 7.03 |
| **2024 තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන** | • පස් බැම්ම ඉදිකිරීම සහ දකුණු ඉවුර සොරොව්ව කිරීම.<br>• නැවත පදිංචි කිරීමේ ප්‍රදේශ I සහ IIහි යටිතල පහසුකම් සංවර්ධනය<br>• අලුතින් යෝජිත වම් ඉවුර සහ දකුණු ඉවුර වාරි ප්‍රදේශය සඳහා මිනුම් කිරීම සහ රක්ෂිත සලකුණු කිරීම.<br>• පාරිසරික කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම<br>• විපතට පත් ජනතාව සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ප්‍රදානය කටයුතු<br>• වාන් මාර්ගයේ වම් ඉවුරු පැත්තේ ගල් ඉවත් කිරීම (ආරම්භ කරන ලදී) | | |
| **2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන** | රු.මි. 5,000.00 | | |
| **2025 සඳහා යෝජිත වැඩසටහන්** | • පස් බැම්ම ඉදිකිරීම සහ දකුණු ඉවුර සොරොව්ව නිම කිරීම.<br>• 0+000 සිට 0+225 දක්වා අරිය ගේට්ටු සහිත පිට වාන ඉදිකිරිම, වම් ඉවුර සොරොව්ව සහ බලාගාරයේ පිවිසුම් නලය ඉදිකිරීම (පාදම ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිකාර කටයුතු ඇතුළුව)<br>• නැවත පදිංචි කිරීමේ ප්‍රදේශයේ යටිතල පහසුකම් සංවර්ධනය<br>• යෝජිත වම් සහ දකුණු ඉවුරු වගා බිම් වල සංවර්ධනය<br>• පාරිසරික කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම<br>• ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ලබා දීම.<br>• පිටවාන් මාර්ගයේ වම් ඉවුරේ ගල් ඉවත් කිරීම | | |

| | |
|---|---|
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • නව වාරි ප්‍රදේශ හෙක්ටයාර 810 ක් (වී සහ අතුරු බෝග ) සඳහා වාරි පහසුකම් සැපයීම.<br>• පවතින වාරි ප්‍රදේශ හෙක්ටයාර 12,416 ක් (යෝධ වැව සහ අකතිමුරිප්පු වැව) සඳහා වාරි පහසුකම් සැපයීම.<br>• වවුනියාව, මන්නාරම සහ අනුරාධපුර දිස්ත්‍රික්ක වල වාර්ෂික ගෘහස්ථ ජල ඉල්ලුම සපුරාලීම සඳහා ජලය 21 MCM සැපයීම.<br>• වාර්ෂිකව ව්‍යාපෘතිය හරහා ජනනය කෙරෙන 4.68 GWh ක විදුලිය ජාතික විදුලිබල පද්ධතියට එක් කිරීම.<br>• නව නගර සැලසුම් ව්‍යාපෘතිය යටතේ තන්තිරිමලේ නගරය සංවර්ධනය කිරීම.<br>• වවුනියාව සහ මන්නාරම දිස්ත්‍රික්කවල ගංවතුර අවම කිරීම.<br>• සූර්ය බලශක්ති ව්‍යාපෘති හඳුන්වා දීම<br>• ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය.<br>• අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම<br>• විල්පත්තු ජාතික වන රක්ෂිතයේ නැවත වන වගාව සහ සංරක්ෂණය. |

*කාලය දීර්ඝ කිරීමට සහ ඇස්තමේන්තු සංශෝධනයට ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

## 11 බැරැක් ප්ලේන් සංවර්ධන ව්‍යාපෘතිය

| | | | |
|---|---|---|---|
| **ඇස්තමේන්තුගත මුදල** | රු. මි 230.00 | **ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක** | නුවරඑළිය |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | ශ්‍රී ලංකා ජනරජය | **ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය** | ඝන මීටර මිලියන 0.12<br>හෙක්ටයාර 912 |
| **ව්‍යාපෘති කාලය** | 2021 - 2025 | **ප්‍රතිලාභීන්** | පවුල් 3,000 ක් |
| **2024 සඳහා ප්‍රතිපාදන** | රු. මි 100.00 | **2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය** | රු. මි 27.45 |
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 135.33 | **සමස්ථ භෞතික ප්‍රගතිය (%)** | 51.66 |
| **2024 තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන** | • වැවෙහි රොන්මඩ කැණීම සහ ඉවත් කිරීම<br>• පෝෂක ඇළ ප්‍රතිසංස්කරණය කිරීම | | |
| **2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන** | රු.මි. 100.00 | | |
| **2025 සඳහා යෝජිත වැඩසටහන්** | • වැවෙහි රොන්මඩ කැණීම සහ ඉවත් කිරීම<br>• පෝෂක ඇළ ප්‍රතිසංස්කරණය කිරීම<br>• වැව අවට පාංශු සංරක්ෂණ පිළිවෙත් හඳුන්වා දීම (වැව වටා ප්‍රවේශ මාර්ගයක් සැකසීම)<br>• වැවට රොන්මඩ ගලා ඒම නැවැත්වීමට නව ක්‍රම හඳුන්වා දීම<br>• අපවහන ජලය ඇතුල්වීමමේ නිර්මිත ඉදිකිරීම<br>• වේල්ලෙහි සුළු අලුත්වැඩියාවන් සිදුකිරීම<br>• වැව අවට පාංශු ඛාදනය අවම කිරීම සඳහා භූමි අලංකරණය<br>• මායිම් සලකුණු කර මායිම් ගල් පිහිටුවීම | | |

| | |
|---|---|
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ | • වගා බිම් හෙක්ටයාර 912 ක් සඳහා වාරි ජලය සැපයීම (බැරැක් ප්ලේන් වැව යටතේ එළවළු හෙක්ටයාර් 101, බෝඹුරු ඇල්ල වැව යටතේ වී සහ එළවළු හෙක්ටයාර 811)<br>• පවුල් 3,000ක් සඳහා පානීය ජලය සැපයීම |

## 12 ඒරු වැව - මහකනදරාව පෝෂිත ඇළ ව්‍යාපෘතිය

| | | | |
|---|---|---|---|
| ඇස්තමේන්තුගත මුදල | රු.මි. 2,000.00 | ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක | අනුරාධපුරය |
| මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය | ශ්‍රී ලංකා ජනරජය | ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය | මහකනදරාව (වාන එසවීමෙන් පසු) - ඝ.මී.මි 47.39, හෙක්ටයාර 1658<br>ඒරු වැව (වාන එසවීමෙන් පසු) - ඝ.මී.මි 7.57, හෙක්ටයාර 85 |
| ව්‍යාපෘති කාලය | 2024 - 2026 | ප්‍රතිලාභීන් | ගොවි පවුල් 5237 සහ පවුල් 20,000ක් සඳහා පානීය ජල පහසුකම් සැපැයීම. |
| 2024 සඳහා ප්‍රතිපාදන | රු.මි. 1,000.00 | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය | රු.මි. 375.79 |
| සමුච්චිත මූල්‍ය ප්‍රගතිය | රු.මි. 375.79 | සමස්ථ භෞතික ප්‍රගතිය (%) | 12.20 |
| 2024 තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන | • ඒරුවැව වැඩිදියුණු කිරීම. (වාන් එසවීම, වාන් වැව් බැම්ම ප්‍රවේශ මාර්ග ඉදිකිරීම)<br>• ඒරුවැව සිට මුද්දිරිප්පුව වැව පෝෂක ඇළ දක්වා 0+000 ට පිටවාන නිර්මිතය ඉදිකිරීම. (100% සම්පූර්ණ කර ඇත)<br>• ඒරුවැව සිට මුද්දිරිප්පුව වැව දක්වා පෝෂිත ඇළ වැඩිදියුණු කිරීම.(42% සම්පූර්ණ කර ඇත)<br>• මුද්දිරිප්පුව සහ මහනොච්චිකුලම වැව් වැඩිදියුණු කිරීම් (40% අවසන්)<br>• මුද්දිරිප්පුව වැවේ සිට මහනොච්චිකුලම දක්වා පෝෂිත ඇළ වැඩිදියුණු කිරීම. (40% ක් වැඩිදියුණු කර ඇත)<br>• මහකනදරාව මූලස්ථායී වැඩ වැඩිදියුණු කිරීම. | | |
| 2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන | රු.මි. 500.00 | | |
| 2025 සඳහා යෝජිත වැඩසටහන් | • ඉඩම් අත්පත් කර ගැනීම.<br>• මැනුම්, විමර්ශන සහ ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම<br>• ඒරුවැව සිට මුද්දිරිප්පුව වැව දක්වා පෝෂිත ඇළ වැඩිදියුණු කිරීම.<br>• මුද්දිරිප්පුව වැවේ සිට මහනොච්චිකුලම දක්වා පෝෂිත ඇළ වැඩිදියුණු කිරීම.<br>• මුද්දිරිප්පුව සහ මහනොච්චිකුලම වැව් ඉතිරි වැඩ කොටස් අවසන් කිරීම.<br>• මහකනදරාව මූලස්ථායී වැඩ සිදුකිරීම.<br>• මහනොච්චිකුලම සිට කනදරා ඔය දක්වා පෝෂිත ඇළ වැඩිදියුණු කිරීම | | |

| | |
|---|---|
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • මහකනදරාවේ වගා තීව්‍රතාවය 1.6 සිට 2 දක්වා වැඩි කිරීම.<br>• පානීය ජල පහසුකම් සඳහා ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයට සඳහා ජලය සැපයීම.<br>• ඒරුවැව සහ මහකනදරාව ධීවර කර්මාන්තය ඉහළ නැංවීම. |

**1. ප්‍රධාන හා මධ්‍යම වාරිමාර්ග යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය (හදිසි යටිතල පහසුකම් පුනරුත්ථාපන කටයුතු ද ඇතුළත්ව)**

| දිස්ත්‍රික්කය | කලාපය | ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිපාදන (රු.මි.) | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය(රු.මි.) | භෞතික (%) |
| අම්පාර | අම්පාර | 12 | 140.27 | 41.42 | 30 |
| අනුරාධපුර | අනුරාධපුර | 15 | 100.49 | 53.54 | 53 |
| බදුල්ල | බදුල්ල | 9 | 26.41 | 20.58 | 78 |
| මඩකලපුව | මඩකලපුව | 15 | 212.81 | 117.69 | 55 |
| කොළඹ | කොළඹ | 4 | 38.96 | 1.34 | 3 |
| ගම්පහ | කොළඹ | 1 | 3.84 | 0.72 | 9 |
| කළුතර | කොළඹ | 0 | 0.00 | 0.00 | 0 |
| රත්නපුර | කොළඹ | 13 | 37.55 | 19.36 | 26 |
| ගාල්ල | ගාල්ල | 6 | 18.41 | 2.85 | 15 |
| මාතර | ගාල්ල | 29 | 73.42 | 46.39 | 63 |
| හම්බන්තොට | හම්බන්තොට | 57 | 185.08 | 185.08 | 100 |
| නුවර | නුවර | 2 | 40.38 | 39.88 | 99 |
| මාතලේ | නුවර | 0 | 0.00 | 0.00 | 0 |
| නුවරඑළිය | නුවර | 0 | 0.00 | 0.00 | 0 |
| කුරුණෑගල | කුරුණෑගල | 9 | 28.74 | 23.32 | 81 |
| මන්නාරම | මන්නාරම | 3 | 13.27 | 7.38 | 56 |
| වව්නියාව | මන්නාරම | 4 | 25.52 | 13.06 | 51 |
| මොණරාගල | මොණරාගල | 17 | 81.99 | 77.51 | 95 |
| පොළොන්නරුව | පොළොන්නරුව | 2 | 43.30 | 18.03 | 42 |
| පුත්තලම | පුත්තලම | 5 | 42.30 | 27.65 | 66 |
| ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය | 13 | 87.11 | 70.30 | 100 |
| **එකතුව** | | **216** | **1199.85** | **766.10** | |

## 2. තෝරාගත් මහා වාරිමාර්ග ව්‍යාපාර වල අත්‍යාවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු

| දිස්ත්‍රික්කය | කලාපය | ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිපාදන (රු.මි.) | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය (රු.මි.) | භෞතික (%) |
| අම්පාර | අම්පාර | 88 | 265.78 | 209.09 | 79 |
| අනුරාධපුර | අනුරාධපුර | 45 | 138.63 | 132.73 | 96 |
| බදුල්ල | බදුල්ල | 28 | 93.79 | 91.40 | 97 |
| මඩකලපුව | මඩකලපුව | 31 | 164.27 | 163.78 | 100 |
| කොළඹ | කොළඹ | 8 | 8.73 | 5.93 | 68 |
| ගම්පහ | කොළඹ | 3 | 3.53 | 0.50 | 14 |
| කළුතර | කොළඹ | 0 | 0.00 | 0.00 | 0 |
| රත්නපුර | කොළඹ | 14 | 14.63 | 12.72 | 87 |
| ගාල්ල | ගාල්ල | 2 | 1.55 | 1.45 | 74 |
| මාතර | ගාල්ල | 18 | 62.16 | 55.63 | 90 |
| හම්බන්තොට | හම්බන්තොට | 70 | 238.51 | 237.75 | 99 |
| නුවර | නුවර | 12 | 20.38 | 19.68 | 97 |
| මාතලේ | නුවර | 19 | 50.19 | 46.54 | 93 |
| නුවරඑළිය | නුවර | 8 | 21.88 | 17.95 | 82 |
| කුරුණෑගල | කුරුණෑගල | 47 | 96.49 | 88.80 | 93 |
| මන්නාරම | මන්නාරම | 15 | 74.45 | 27.28 | 36 |
| වව්නියාව | මන්නාරම | 9 | 40.30 | 37.16 | 93 |
| මොනරාගල | මොනරාගල | 44 | 101.22 | 99.52 | 98 |
| පොළොන්නරුව | පොළොන්නරුව | 17 | 74.20 | 71.90 | 96 |
| පුත්තලම | පුත්තලම | 26 | 114.18 | 107.73 | 94 |
| ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය | 43 | 170.59 | 162.52 | 95 |
| **එකතුව** | | **547** | **1,755.46** | **1,590.06** | |

## 3. ගංගා ද්‍රෝණි සංවර්ධනය හා කළමනාකරණ

| දිස්ත්‍රික්කය | කලාපය | ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිපාදන (රු.මි.) | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය (රු.මි.) | භෞතික (%) |
| අම්පාර | අම්පාර | 4 | 16.77 | 4.75 | 19% |
| අනුරාධපුර | අනුරාධපුර | 4 | 9.94 | 4.17 | 87% |
| බදුල්ල | බදුල්ල | 11 | 15.95 | 11.72 | 96% |
| මඩකලපුව | මඩකලපුව | 10 | 96.20 | 91.95 | 95% |

| දිස්ත්‍රික්කය | කලාපය | ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිපාදන (රු.මි.) | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය (රු.මි.) | භෞතික (%) |
| කළුතර | කොළඹ | 2 | 0.74 | 0.51 | 70% |
| රත්නපුර | කොළඹ | 1 | | | |
| ගම්පහ | කොළඹ | 1 | | | |
| ගාල්ල | ගාල්ල | 2 | 48.27 | 40.63 | 93% |
| මාතර | ගාල්ල | 20 | | | |
| හම්බන්තොට | හම්බන්තොට | 10 | 51.02 | 49.31 | 97% |
| නුවර | නුවර | 5 | 6.60 | 5.53 | 83% |
| මාතලේ | නුවර | 1 | 0.16 | | |
| කුරුණෑගල | කුරුණෑගල | 2 | 0.24 | 0.20 | 100% |
| කුරුණෑගල | ITI-ගල්ගමුව | 1 | 6.12 | 6.01 | 100% |
| මොණරාගල | මොණරාගල | 16 | 116.43 | 113.71 | 100% |
| පොළොන්නරුව | පොළොන්නරුව | 3 | 8.60 | 8.28 | 100% |
| පුත්තලම | පුත්තලම | 14 | 160.91 | 105.29 | 67% |
| ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය | 18 | 171.30 | 171.29 | 96% |
| කොළඹ ප්‍රධාන කාර්යාලය | ගංගාධාර කළමනාකරණ අංශය | 1 | 0.20 | 0.17 | 100% |
| | ජල විද්‍යා අංශය | 1 | 0.30 | 0.28 | 100% |
| **එකතුව** | | **127** | **709.80** | **613.88** | |

# ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

## දැක්ම



තිරසාර කෘෂිකර්මය, පුනර්ජනනීය බලශක්තිය, පරිසර සංරක්ෂණය සහ මහවැලි බල ප්‍රදේශවල පදිංචි පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවනු වස් භූමිය සහ ජලය ප්‍රශස්ත අයුරින් භාවිත කිරීම සඳහා වන ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම ආයතනය බවට පත්වීම

## මෙහෙවර

මහවැලි ප්‍රජාව හා ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා පුනර්ජනනීය බලශක්ති උත්පාදනය, හරිත පරිසරය සහ පරිසර හිතකාමී සංචාරක කර්මාන්තය දායක කර ගනිමින් නවීන තාක්ෂණය මත පදනම් වූ නවෝත්පාදක හා තිරසාර කෘෂිකාර්මික ඵලදායිතාවය උදෙසා භූමිය හා ජල සම්පත් ප්‍රශස්ත අයුරින් භාවිතා කිරීම සඳහා මෙහෙයවීම



## අරමුණු



i. ඒකාබද්ධ ජලය හා ඉඩම් සංවර්ධනය තුළින් අදායම් උත්පාදනය කිරීම
ii. ආහාර සුරක්ෂිතතාව සහ සමාජ සමෘද්ධිය සඳහා තිරසාර කෘෂිකාර්මික පද්ධතියක් ඇති කිරීම
iii. ව්‍යවසායකත්වය සහ ආර්ථික සංවර්ධනය තිරසාර කිරීම
iv. සෞඛ්‍යය, අධ්‍යාපනය සහ ආර්ථික තත්ත්වයන් සහතික කරමින් ප්‍රජාවේ ජීවන ප්‍රමිතීන් සවිබල ගැන්වීම
v. මහවැලි ගංගා ද්‍රෝණියේ සහ ඊට අනුබද්ධ ද්‍රෝණි සංරක්ෂණය හා කළමනාකරණය



# ප්‍රධාන කාර්යයන්

i. ප්‍රධාන ජලාශ මෙහෙයුම් මධ්‍යස්ථානය මඟින් ජලාශයන්හි ජල මට්ටම් නියාමනය කිරීම හා ජලය බෙදා හැරීම, ගංවතුර පාලන කටයුතු සිදු කිරීම හා ගංගාධාර ප්‍රදේශ කළමණාකරණය, ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම හා ජල සම්පත් කළමණාකරණය.

ii. මතුපිට ජල ධාරිතාවය ඉහළ නැංවීම හරහා විදුලි බල නිෂ්පාදන, කෘෂි කර්මාන්ත, කර්මාන්ත, පානීය හා ගෘහස්ත ජල අවශ්‍යතා සපුරාලීම.

iii. ජාතික ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම (වී, අතිරේක බෝග, එළවළු, පලතුරු සහ කාලීන බෝග).

iv. අපනයනාභිමුඛ ආනයන ආදේශන නිෂ්පාදන ප්‍රවර්ධනය තුළින් දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීම.

v. දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ධීවර සහ සත්ත්ව නිෂ්පාදන ප්‍රවර්ධනය (දියර කිරි, බිත්තර, මිරිදිය හා විසිතුරු මත්ස්‍යයන්).

vi. ඉඩම් වල ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා පුද්ගලික ආයෝජකයන් දිරිමත් කර නිෂ්පාදන කාර්යයට දායක කර ගැනීම හා භූ සම්පත් කළමණාකරණය තුළින් ආදායම් ඉපයීම.

vii. මහවැලි ගොවි ජනතාවගේ බිමෙහි උරුමය තහවුරු කිරීම උදෙසා ඉඩම් ඔප්පු ලබා දීම.

viii. මහවැලි ගංගා ද්‍රෝණිය ඇතුළු මහවැලි සංවර්ධන බල ප්‍රදේශයේ ජෛව විවිධත්වය ආරක්ෂා කරමින් තිරසර පරිසර සංරක්ෂණය.

ix. මහවැලි කලාප තුළ භෞතික හා සමාජීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා නැංවීම.

x. ඉහළ නිම්න ප්‍රධාන ජලාශ හා පහළ නිම්නයේ වාරි පද්ධතිය නඩත්තු හා මෙහෙයුම්.

xi. ප්‍රධාන මාර්ග, ග්‍රාමීය ප්‍රවේශ මාර්ග ඇතුළු කලාපීය මාර්ග පද්ධතිය නඩත්තු කිරීම.

xii. පුනර්ජනනීය බල ශක්ති ප්‍රභවයන් මඟින් විදුලි බලය ජනනය කොට ජාතික විදුලි බල පද්ධතියට එකතු කිරීම.

xiii. දෙස් විදෙස් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය උදෙසා පහසුකම් සැපයීම (සංචාරක බංගලා, හෙළ බොජුන් හල්, බෝට්ටු සේවා, ජලය මත ගොඩ බස්සන ගුවන් යානා, සෆාරි ජීප් රථ).

xiv. මහවැලි බල ප්‍රදේශ වල ක්‍රියාත්මක ගොවි සංවිධාන හා කාන්තා කුඩා කණ්ඩායම් සවි බල ගැන්වීම, මහවැලි තාරුණ්‍ය පුහුණු කොට රැකියා ගත කිරීම.

xv. මහවැලි ගොවි දුවා දරුවන්ගේ ක්‍රීඩා කෞශල්‍ය ජාතික මට්ටමට රැගෙන ඒම, කලා හා සංස්කෘතික හැකියාවන් ඔප නැංවීම.

## 1. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන විශේෂ වැඩසටහන් වල ප්‍රගතිය

### 1.1 මහවැලි කලාපවල අතහැර දැමූ ඉඩම් ප්‍රයෝජනයට ගනිමින් කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන 10ක් පිහිටුවීම

| | | | |
|---|---|---|---|
| ඇස්තමේන්තුගත මුදල | රු.මි. 250.00 | ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක | අනුරාධපුර, පොලොන්නරුව, මාතලේ, බදුල්ල, අම්පාර, මහනුවර, රත්නපුර, හම්බන්තොට, ත්‍රිකුණාමලය |
| මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය | ශ්‍රී ලංකා ජනරජය | ජලාශ ධාරිතාව/ වගා තීව්‍රතාවය | - |
| ව්‍යාපෘති කාලය | 2023 අගෝස්තු - 2024 දෙසැම්බර් | ප්‍රතිලාභීන් | ගොවීන් 1,093 |
| ප්‍රතිපාදන 2024 | රු.මි. 100.00 | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය | රු.මි. 89.19 |
| සමුච්චිත මූල්‍ය ප්‍රගතිය | රු.මි. 181.05 | සමස්ථ භෞතික ප්‍රගතිය | 95% |
| 2024 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන | වැඩසටහන ක්‍රියාත්මක කළ කාලය තුළ<br>• B කලාපයේ ගම්මානයේ විසිතුරු මත්ස්‍ය නිෂ්පාදන ගම්මානය සඳහා ප්‍රතිලාභීන් 100 දෙනෙකු තෝරාගෙන ඇති අතර 80% ක වැඩ නිම කර ඇත.<br>• C කලාපයේ ගම්මානයේ වැල් දොඩම් නිෂ්පාදන ගම්මානය සඳහා ප්‍රතිලාභී ගොවීන් 96 දෙනෙකු තෝරාගෙන ඇති අතර එහි 100% ක් වැඩ අවසන් කර ඇත.<br>• ප්‍රතිලාභී ගොවීන් 540 දෙනෙකු තෝරාගනිමින්, අපනයන සහ දේශීය වෙළෙඳපොළ සඳහා වසර 5ක කාලයකදී බුලත් කොළ මිලියන 200ක් ලබා ගැනීම සඳහා සී කලාපයේ බුලත් නිෂ්පාදන ගම්මානය සඳහා පුහුණු කර ඇත. 100% ක් වැඩ අවසන් කර ඇත.<br>• අපනයන වෙළෙඳපොළ සඳහා වසර 5ක කාලයකදී මෙ.ටොන් 130ට වැඩි නිෂ්පාදනයක් ලබා ගැනීම සඳහා නයි මිරිස් නිෂ්පාදන ආරක්ෂිත ඒකක 14ක් ස්ථාපිත කර ඇත. 100% ක් වැඩ අවසන් කර ඇත.<br>• අපනයන සහ දේශීය වෙළෙඳපොළ සඳහා වසර 5ක කාලයකදී මෙට්‍රික් ටොන් 10800කට වැඩි නිෂ්පාදනයක් ලබා ගැනීම සඳහා ප්‍රතිලාභී ගොවීන් 300ක් තෝරාගෙන වලව කලාපයේ කෙසෙල් නිෂ්පාදන ගම්මානය ස්ථාපිත කර ඇත. 100% ක් වැඩ අවසන් කර ඇත. | | |
| 2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන | - | | |
| 2025 වර්ෂය සඳහා යෝජිත වැඩසටහන | ව්‍යාපෘතිය අවසන් කර ඇත. | | |

| | |
|---|---|
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • දේශීය වෙළඳපළ මෙන්ම විදේශ වෙළඳපළ අරමුණු කරගෙන උසස් ගුණාත්වයෙන් යුතු මිරිස්, එළවළු, පලතුරු නිෂ්පාදන ගම්මාන 10ක් පිහිටුවීම.<br>• විදේශ වෙළඳපළ වෙත ආනයනය තුළින් විදේශ විනිමය උපයාගැනීම.<br>• ආනයන ආදේශක බෝග වගාව තුළින් විදේශ විනිමය ඉතිරි කරගැනීම.<br>• කෘෂි කර්මාන්තය මත පදනම් වූ ඍජු හා වක්‍ර රැකියා 2500ක් බිහිවීම.<br>• උසස් තාක්ෂණය භාවිතය සඳහා තවත් ගොවි කණ්ඩායම් පෙළඹවීම. |

## 2. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ සිදුකරන සංවර්ධන කටයුතු

### 2.1 කෘෂිකර්මය, පශු සම්පත් සහ ධීවර කටයුතුවල ප්‍රගතිය

- **2024** වසර සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන : රු. මිලි. **900.00**
- මූල්‍ය ප්‍රගතිය : රු. මිලි. **703.22**

### 2.1.1 කෘෂිකර්මාන්තයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය (2024.12.31 දිනට)

| අනු අංක | ප්‍රධාන සංරචකය | කලාපය | ඉලක්කය (මෙ. ටො) (වාර්ෂික) | 2024.12.31 දිනට ප්‍රගතිය (මෙ.ටො) | % |
|---|---|---|---|---|---|
| **1** | **කෘෂිකාර්මික නිෂ්පාදනය** | | | | |
| **1.1** | **බීජ - මහවැලි ගොවිපල** | | | | |
| | බීජ වී | බී, සී, වලව | 122 | 268 | 100% |
| | වෙනත් ක්ෂේත්‍ර බෝග | | | | |
| **1.2** | **බීජ - ගොවීන්** | | | | |
| | බීජ වී | බී, සී, ඩී, ජී, එච්, එල්, හුරුළුවැව, වලව | 2745 | 5020 | 100% |

| **1.3** | **ආහාර බෝග නිෂ්පාදනය** | | | |
|---|---|---|---|---|
| **1.3.1** | **වී වගාව** | | | |
| | **කලාපය** | **ඉලක්කය (මෙ.ටො) වාර්ෂික** | **2024.12.31 දිනට නිෂ්පාදනය/ ප්‍රගතිය (මෙ.ටො)** | **%** |
| i. | බී | 229,715 | 236,878 | 100% |
| ii. | සී | 250,444 | 258,686 | 100% |
| iii. | ඩී | 15,590 | 15,115 | 97% |
| iv. | ජී | 58,012 | 67,645 | 100% |
| v. | එච් | 188,947 | 211,636 | 100% |
| vi. | එල් | 14,715 | 22,278 | 100% |
| vii. | හුරුළුවැව | 79,060 | 88,786 | 100% |
| viii. | වලව | 122,276 | 137,390 | 100% |
| ix. | රඹකැන්ඔය | 11,339 | 13,914 | 100% |
| x. | ඊ | 5,133 | 5,342 | 100% |
| | **එකතුව** | **975,231** | **1,057,670** | **100%** |

| 1.3.2 | ලොකු ලූණු | | | |
|---|---|---|---|---|
| | කලාපය | ඉලක්කය (මෙ.ටො) වාර්ෂික | 2024.12.31 දිනට නිෂ්පාදනය/ ප්‍රගතිය (මෙ.ටො) | % |
| i. | ජී | 4,000 | 440 | 11% |
| ii. | එච් | 6,000 | 2,860 | 48% |
| iii. | හුරුළුවැව | 4,000 | 3,640 | 91% |
| | **එකතුව** | **14,000** | **6,940** | **50%** |

| 1.3.3 | බඩ ඉරිඟු | | | |
|---|---|---|---|---|
| | කලාපය | ඉලක්කය (මෙ.ටො) වාර්ෂික | 2024.12.31 දිනට නිෂ්පාදනය/ ප්‍රගතිය (මෙ.ටො) | % |
| i. | බී | 5,375 | 3,405 | 63% |
| ii. | සී | 7,810 | 10,265 | 100% |
| iii. | ඩී | 1,130 | 615 | 54% |
| iv. | ජී | 1,550 | 280 | 18% |
| v. | එච් | 4,820 | 3,765 | 78% |
| vi. | එල් | 1,100 | 375 | 34% |
| vii. | හුරුළුවැව | 4,200 | 3,820 | 91% |
| viii. | වලව | 2,650 | 1,550 | 58% |
| ix. | රඹකැන්ඔය | 18,815 | 15,635 | 83% |
| x. | ඊ | 1,175 | 1,280 | 100% |
| | **එකතුව** | **48,625** | **40,990** | **84%** |

| 1.3.4 | මිරිස් | | | |
|---|---|---|---|---|
| | කලාපය | ඉලක්කය (මෙ.ටො) වාර්ෂික | 2024.12.31 දිනට නිෂ්පාදනය/ ප්‍රගතිය (මෙ.ටො) | % |
| i. | බී | 2,628 | 702 | 27% |
| ii. | සී | 1,737 | 2,268 | 100% |
| iii. | ඩී | 990 | 369 | 37% |
| iv. | ජී | 1,170 | 162 | 14% |
| v. | එච් | 2,763 | 1,611 | 58% |
| vi. | එල් | 1,305 | 810 | 62% |
| vii. | හුරුළුවැව | 1,827 | 1,017 | 56% |
| viii. | වලව | 2,970 | 1,782 | 60% |
| ix. | රඹකැන්ඔය | 1,395 | 171 | 12% |
| x. | ඊ | 945 | 666 | 70% |
| | **එකතුව** | **17,730** | **9,558** | **54%** |

| 1.3.5 | වෙනත් ක්ෂේත්‍ර බෝග | | | | |
|---|---|---|---|---|---|
| | ප්‍රධාන සංරචකය | කලාපය | ඉලක්කය (මෙ. ටො) (වාර්ෂික ) | 2024.12.31 දිනට ප්‍රගතිය (මෙ.ටො) | % |
| i. | සෝයා | එච්, හුරුළුවැව | 9,525 | 7,740 | 81% |
| ii. | උඳු | බී, සී, ඩී, ජී, එච්, එල්, හුරුළුවැව, රඹකැන්ඔය, ඊ | 3,679 | 2,258 | 61% |
| iii. | කවුපි | බී, සී, ඩී, ජී, එච්, එල්, වලව, හුරුළුවැව, රඹකැන්ඔය, ඊ | 1,569 | 1,134 | 72% |
| iv. | කුරක්කන් | | 1,722 | 1,171 | 68% |
| v. | මුං ඇට | | 7,291 | 6,654 | 91% |
| vi. | රට කජු | | 4,090 | 3,484 | 85% |
| vii. | තල | | 224 | 200 | 89% |
| viii. | කහ | | 5,620 | 4,840 | 86% |
| ix. | ඉඟුරු | | | | |

| 1.4 | පළතුරු | | | | |
|---|---|---|---|---|---|
| | ප්‍රධාන සංරචකය | කලාපය | ඉලක්කය - වාර්ෂික (මෙ. ටො) | 2024.12.31 දිනට ප්‍රගතිය (මෙ.ටො) | % |
| i. | කෙසෙල් | බී, සී, ඩී, ජී, එච්, එල්, වලව, හුරුළුවැව, රඹකැන්ඔය, ඊ | 121,320 | 99,435 | 82% |
| ii. | පැපොල් | | 9,504 | 6,181 | 65% |
| iii. | පේර | | 1,871 | 1,090 | 58% |
| iv. | අනෙකුත් පළතුරු (අඹ, ඩ්‍රැගන් ෆෘට්, අන්නාසි, පැෂන්, තැඹිලි) | | 28,374 | 29,089 | 100% |

| 1.5 | එළවළු | | | | |
|---|---|---|---|---|---|
| අංක | ප්‍රධාන සංරචකය | කලාපය | ඉලක්කය (මෙ. ටො) (වාර්ෂික ) | 2024.12.31 දිනට ප්‍රගතිය (මෙ.ටො) | % |
| i. | එළවළු | බී, සී, ඩී, ජී, එච්, එල්, වලව, හුරුළුවැව, රඹකැන්ඔය, ඊ | 121,695 | 132,828 | 100% |

## 2.1.2 පශු සම්පත් නිෂ්පාදනයේ ප්‍රගතිය

| 1 | මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය | | | |
|---|---|---|---|---|
| | කලාපය | ඉලක්කය (මෙ.ටො) වාර්ෂික | 2024.12.31 දිනට ප්‍රගතිය (මෙ.ටො) | % |
| i. | බී | 5,500 | 4,895 | 89% |
| ii. | සී | 1,700 | 2,103 | 100% |
| iii. | ඩී | 1,300 | 1,420 | 100% |
| iv. | ඊ | 1,000 | 1,396 | 100% |
| v. | ජී | 500 | 156 | 31% |
| vi. | එච් | 3,500 | 3,279 | 94% |
| vii. | එල් | 300 | 408 | 100% |
| viii. | හුරුළුවැව | 700 | 471 | 67% |
| ix. | රඹකැන්ඔය | 1,300 | 1,359 | 100% |
| x. | වලව | 2,200 | 1,980 | 90% |
| | **එකතුව** | **18,000** | **17,467** | **97%** |

| 2 | කිරි නිෂ්පාදනය | | | |
|---|---|---|---|---|
| | කලාපය | ඉලක්කය (ලිටර් මිලි.) වාර්ෂික | 2024.12.31 දිනට ප්‍රගතිය (ලිටර් මිලි.) | % |
| i. | බී | 10 | 11.61 | 100% |
| ii. | සී | 9 | 10.22 | 100% |
| iii. | ඩී | 6.6 | 5.89 | 89% |
| iv. | ඊ | 2.3 | 1.42 | 62% |
| v. | ජී | 0.8 | 0.60 | 75% |
| vi. | එච් | 15 | 14.25 | 95% |
| vii. | එල් | 2.9 | 2.00 | 69% |
| viii. | හුරුළුවැව | 6.4 | 5.05 | 79% |
| ix. | රඹකැන්ඔය | 10 | 4.01 | 40% |
| x. | වලව | 7 | 5.34 | 76% |
| | **එකතුව** | **70** | **60.39** | **86%** |

| 3 | බිත්තර නිෂ්පාදනය | | | |
|---|---|---|---|---|
| | කලාපය | ඉලක්කය (මිලියන) වාර්ෂික | 2024.12.31 දිනට ප්‍රගතිය (මිලියන) | % |
| i. | බී | 35.5 | 18.44 | 52% |
| ii. | සී | 16.5 | 15.55 | 94% |
| iii. | ඩී | 13 | 9.15 | 70% |
| iv. | ඊ | 3 | 1.59 | 53% |
| v. | ජී | 3 | 1.87 | 62% |
| vi. | එච් | 14 | 13.29 | 95% |

| 3 | බිත්තර නිෂ්පාදනය | | | |
|---|---|---|---|---|
| | කලාපය | ඉලක්කය (මිලියන) වාර්ෂික | 2024.12.31 දිනට ප්‍රගතිය (මිලියන) | % |
| vii. | එල් | 6 | 2.64 | 44% |
| viii. | හුරුළුවැව | 5 | 5.47 | 100% |
| ix. | රඹකැන්ඔය | 10 | 12.37 | 100% |
| x. | වලව | 8 | 11.58 | 100% |
| | **එකතුව** | **114** | **91.96** | **81%** |

| 4 | විසිතුරු මසුන් වගාව | | | |
|---|---|---|---|---|
| | කලාපය | ඉලක්කය (මිලියන) වාර්ෂික | 2024.12.31 දිනට ප්‍රගතිය (යුගල මිලියන) | % |
| i. | බී | 28 | 29.00 | 100% |
| ii. | සී | 2 | 2.10 | 100% |
| iii. | ඩී | 1.5 | 1.20 | 80% |
| iv. | ඊ | 0.5 | 0.62 | 100% |
| v. | ජී | 0.3 | 0.13 | 43% |
| vi. | එච් | 6 | 5.87 | 98% |
| vii. | එල් | 0.2 | 0.02 | 8% |
| viii. | හුරුළුවැව | 2 | 1.28 | 64% |
| ix. | රඹකැන්ඔය | 2 | 0.04 | 2% |
| x. | වලව | 1 | 0.42 | 42% |
| | **එකතුව** | **43.5** | **40.67** | **93%** |

### 2.1.3 පශු සම්පත් හා ධීවර අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම්

| අනු අංක | ප්‍රධාන ක්‍රියාකාරකම | ඒකකය | ක්‍රියාත්මක වූ කලාප | ඉලක්කය 2024 | ප්‍රගතිය (2024.12.31) |
|---|---|---|---|---|---|
| 1 | **කිරිගව සංවර්ධනය** | | | | |
| i. | ගොවිපල සැලසුම් සැකසීම හා කිරි ගොවීන් පුහුණු කිරීම | කිරි ගොවි පවුල් | බී, සී, ඩී, ඊ, ජී, එච්, හුරුළුවැව, එල්, රඹකැන්ඔය, උඩවලව | 650 | 400 |
| ii. | ගව නිවාස හා උපාංග ලබාදීම | නිවාස හා උපාංග | බී, සී, ඩී, ඊ, ජී, එච්, හුරුළුවැව, එල්, රඹකැන්ඔය, උඩවලව | 179 | 135 |
| 2 | **විසිතුරු මත්ස්‍ය වගාව** | | | | |
| i. | අභිජනන ගොවිපල සංවර්ධනය | ගොවීන් | බී, සී, ඩී, ඊ, ජී, එච්, හුරුළුවැව, එල්, රඹකැන්ඔය, උඩවලව | 24 | 20 |

| අනු අංක | ප්‍රධාන ක්‍රියාකාරකම | ඒකකය | ක්‍රියාත්මක වූ කලාප | ඉලක්කය 2024 | ප්‍රගතිය (2024.12.31) |
|---|---|---|---|---|---|
| ii. | මඩ පොකුණු/ නිරෝධායන පොකුණු ලබාදීම/ යටිතල පහසුකම් සංවර්ධනය | පොකුණු | බී, සී, ඩී, ඊ, ජී, එච්, හුරුළුවැව, එල්, රඹකැන්ඔය, උඩවලව | 12 | 12 |
| 3 | **කුකුළු නිෂ්පාදන ප්‍රවර්ධනය** | | | | |
| i. | සුළු පරිමාණ ගොවීන් මධ්‍ය පරිමාණයට පුළුල් කිරීම | ගොවි පවුල් | බී, සී, ඩී, ඊ, ජී, එච්, හුරුළුවැව, එල්, රඹකැන්ඔය, උඩවලව | 2000 | 1926 |
| ii. | මසක් වයසැති පැටවුන් ලබාදීම | වැඩසටහන් | බී, සී, ඩී, ඊ, ජී, එච්, හුරුළුවැව, එල්, රඹකැන්ඔය, උඩවලව | 1 (ADB ව්‍යාපෘතිය) 100,000 | 1 (ADB ව්‍යාපෘතිය) 100,000 |
| 4 | **මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ප්‍රවර්ධනය** | | | | |
| i. | මත්ස්‍ය ඇඟිල්ලන් | මිලියන | බී, සී, ඩී, ඊ, ජී, එච්, හුරුළුවැව, එල්, රඹකැන්ඔය, උඩවලව | 6 | 6 |
| ii. | මත්ස්‍ය ඇසිත්තන් | මිලියන | බී, සී, ඩී, ඊ, ජී, එච්, හුරුළුවැව, එල්, රඹකැන්ඔය, උඩවලව | 7 | 7 |
| iii. | මිරිදිය ඉස්සන් | මිලියන | බී, සී, ඩී, ඊ, ජී, එච්, හුරුළුවැව, එල්, රඹකැන්ඔය, උඩවලව | 3.7 | 3.7 |
| iv. | දැල්කූඩු ලබාදීම | කූඩු | බී, සී, ඩී, ඊ, ජී, එච්, හුරුළුවැව, එල්, රඹකැන්ඔය, උඩවලව | 20 | 20 |

## 2.2 ආයතන සංවර්ධන අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය (2024.12.31 දිනට)

| | ප්‍රධාන සංරචකය | ක්‍රියාත්මක වූ කලාප | ඉලක්කය | ප්‍රගතිය | % |
|---|---|---|---|---|---|
| i. | වෘත්තීය පුහුණු ලද රැකියා විරහිත තරුණ තරුණියන් රැකියාගත කිරීම | බී,සී,ඩී,ඊ,ජී,එල්,එච්, වලව, හුරුළුවැව, රඹකැන්ඔය | 1500 | 897 | 60% |
| ii. | මහවැලි කලාප තුළ සිටින දක්ෂ ක්‍රීඩකයින් හඳුනා ගැනීම හා ඔවුන්ගේ කුසලතා වර්ධනය කිරීම | බී,සී,ඩී,ඊ,ජී,එල්,එච්, වලව, හුරුළුවැව, රඹකැන්ඔය | වැඩසටහන් 3/ සහභාගිත්වය 340 | 3 | 100% |

| | ප්‍රධාන සංරචකය | ක්‍රියාත්මක වූ කලාප | ඉලක්කය | ප්‍රගතිය | % |
|---|---|---|---|---|---|
| iii. | ප්‍රජා සහභාගිත්ව වාරි සහභාගිත්ව කළමනාකරණ වැඩසටහන් | බී,සී,ඩී,ඊ,ජී,එල්,එච්, වලව, හුරුළුවැව, රඹකැන්ඔය | 129 | 129 | 100% |

## 2.3 ඉඩම් ලබා දීම

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් ප්‍රදාන නිකුත් කිරීමේ ප්‍රගතිය

| | කලාප | ඉලක්කය | 2024.12.31 දිනට ලබාදුන් ඔප්පු පිළිබඳ ප්‍රගතිය |
|---|---|---|---|
| i. | බී | 7,935 | 6,892 |
| ii. | සී | 7,904 | 5,656 |
| iii. | ඩී | 712 | 485 |
| iv. | එච් | 8,093 | 3,734 |
| v. | එල් | 2,115 | 993 |
| vi. | වික්ටෝරියා | 289 | 284 |
| vii. | හුරුළුවැව | 2,214 | 785 |
| viii. | මොරගහකන්ද | 4,435 | 1,472 |
| ix. | වලව | 9,450 | 6,242 |
| x. | රඹකැන්ඔය | 522 | 426 |
| | **එකතුව** | **43,669** | **26,969** |

## 2.4 පරිසර සංරක්ෂණය

පරිසර සංරක්ෂණ වැඩසටහනේ ප්‍රගතිය

| | ප්‍රධාන සංරචකය | ඒකකය | ක්‍රියාත්මක වූ කලාප | ඉලක්කය 2024 | ප්‍රගතිය 2024.12.31 |
|---|---|---|---|---|---|
| i. | පැළ නිෂ්පාදනය (මහවැලි තවාන් , පාසල් ළමුන් හා ගොවීන් මගින්) | පැළ | බී, සී, ඊ, ජී, එල්, රඹකැන්ඔය, වලව | 99,300 | 96,084 |
| | | පැළ (නඩත්තු) | කොත්මලේ | 325,578 | 325,578 |
| ii. | ඉහළ ජලපෝෂක හා පහළ නිම්න ප්‍රදේශ ආශ්‍රිත රුක්රෝපණය | පැළ | බී, සී, ඩී, ඊ, ජී, එච්, එල්, රඹකැන්ඔය, වලව, හුරුළු වැව | 94,900 | 73,174 |
| iii. | ඉහළ ජලපෝෂක ප්‍රදේශ ආශ්‍රිත පාංශු සංරක්ෂණ වැඩසටහන | මීටර | හුරුළුවැව, කොත්මලේ | 15,020 | 21,005 |

| | ප්‍රධාන සංරචකය | ඒකකය | ක්‍රියාත්මක වූ කලාප | ඉලක්කය 2024 | ප්‍රගතිය 2024.12.31 |
|---|---|---|---|---|---|
| iv. | පරිසර අධ්‍යාපන හා ප්‍රවර්ධන | වැඩසටහන් | බී, සී, ඩී, ඊ, ජී, එච්, එල්, රඹකැන්ඔය, වලව, හුරුළු වැව | 65 | 64 |
| v. | පාරිසරික බලපෑම් අධ්‍යයනය | වාර්තා | ප්‍රධාන කාර්යාලය | 7 | 3 ක් අවසන් කර ඇත. 2 ක් සකස් කරමින් පවතී, 2ක් ප්‍රසම්පාදන අදියරේ පවතී. |
| vi. | ඉහළ ජලපෝෂක ප්‍රදේශ ආශ්‍රිත ජල තත්ත්ව හා ජල විද්‍යා අධ්‍යයනය | සාම්පල | එල්, කොත්මලේ | 240 | 220 |
| | | ස්ථාන | කොත්මලේ | 14 | 14 |
| vii. | පටක රෝපිත පැල නිෂ්පාදනය | පැළ | කොත්මලේ | 250,000 | 93,000 |
| viii. | අලි මිනිස් ගැටුම අවම කිරීම (අලි වෙඩි, එනර්ජයිසර් ආදිය) හා ජීව වැට නඩත්තුව | ජීව වැට කි.මී. | සී, ඩී, එච්, රඹකැන්ඔය, වලව | 93.3 (නව), 25 ( නඩත්තු) | 69.8 (නව) 25 (නඩත්තු) |
| | | අලි වෙඩි | එල්, රඹකැන්ඔය | 5,700 | 5,700 |
| | | විදුලි ලාම්පු | සී, හුරුළුවැව | 600 | 500 |
| | | එනජයිසර් | සී | 2 | 2 |
| | | සූර්ය පැනල | සී | 2 | 2 |
| | | වැඩසටහන් | ජී | 13 | 6 |
| ix. | ආක්‍රමණශීලී ආගන්තුක ජලජ ශාක ඉවත් කිරීම | වැව් ගණන | බී, ඩී, රඹකැන්ඔය, වලව | 47 | 37 |
| | | හෙක්ටයාර | කොත්මලේ | 10 | 8.84 |
| | | වැඩසටහන් | සී, ඊ, ජී | 9 | 6 |
| x. | උද්‍යාන අලංකරණය හා කසළ කළමණාකරණය | කසල බඳුන් | එච්, එල්, වලව | 92 | 92 |
| | | වැඩසටහන් | බී, සී, ඩී, එච්, එල්, හුරුළුවැව | 10 | 10 |
| xi. | ජලාශවලට කසළ එකතුවීම පාලනය සඳහා බාධක වැට ඉදිකිරීම | මීටර | කොත්මලේ | 1,000 | 917 |

# වාරිමාර්ග කළමනාකරණ අංශය

වාරිමාර්ග කළමනාකරණ අංශය ඒකාබද්ධ වාරිමාර්ග කළමනාකරණ වැඩ සටහන (INMAS) ක්‍රියාත්මක කිරීම සඳහා 1984 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. මෙම අංශය විසින් හෙක්ටයාර් 400ට වැඩි මහා වාරිමාර්ග බල ප්‍රදේශ 54ක සහභාගීත්ව කළමනාකරණ ක්‍රියාවලිය ශක්තිමත් කරගෙන යනු ලැබේ. මෙම වැඩසටහනේ අරමුණ වනුයේ මෙම සංවිධානයේ දැක්ම වන්නේ වාරිමාර්ග සම්පත් ස්වයං කළමනාකරණය සඳහා ස්වශක්තිය පිළිබඳ විශ්වාසයෙන් යුතු වාරිමාර්ග ගොවි ප්‍රජාවක් සංවර්ධනය කිරීමයි. ගොවි සංවිධාන (FO), රජය, රාජ්‍ය නොවන සංවිධාන (NGO) සහ පෞද්ගලික අංශයේ සහභාගීත්වය සහ දායකත්වය ප්‍රවර්ධනය කිරීමෙන්, ඉහත සඳහන් ප්‍රවේශයන් ක්‍රියාත්මක කිරීම සහ වාරිමාර්ග ජල ඒකකයක සහ ඉඩම් ඒකකයක ඵලදායිතාව වැඩි දියුණු කිරීම තුළින් ගොවි පවුල්වල තිරසර ආර්ථික සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම මෙම වැඩසටහන තුළින් අපේක්ෂා කෙරේ.

මෙම අංශයේ ප්‍රධාන වගකීම වන්නේ කළමනාකරණය සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම, වාරිමාර්ග උප පද්ධතියේ ක්‍රියාකාරිත්වය සහ නඩත්තුව වැඩිදියුණු කිරීම, කෘෂිකාර්මික නිෂ්පාදනය සහ ඵලදායිතාව වැඩි කිරීම සඳහා ආයතන සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීම සහ ගොවීන්ගේ සහ ගොවි සංවිධාන නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය යන අරමුණු ඇතිව ගොවීන් පාදක කරගත් ආයතන ස්ථාපිත කිරීම සහ ශක්තිමත් කිරීම තුළින් ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රමවල ගොවි ප්‍රජාවේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමයි.

**දැක්ම**

මහා වාරිමාර්ග ආශ්‍රිතව සෞභාග්‍යමත් ගොවි ප්‍රජවක් බිහිකිරීම



**මෙහෙවර**

සංවිධිත ගොවි ප්‍රජාවක් තුළින් සහ යෙදවුම් හා සේවා සැපයුම් ආයතන සම්බන්ධීකරණයෙන් කෘෂිකාර්මික නිෂ්පාදනය හා වාරි ජල ඒකකයක ඵලදායීතාව ඉහළ නැංවීම



# අරමුණු



i. වාරිමාර්ග ජල ඒකකයකින් සහ ඉඩම් ඒකකයකින් ලබන ආර්ථික වාසි උපරිම කිරීම

ii. වාරිමාර්ග ජලය සාධාරණව හා සමානාත්මකව ගොවීන් අතර බෙදා ගැනීම සඳහා පහසුකරණය

iii. වාරිමාර්ග ආශ්‍රිත සම්පත් කළමනාකරණයට ගොවීන් සහභාගී කර ගැනිම සඳහා අවශ්‍ය ආයතනික ව්‍යුහය සකස් කිරීම, ශක්තිමත් කිරීම සහ පවත්වාගෙන යාම

iv. වාරිමාර්ග පද්ධතිවල මෙහෙයුම් හා නඩත්තු කටයුතු ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාම සඳහා පසුබිම සැකසීම හා පහසුකරණය

v. ප්‍රතිලාභීන් හා රජය මෙන්ම පෞද්ගලික ආයතන අතර මනා සම්බන්ධීකරණය තුළින් කෘෂිකාර්මික නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායීතාව ඉහළ නැංවීම

vi. ගොවි ප්‍රජාවගේ දැනුම හා කුසලතා සංවර්ධනය කිරීම තුළින් සුභවාදී ආකල්ප ඇති කිරීම

vii. කෘෂිකාර්මික සහාය සේවාවන් ශක්තිමත් කිරීම

viii. ගොවි පවුල්වල ආර්ථික හා සමාජ සංවර්ධනය

# 2024 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වල ප්‍රගතිය

## 1. ගොවි සංවිධාන පිහිටුවීම, ශක්තිමත් කිරීම, යහපාලනය තහවුරු කිරීම හා සක්‍රිය මට්ටමින් පවත්වාගෙන යාම

මෙම අංශය මගින් කළමනාකරණය කරනු ලබන මහා වාරිමාර්ග ව්‍යාපාර 54 හි ගොවි සංවිධාන 908 ක් පිහිටුවා ඇති අතර, එම ගොවි සංවිධාන ආයතනික වශයෙන් ශක්තිමත් කර ඒවායේ යහපාලනය සහ විනිවිදභාවය තහවුරු කිරීම හා සක්‍රීය මට්ටමින් පවත්වාගෙන යාමට නිරන්තරයෙන් කටයුතු කරනු ලබයි. ඒ අනුව, ගොවි සංවිධාන වල ගිණුම් කටයුතු යථාවත් කිරීම සහ අභ්‍යන්තර ගිණුම් පරීක්ෂාව (838), අවසන් ගිණුම් සැකසීම (830), ගිණුම් බාහිර විගණනය (770), නිලවරණ පැවැත්වීම (573), මහා සභා රැස්වීම් පැවැත්වීම (1,728) සහ මාසික කමිටු රැස්වීම් පැවැත්වීම (9,504) සිදුකර ඇත.

එසේම ගොවි සංවිධාන 65 ක ව්‍යවස්ථාව සංශෝධනය කිරීම, ගොවි සංවිධාන 137 කට සම්මත හා කාර්ය පරිපාටි හඳුන්වාදීම සහ ඒවා භාවිතය තහවුරු කිරීම සහ ගොවි සංවිධාන අරමුදල රු. මිලියන 42 දක්වා වර්ධනය කිරීමත් සිදුකරන ලදී.

## 2. වාරිමාර්ග කළමනාකරණය

වාරිමාර්ග කළමනාකරණ කටයුතු සඳහා තීරණ ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ කමිටුව හා පෙර වගා (කන්න) රැස්වීම පැවැත්වීම සහ වගා (කන්න) රැස්වීම පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකරණය සැපයීම සිදු කරනු ලබයි. ජලය ඇතුළු කෘෂිකාර්මික යෙදවුම් හා සේවා කලට වෙලාවට සැපයීම තහවුරු කිරීම, නියමිත වේලාවට පෙර කන්න රැස්වීම් පවත්වා වගා (කන්න) රැස්වීම් පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකරණය කිරීම සහ වගා (කන්න) රැස්වීම් තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පසු විපරම් කිරීම හා වාරිමාර්ග කළමනාකරණ කටයුතු කාර්යක්ෂමව පවත්වා ගෙන යාමට අවශ්‍ය තීරණ ගැනීම සඳහා මාසිකව ව්‍යාපෘති කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සිදුකරන ලදී.

ඒ අනුව මේ දක්වා ව්‍යාපෘති කළමනාකරණ කමිටු රැස්වීම් 401 ක් ද, පෙර කන්න රැස්වීම් 104 ක් ද, කන්න රැස්වීම් 196 ක් ද පැවැත්වීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය හා පහසුකරණය සලසා ඇත.

## 3. සහභාගීත්ව නඩත්තුව හා ජල කළමනාකරණ වැඩසටහන

මෙම අංශය මගින් කළමනාකරණය කරනු ලබන මහා වාරිමාර්ග බලප්‍රදේශ 54 හි වාරිමාර්ග උප පද්ධතියේ (බෙදුම් ඇළ හා කෙත් ඇළ) මෙහෙයුම් හා නඩත්තු කටයුතු නිරන්තරව ඉටු කිරීම සඳහා ගිවිසුමක් මගින් ගොවි සංවිධානවලට භාර දී ඒ මගින් ඉටු කරවා ගනු ලබයි. මෙම කාර්යය ගුණාත්මයෙන් යුක්තව ඉටු කිරීම සඳහා ගොවි සංවිධාන මෙහෙයවීම, මගපෙන්වීම, පහසුකරණය සහ ඒ සඳහා ගොවි සංවිධාන නිලධාරීන්ගේ දැනුම හා කුසලතාවය වර්ධනය කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

ඒ අනුව බෙදුම් ඇළ දිග කි.මී. 2,700ක සහ කෙත් ඇළ දිග කි.මී. 7,500 ක ඇළ සහ පාර දෙපස තණකොළ මට්ටමකට කැපීම සහ රොන් මඩ ඉවත් කිරීම, කෘෂි මංමාවත් දිග කි.මී. 543 නඩත්තු කිරීම, දියබස්නා ඇළවල් කි.මී. 277 නඩත්තු කිරීම සිදුකර ඇත.

එයට අමතරව සහභාගීත්ව නඩත්තු හා ජල කළමනාකරණ වැඩසටහන ප්‍රවර්ධනය සඳහා ගොවි සංවිධාන මට්ටමින් නිරන්තර නඩත්තු සැලසුම් 40 ක් සැකසීම සහ සැළසුම් 364 ක් යථාවත් කිරීම , බෙදුම් ඇළ දිග කි.මී.1,216 හා කෙත් ඇළ දිග කි.මී. 1,042 ක රක්ෂිත මායිම් සලකුණු කිරීම සහ රක්ෂිත මායිම් සංරක්ෂණය කිරීම උදෙසා රක්ෂිත මායිම්වල ගල්කණු 3,290 ක්ද, පැළ 8,060 ක් ද සිටුවීම සිදු කරන ලදි.

වාරි සංස්කෘතිකාංග ආරක්ෂා කිරීම සඳහා ජලය ආශ්‍රිත පූජා කර්ම/ චාරිත්‍ර වාරිත්‍ර ප්‍රවර්ධනය සඳහා ගොවි සංවිධාන මට්ටමින් වැඩසටහන් 485 ක් සහ යල් අස්වනු පූජාව නවවෙනි වරට ශ්‍රී දළදා මාලිගාවේ දි පැවැත්විම සිදුකර ඇත. එසේම කන්න රැස්වීම් තීරණ මත පදනම්ව, වාරිමාර්ග උප පද්ධතියේ නඩත්තු කටයුතු සඳහා ගොවීන් විසින් ගොවි සංවිධාන වල අරමුදල් වර්ධනය සඳහා ලබා දී ඇති මුදල රුපියල් මිලියන 94ක් වේ.

## 4. කෘෂි නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායීතාව ඉහළ නැංවීම

මෙම අංශයේ සම්බන්ධීකරණය, මෙහෙයවීම හා පහසුකරණය යටතේ ඒකාබද්ධ මහා වාරිමාර්ග කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලද මහා වාරිමාර්ග ව්‍යාපාර 54 හි කෘෂිකාර්මික නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායීතාවය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| විශේෂිත දර්ශක | 2023 /24 මහ සහ 2024 යල ප්‍රගතිය | | |
|---|---|---|---|
| | මිනුම් ඒකකය | 2023 /24 මහ | 2024 යල |
| වී වගා කළ බිම් ප්‍රමාණය | හෙක්. | 152,667 | 136,349 |
| වෙනත් ආහාර බෝග වගාව හා එළවළු වගාව | හෙක් | 3,166 | 9,384 |
| බහු වාර්ෂික බෝග වගාව (කෙසෙල්, උක්) | හෙක් | 3,048 | 3,949 |
| වගා කළ මුළු බිම් ප්‍රමාණය | හෙක් | 158,510 | 149,682 |
| වගා තීව්‍රතාවය% | % | 96 | 92 |

## 5. ක්‍රියාත්මක කරනු ලැබූ විශේෂ වැඩසටහන්

- හෙක්ටයාර 11, 240 ක 3 වන කන්නයේ මුං වගාව ව්‍යාප්ත කිරීම (රිදීබැදිඇළ/ හක්වටුනාඔය/ මීඔය/ උස්ගල/ තබ්බෝව/ රාජාංගනය/ යාංඔය/ හුරුළුවැව/ නාච්චාදූව/ වාහල්කඩ/ කවුඩුවවැව/ මිනිපේ/ මාපාකඩවැව/ වේලිඔය/ කිරිදිඔය/ ගල්ඔයවෙ.ඉ./ අක්කරපත්තුව/ දමන/ කන්තලේ යන මහා වාරිමාර්ග ව්‍යාපාරවල).

- තුන්වන කන්නයට අවශ්‍ය මුං, ස්වයං බීජ නිෂ්පාදනය කර ගැනීම නියරේ වගාව තුළින් සපුරා ගැනීමට ගොවීන් යොමු කිරීමේ අරමුණින් 50% ක රජයේ දායකත්වය යටතේ බීජ කි.ග්‍රෑ. 3066 ක් ප්‍රතිලාභීන් 3492 කුට බෙදා දීම. රජයේ දායකත්වය රු. මිලි. 2.05 ක් ද ගොවි දායකත්වය රු. 2.05 ක් ද වශයෙන් මුළු වියදම රු. මිලි. 4.10කි. අවම අපේක්ෂිත අස්වැන්න මත බීජ අවශ්‍යතාවය සපුරා ගැනීමට අපේක්ෂිත බිම් ප්‍රමාණය අක්. 3000 කි.

- වී වගාවේ පෝෂක කළමණාකරණයේ දී පත්‍ර වර්ණ සටහන් භාවිතයේ වැදගත්කම හා නිවැරදිව භාවිතා කරන ආකාරය පිළිබඳව ගොවීන් දැනුවත් කිරීම සහ වී වගාවේ පෝෂක කළමනාකරණයේ දී පත්‍ර වර්ණ සටහන භාවිතයට ගොවීන් යොමු කිරීම සඳහා පත්‍රවර්ණ සටහන් 120 ක් ගොවි සංවිධාන වෙත ලබා දීම සහ දත්ත සටහන් කර ගැනීමට ආදාල ආකෘති පත්‍ර ලබා දීම. මෙම වැඩසටහන තිරසරව පවත්වාගෙන යාම සඳහා අදාල බලප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශක යොමු කිරිමට කටයුතු කිරීම.

- ක්ෂුද්‍ර ජල සම්පාදනය පිළිබඳව ගොවි සංවිධාන සාමාජිකයින් 150 දෙනෙකුට පුලියන්කුලම යාන්ත්‍රීකරණ පුහුණු මධ්‍යස්ථානයේදී ද පලතුරු ශාක කප්පාදුව පිළිබඳව ගොවි සංවිධාන සාමාජිකයින් 175 දෙනෙකුට අඟුණකොලපැලැස්ස තෙල් හා මාෂබෝග පුහුණු ආයතනයේදී ද පුහුණුව ලබාදීම.

- ඒකාබද්ධ හා සහභාගීත්ව කළමනාකරණ වැඩ සටහන (ඉන්මාස්) ක්‍රියාත්මක කරනු ලබන මහා වාරිමාර්ග බල ප්‍රදේශයන්හි තරුණ ප්‍රජාව නවීන කෘෂි කර්මාන්තයට නැඹුරු කරගැනීම සහ දේශගුණික විපර්යාස නිසා කෘෂි කර්මාන්තයට වන බලපෑම අවම කර ගනිමින් කෘෂි නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීමට ආරක්ෂිත ගෘහ තුළ වගාව ප්‍රචලිත කිරීමේ අරමුණින් 50% දායකත්වය යටතේ ආරක්ෂිත ගෘහ ඉදි කිරීමට විධිමත්ව තෝරා ගන්නා ලද ගොවි සංවිධාන සාමාජිකයින් 29 දෙනෙකුට අවස්ථාව සලසා දීම. මෙම වැඩසටහන සඳහා රජයේ දායකත්වය රු. මිලියන 14.5ක් වන අතර සම්පූර්ණ වටිනාකම රු. මිලියන 29 කි.

- මහකනදරාව ව්‍යාපාරයේ මී මැසි ගම්මානයක් ඇති කිරිම උදෙසා ගෙවතු 10ක මීමැසි පාලන ජනපද 28 ක් ස්ථාපිත කිරීමත් එය තවදුරටත් ව්‍යාප්ත කිරිම සඳහා 2024.12.16 දින තවත් ගොවි සංවිධාන සාමාජිකයින් 30 දෙනෙකු දැනුවත් කර මීමැසි ජනපද 90 ක් ලබා දීමට කටයුතු කිරීමත් සිදුකරන ලදී. මෙහිදී මීමැසි පාලනයට අවශ්‍ය උපාංග සහ උපකරණ නොමිලේ ලබා දෙන ලදී. මෙමගින් මහකනදරාව ව්‍යාපාරයේ ගොවි පවුල් වල ජීවන තත්ත්වය උසස් කිරීම සහ විවිධ ආදායම් මාර්ග ඇති කිරීමට අවස්ථාව උදා කිරීම අරමුණු කෙරේ.

- 2024 යල කන්නයේ වාරි ඉඩම් හෙක්ටයාර් 12,904 ක සහ 2023/24 මහ කන්නයේ වාරි ඉඩම් හෙක්ටයාර් 4,623 ක වෙනත් ආහාරබෝග වගාව සඳහා පහසුකරණය හා මඟපෙන්වීම කිරීම (බඩඉරිඟු, කුරක්කන්, උඳු , කව්පි, තල, මිරිස්, ග'කින්)

- ගොඩ ඉඩම් සංවර්ධනය යටතේ TJC අඹ පැල 4,700 ක් ද, දොඩම් පැළ 9,615 ක් ද, පොල් පැල 12, 278 ක් ද , ගම්මිරිස් පැළ 6,000 ක් ද, සිටුවීම සඳහා පහසුකරණය කිරීම.

- කාර්යක්ෂම ජල කළමනාකරණයක් සඳහා කෙත් ඇළ මට්ටමින් ජල පාලන කාල සටහන් 6,643ක් ද බෙදුම් ඇල මට්ටමින් ජල පාලන කාල සටහන් 2,684 ක් ද, ජල පාලන කමිටු රැස්වීම් 1,009 ක් ද පැවැත්වීම.

- ගොවි සංවිධාන අරමුදල්වලින් ප්‍රතිලාභීන් 5,295 දෙනෙකුට රුපියල් මිලියන 180 ක වගා ණය ලබා දීම සහ ප්‍රතිලාභින් 140 දෙනෙකුට රු. මිලියන 15 ක් ව්‍යාපෘති ණය ලබා දීම (රිදීබැඳි ඇළ, හක්වටුනා ඔය, මී ඔය/ උස්ගල, තබ්බෝව, රාජාංගනය, පදවිය, යාන් ඔය වම් ඉවුර, මහකනදරාව, නාච්චාදූව, නුවර වැව, වාහල්කඩ, කවුඩුලු වැව, ගිරිතලේ, දේවහුව, දම්බරාව, මුතුකණ්ඩිය, කිරිදි ඔය, දමන ව්‍යාපාර)

- ලෝක පරිසර දිනය සහ ලෝක ජල දිනය තේමා කර ගනිමින් වාරිමාර්ග රක්ෂිතවල පිළිවෙලින් වන පැළ 7,880 ක් සහ 6,700ක් ගොවි සංවිධානවල දායකත්වය ඇතුව රෝපණය කිරීම සහ වාරි රක්ෂිතවල ජීව වැටි දැමීම යටතේ පුවක් පැල 1,400 ක් සිටුවීම සඳහා පහසුකරණය කිරීම.

- ගොවීන්ගේ හා ගොවි සංවිධාන නිළධාරීන්ගේ දැනුම, කුසලතාව, වර්ධනය කිරීම සහ නීරෝගිමත්ව ජීවත්වීම සඳහා විවිධ විෂයන් යටතේ හදුනාගත් පුහුණු වැඩසටහන් 112ක් පැවැත්වීම හා පුද්ගලයින් 4,400 ක් දැනුවත් කිරීම

- නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාල මට්ටමින් ලැබුනු මහජන දුක්ගැනවිලි 3,623 ක් සඳහා විසඳුම් ලබා දීම .

- නිලධාරින්ගේ හැකියා වර්ධනය සඳහා විවිධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- වාරිපුබුදුව ව්‍යාපෘතිය යටතේ වාරිපුබුදුව ආදායම් උත්පාදන ණය වැඩසටහන යටතේ ප්‍රතිලාභීන්ට සහන පොලි අනුපාතයක් යටතේ ව්‍යාපෘති ණය ලබාදීමට වයඹ සංවර්ධන බැංකුවට සහ රජරට සංවර්ධන බැංකුවට ව්‍යාපෘති අරමුදලින් රු.මිලි. 82ක් ලබා දී ඇත. එම මුදල් චක්‍රීය ණය වැඩසටහන යටතේ ආදායම් උත්පාදන කටයුතු සඳහා යොදවා ගැනීමට අවශ්‍ය සම්බන්ධීකරණය හා පහසුකරණය කර ඇත.

**වැය ශීර්ෂය 198-2-3-0-2509**

- ❖ අනුමත වූ ප්‍රතිපාදන - රු. මිලි. 27.00
- ❖ 2024.12.31 දක්වා වියදම - රු. මිලි. 23.00

# 2025 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන්වල ඉලක්ක

**1. ගොවි සංවිධාන පිහිටුවීම, ශක්තිමත් කිරීම, යහපාලනය තහවුරු කිරීම හා සක්‍රිය මට්ටමින් පවත්වාගෙන යාම**

ගොවි සංවිධාන 874ක ගිණුම් කටයුතු සම්බන්ධයෙන් අවශ්‍ය සහය ලබාදීම, ගොවි සංවිධාන 335ක නිලවරණ පැවැත්වීම, ගොවි සංවිධාන මහා සභා රැස්වීම් 1,748ක් පැවැත්වීම, ගොවි සංවිධාන මාසික කමිටු රැස්වීම් 10,488ක් පැවැත්වීම, ගොවි සංවිධාන 874ක ව්‍යවස්ථාව සංශෝධනය කිරීම, ගොවි සංවිධාන 874ක සම්මත කාර්ය පරිපාටි හඳුන්වාදීම හා ඒවා භාවිතය තහවුරු කිරීම සහ අරමුදල් වර්ධනය, විෂය පදනම් කරගත් අනු කමිටු 40ක් පිහිටුවීම හා පවත්වාගෙන යාම සහ ගොවි සංවිධාන 60ක් ගොවිජන සංවර්ධන පනත යටතේ ලියාපදිංචි කිරීම

**2. වාරිමාර්ග කළමනාකරණය**

මේ යටතේ ව්‍යාපෘති කළමනාකරණ කමිටු රැස්වීම් 490ක්, පෙරකන්න රැස්වීම් 104ක් සහ කන්න රැස්වීම් 196ක් පැවැත්වීමට සැලසුම් කර ඇත.

**3. සහභාගීත්ව නඩත්තු හා ජල කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම**

ඒ සඳහා ගොවි සංවිධාන නිලධාරීන් සහ ගොවි සංවිධාන සාමාජිකයින් 7,800ක ගේ හැකියා වර්ධනය කිරීම .

මෙම අංශයේ මෙහෙයවීම, මගපෙන්වීම හා පහසුකරණය යටතේ වාරිමාර්ග උප පද්ධතියේ (බෙදුම් ඇළ හා කෙත් ඇළ) නඩත්තු කටයුතු වෙනුවෙන් බෙදුම් ඇළ, කෙත් ඇළ හා කෘෂි මාර්ග වල තණකොළ මට්ටමකට කැපීම, වාරි මාර්ග නිර්මිත හා උපාංග නඩත්තුව, කෘෂි මං මාවත් නඩත්තුව, දියබස්නා ඇළවල නඩත්තුව, ශ්‍රමදාන පැවැත්වීම (කැලෑ කැපීම , රොන් මඩ ඉවත් කිරීම් හා වෙනත් කටයුතු) 2025 වසර තුළ ද ක්‍රියාත්මක කෙරේ.

එසේම වාරිමාර්ග උප පද්ධතියේ සහභාගිත්ව නඩත්තු හා ජල කළමනාකරණ වැඩ සටහන් ප්‍රවර්ධනය සඳහා පහත වැඩ සටහන් සැලසුම් කර ඇත.

| ක්‍රියාකාරකම | ඒකකය | ඉලක්කය |
|---|---|---|
| ගොවි සංවිධාන මට්ටමින් නිරන්තර නඩත්තු සැලසුම් සැකසීම | සංඛ්‍යාව | 413 |
| ගොවි සංවිධාන මට්ටමින් නිරන්තර නඩත්තු සැලසුම් යථාවත් කිරීම | සංඛ්‍යාව | 499 |
| රක්ෂිත මායිම් සලකුණු කිරීම හා ආරක්ෂා කිරීම | කි.මීටර් | 1,576 |
| මෙහෙයුම් හා නඩත්තු අරමුදල් වර්ධනය කිරීම | රුපි.000 | 175,359 |
| දැන්වීම් පුවරු සවිකිරීම | සංඛ්‍යාව | 800 |
| ජලය ආශ්‍රිත පූජා කර්ම / චාරිත්‍ර වාරිත්‍ර පැවැත්වීම හා ප්‍රවර්ධනය | සංඛ්‍යාව | 653 |

## 4. කෘෂි නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායීතාව ඉහළ නැංවීම

- මෙම අංශයේ සම්බන්ධීකරණය, මෙහෙයවීම හා පහසුකරණය යටතේ ඒකාබද්ධ මහා වාරිමාර්ග කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලද මහා වාරිමාර්ග ව්‍යාපාර 54 හි වගා බිම් හෙක්ටයාර් 166,000 ක කෘෂිකාර්මික නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායීතාවය වර්ධනය සඳහා සැලසුම් කර ඇත.

- ගොවි සංවිධාන සාමාජිකයින් 29 දෙනෙකු සම්බන්ධ කර ගනිමින් ආරක්ෂිත ගෘහ තුළ වගාව ප්‍රචලිත කිරීම සඳහා 2024 වර්ෂයේ දී ආරම්භ කරන ලද වැඩසටහන ඵලදායී හා තිරසරව පවත්වාගෙන යාම උදෙසා තවදුරටත් පසුවිපරම් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සහ 2025 වර්ෂය තුළ වර්ග අඩි 2000 ආරක්ෂිත ගෘහ 50 ලබා දීම.

- මහකනදරාව ව්‍යාපාරයේ ආරම්භ කරන ලද මීමැසි පාලන වැඩසටහන පසු විපරම හා මීමැසි ගම්මානයක් දක්වා වර්ධනය කිරීම

- මිනිපෙ ව්‍යාපාරයේ මල්ගම්මන වැව යටතේ අක්කර 25 ක ලොකු ලූණු වගාව ව්‍යාප්ත කිරීම සඳහා 50% දායකත්වය යටතේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම

- කෘෂිකර්මාන්තය සඳහා ඇති නව තාක්ෂණික දැනුම ගොවින් වෙත ලබාදීම සඳහා වැඩසටහන් 100 ක් සංවිධානය කිරීම

- බෝග වගාවේ මහා පළිබෝධ උවදුරු පාලනය සඳහා නව නිපැයුම් හා නිර්මාණ සොයා ගැනීම සඳහා ගොවි සංවිධාන මට්ටමින් තරඟයක් පැවැත්වීම

- ගොවි කාන්තාවන් 200 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව දැනුම ලබා දී ව්‍යවසායකයින් බවට පත් කිරීම

- ඩ්‍රෝන තාක්ෂණය ගොවින් අතර ප්‍රචලිත කිරීම සඳහා නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාල 37 තුළ තුළ ඩ්‍රෝන සංචිතයක් ස්ථාපිත කිරීමට සම්බන්ධීකරණය කිරීම

- රිදියගම ව්‍යාපාරයේ බැරගම්විල සම්බන්ධ කර ගනිමින් සූර්ය බලශක්තිය යටතේ ජල පහසුකම් ලබාගෙන ගොඩ ඉඩම් අක්කර 100 ක පලතුරු ගම්මානයක් ඇති කිරීමට සැලසුම් කිරීම

- ලියදි විශාල කිරීම සඳහා විභවතාවක් පවතින වාරිමාර්ග බලප්‍රදේශ හඳුනාගෙන ලියදි විශාල කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීම

# ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB)

**පිහිටුවන ලද වර්ෂය** - **1973**

**මූලික ව්‍යාපාර** - **ඉංජිනේරු සහ වාස්තු විද්‍යාත්මක උපදේශන සේවා**

**කලාපීය සහ ව්‍යාපෘති කාර්යාල**

- **කලාපීය කාර්යාල** - **12**
- **ව්‍යාපෘති කාර්යාල** - **30**



## දැක්ම

**ලෝක තත්ත්වයේ ඉංජිනේරු ආයතනයක් වීම**

## මෙහෙවර



**මනුෂ්‍ය වර්ගයාගේ ප්‍රශස්ත ශුභ සිද්ධිය සඳහා සම්පත් උපරිම අයුරින් පරිහරණය කිරීම උදෙසා දක්වන ලද දායකත්වය වෙනුවෙන් අගයනු ලැබූ, ඉහළ අභිප්‍රේරණයක් සහිත පුහුණු හා දක්ෂ ශ්‍රම බලකායක් සමඟින් නූතන තාක්ෂණ විධික්‍රම යොදා ගනිමින් ඉංජිනේරුමය කාර්යයන්හි, ගෘහ නිර්මාණ සහ ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයේ විශිෂ්ටත්වය අත්පත් කර ගනිමින් ලෝක මට්ටමේ ඉංජිනේරුමය ආයතනයක් කරා ගමන් කිරීම**

**ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ ප්‍රධාන අංශ**

- **CECB සමූහය**
  - **CECB**
    - ඉදිකිරීම් අංශය
    - උපදේශන අංශය
  - **CESL (Subsidiary)**

## ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) හි මූලික

**ව්‍යාපාර හා ඉංජිනේරු සේවා අංශ**

- ජල විදුලිය සහ බලශක්තිය
- බලශක්ති සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම
- වාරිමාර්ග හා ජල සම්පත් සංවර්ධනය
- ගොඩනැගිලි සහ නාගරික යටිතල පහසුකම්
- මහාමාර්ග, දුම්රිය මාර්ග සහ පාලම්
- ගුවන් තොටුපළ සංවර්ධනය
- වරාය/ වෙරළ සහ සමුද්‍ර කටයුතු
- විදුලි හා යාන්ත්‍රික වැඩ
- ජල සම්පාදන, මලාපවහන සහ ජලාපවහන
- තොරතුරු තාක්ෂණය (IT)
- ශක්‍යතා සහ පාරිසරික අධ්‍යයනය සහ ආපදා අවදානම් කළමනාකරණය
- තාක්ෂණික විගණනය / බලශක්ති විගණනය / වෙළි ආරක්ෂාව
- භූ-තාක්ෂණික විමර්ශනය, සමීක්ෂණය හා රසායනාගාර සේවා

## ප්‍රගතිය 2024

| | උපදේශන සේවා ව්‍යාපෘති - 2024 | ඇස්තමේන්තුගත මුදල රු. මිලියන | 2024.12.31 දිනට අපගේ සේවා සැපයීමේ ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 1 | අකුරේගොඩ ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය (DHQC). | 63,711 | 90% |
| 2 | කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය - යටිතල පහසුකම් සහ භූමි නිර්මාණ | 223,870 | 80.9% |
| 3 | වරාය අධිකාරිය සඳහා යෝජිත වැඩ පොළ සංකීර්ණය | 1,090 | 96% |
| 4 | නාවික ජැටිය නිර්මාණය සහ ඉදිකිරීම - ත්‍රිකුණාමලය | 3090.7 | 55% |
| 5 | මහව සිට ඕමන්ත දක්වා දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීම | 16,256 | 79% |
| 6 | හෘද සැත්කම් සංකීර්ණය ඉදිකිරීම , ළමා රෝහල , බොරැල්ල | 2,631 | 72% |
| 7 | ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාල ශ්‍රවණාගාරය ඉතිරි ඉදිකිරීම් කටයුතු වලට අදාළ නිර්මාණ සැලසුම්, උපදේශනය සහ අධීක්ෂණය | 3300 | 81% |
| 8 | කොළඹ 12 මහේස්ත්‍රාත් අධිකරණ සංකීර්ණයේ ඉදිකිරීම් සහ දෝෂ නිවැරදි කිරීම | 1899 | 97 % |
| 9 | අධිකරණ සංකීර්ණය ඉදිකිරීම - ගාල්ල (අදියර II) | 900 | 76.5% |
| 10 | තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය | 26,333 | 25.04% |
| 11 | කළුතර රයිගම කාර්මික කලාපය පිහිටුවීම, රයිගම | 224.33 | 15 % |

| | උපදේශන සේවා ව්‍යාපෘති - 2024 | ඇස්තමේන්තුගත මුදල රු. මිලියන | 2024.12.31 දිනට අපගේ සේවා සැපයීමේ ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 12 | කෑගල්ල බස් ඩිපෝව ඉදිකිරීම අදියර 3 - කෑගල්ල | 290 | 96% |
| 13 | වරාය අධිකාරිය සඳහා යෝජිත සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථානය | 4999 | 96% |
| 14 | කොළඹ මහනගර ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය නිර්මාණය සමාලෝචනය, අනුමත කිරීම හා අධීක්ෂණය සඳහා උපදේශන සේවා, අරුවක්කාරු | 110.10 | 91% |
| 15 | යෝජිත මධ්‍යම වෙළඳපල ගොඩනැගීමේ අදියර -III, නුවරඑළිය | 212.96 | 95% |

| | ඉදිකිරීම් අංශයේ ව්‍යාපෘති - 2024 | ඇස්තමේන්තුගත මුදල රු. මිලියන | 2024.12.31 අපගේ සේවා සැපයීමේ ප්‍රගතිය % |
|---|---|---|---|
| 1 | තාක්ෂණ විෂය ධාරාව සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සහ ගුරු පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම – KOICA ව්‍යාපෘතිය, නාරංගල්ල, කුලියාපිටිය | 2,431.82 | 82.80% |
| 2 | ශ්‍රේෂ්ඨාධිකරණ සංකීර්ණය ප්‍රතිසංස්කරණය කිරීම, කොළඹ 12 | 1,144.77 | 86.76% |
| 3 | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සහ මධ්‍යම වායු සිසිලනය, ගිනි ආරක්ෂණ සහ උසස් ආරක්ෂක පද්ධති ස්ථාපනය කිරීම | 861.78 | 50.87% |
| 4 | විශේෂිත මාතෘ මධ්‍යස්ථානය ඉදිකිරීම, ද සොයිසා කාන්තා රෝහල, කොළඹ | 217.2 | 99% |
| 5 | බණ්ඩාරවෙල, කිනිගම ක්‍රීඩා පිටියේ ඌව පළාත් ගෘහස්ත ක්‍රීඩාංගනය ඉදිකිරීම. | 229.93 | 95.63% |
| 6 | රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහල් දොළහක ගොඩනැගිලි සංකීර්ණය සැලසුම් කිරීම, ඉදිකිරීම, අධීක්ෂණය, පැවරීම, නිම කිරීම සහ නඩත්තු කිරීම. | 1,091.57 | 55.77% |
| 7 | හදිසි අනතුරු සහ හදිසි සත්කාර ඒකකය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම දිස්ත්‍රික් මහ රෝහල, අම්පාර | 759.25 | 42% |
| 8 | රේඛීය ඇක්සලරේටර් - මහා රෝහල බදුල්ල. | 162.41 | 90% |
| 9 | හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම - II අදියර, යාපනය | 1,224 | 92.65% |

| | ඉදිකිරීම් අංශයේ ව්‍යාපෘති - 2024 | ඇස්තමේන්තුගත මුදල රු. මිලියන | 2024.12.31 අපගේ සේවා සැපයීමේ ප්‍රගතිය % |
|---|---|---|---|
| 10 | බණ්ඩාරවෙල, දියතලාව, හපුතලේ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය. | 530.04 | 90% |
| 11 | යෝජිත පිළිකා ප්‍රතිකාර මධ්‍යස්ථානයේ ශේෂ වැඩ සැලසුම් කිරීම සහ ඉදිකිරීම, මහනුවර ශික්ෂණ රෝහල (අදියර 2) | 1,691.15 | 52% |



## අභියෝග

- ස්වයං මූල්‍ය ආයතනයක් ලෙස, රාජ්‍ය ආයතනවලින් නොගෙවන ණය හේතුවෙන් සංවිධානය පවත්වාගෙන යාම ඉතා අපහසුය.
  - දිගුකාලීන ණය ගැතියන් රු. මිලියන 4,727.23

- CECB බොහෝ දුරට රජයේ ව්‍යාපෘති මත රඳා පවතින අතර තරඟකාරී ලංසු තැබීමේ ව්‍යාපෘති සඳහා ද දේශීය හා ජාත්‍යන්තර වශයෙන් යොමු වී පවතී. දැනට ක්‍රියාත්මක රජයේ සමහර ව්‍යාපෘති මූල්‍යමය ගැටළු හේතුවෙන් අත්හිටුවා ඇත.

  එබැවින් CESL සහ CECB සඳහා මසකට රු. මිලි. 300ක සාමාන්‍ය පුනරාවර්තන වියදම් සපුරාලීම ගැටළුවක්ව පවතී.

- 1957 අංක 49 දරන ශ්‍රී ලංකා කාර්මික සංස්ථා පනත යටතේ 1973 අප්‍රියෙල් 10 වන දින CECB පිහිටුවන ලදී. 1995 අගෝස්තු මාසයේදී සංවිධානයේ විවිධාංගීකරණය හා පුළුල් කිරීමේ අරමුණින්, කාර්යාංශය සංස්ථාගත කිරීමේ නියෝගය ගැසට් නිවේදනයක් හරහා සංශෝධනය කරන ලද අතර, CECB හට නිර්මාණ ආකාරයේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට ඉඩ ලබා දෙන ලදී.

  එබැවින්, රජයේ පනත තුළ **CECB** විෂය පථය සීමිත වන අතර රජයේ පනතෙන් ඔබ්බට ව්‍යාපාරය පුළුල් කිරීමට කිසිදු හැකියාවක් නොමැත.

- පළපුරුදු තාක්ෂණික කාර්ය මණ්ඩලයේ හිඟය. මූල්‍ය අර්බුදය හේතුවෙන් සැලකිය යුතු පළපුරුදු ඉංජිනේරුවන් සහ අදාළ විශේෂඥයින් **CECB** ආයතනයෙන් ඉවත් වෙමින් සිටිති.

- **CECB** දැන් ජාත්‍යන්තර වෙළඳපොළට ඇතුළු වීමට උත්සාහ කරයි. නමුත් රජයේ සමහර සීමාවන් නිසා ජාත්‍යන්තර වෙළඳපොළට ඇතුළු වීමට යම් යම් දුෂ්කරතා තිබේ.
- මූල්‍ය අර්බුදය හේතුවෙන්, රජය විසින් රජයේ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා රජයේ අරමුදල් වෙන් නොකිරීම.

## 2025 වර්ෂය සඳහා වූ වැඩසටහන

- ඉහත ලැයිස්තුගත කර ඇති බොහෝ ව්‍යාපෘති 2025 වර්ෂයේදී දිගටම කරගෙන යනු ඇත
- CECB ආයතනය විදේශයන්හි ව්‍යාපෘති ලබා ගැනීමේ ක්‍රියාවලියක නිරතව සිටියි.
- 2023 සිට CECB ලෝක බැංකුව සහ ADB අරමුදල් සපයන ව්‍යාපෘති යටතේ ඇන්ගෝලාව, බංග්ලාදේශය, කාම්බෝජය, නැගෙනහිර සහ දකුණු අප්‍රිකාව, ඉතියෝපියාව, ෆීජී, ගැම්බියාව, ඝානාව, නේපාලය, ඉන්දියාව, ඉන්දුනීසියාව, කෙන්යාව, කිරිබාති, ලයිබීරියාව, මලාවි, මාලදිවයින, මයික්‍රොනීසියාව, නයිජීරියාව, පකිස්ථානය, සෝමාලියාව, දකුණු සුඩානය, ටජිකිස්තානය, ටැන්සානියාව, ටිමෝරය-ලෙස්ටේ, තුර්කිය, උගන්ඩාව, උස්බෙකිස්තානය සහ සැම්බියාව සඳහා EOI 250 කට වඩා ඉදිරිපත් කර ඇති අතර, මෑතකදී ඇගයීම යටතේ EOI 50කට වඩා ඉදිරිපත් කර ඇත. ඉදිරිපත් කරන ලද EOI වලින් RFP ඉදිරිපත් කිරීමට EOIs 10ක් කෙටි ලැයිස්තුගත කර ඇත.
- කෙටි ලැයිස්තුගත RFPs 25 කට වඩා ඉදිරිපත් කර ඇති අතර, මෑතකදී 10 ක් ඇගයීමට ලක් වෙමින් පවතී. මෙම ක්‍රියාවලිය 2024 වර්ෂයේ දී පුළුල් කර අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ.
- ජාත්‍යන්තර පාර්ශවයන් සමඟ අවබෝධතා ගිවිසුම් 16 ක් අත්සන් කර ඇති අතර 14 වන අවබෝධතා ගිවිසුම් හවුල්කරු හරහා දකුණු මාරා ගඟේ කුඩා ජල විදුලි බලාගාරයක් ඉදිකිරීමට යෝජිතය. මෙම ක්‍රියාවලිය 2025 වර්ෂයේ දී පුළුල් කර අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබේ
- විදේශීය උපදේශන සමාගම්වලට උපදේශන විශේෂඥයින් බඳවා ගැනීම හරහා විදේශ විනිමය ඉපැයීම්.
  උදා: මාලදිවයිනේ බොලිදූෆාරු කලපුවේ නිවාඩු නිකේතන සංවර්ධනය.
- කොළඹ වරායේ බටහිර පර්යන්ත පුළුල් කිරීමේ ව්‍යාපෘතිය 2025 මාර්තු මාසයෙන් පසු ආරම්භ කිරීමට නියමිතය. ආසියානු සංවර්ධන බැංකුවේ සාකච්ඡා අවසන් වී ඇති අතර CECB යනු මෙහි එක් දේශීය හවුල්කරුවෙකු වේ.

# මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්) සමාගම



## දැක්ම

පාරිසරික තිරසාරභාවයට ප්‍රමුඛත්වය දෙමින් ඉදිකිරීම් කර්මාන්තය සඳහා අද්විතීය මාදිලියක් වීම.

## මෙහෙවර



ප්‍රමාණවත් ලෙස ඇගයීමට ලක් වූ ඉහළ පෙළඹවීමක් ඇති, පුහුණු කාර්ය මණ්ඩලයක් සහ නව තාක්ෂණයන්, ක්‍රියාවලි නවෝත්පාදනයන් සමඟ ඉදිකිරීම් කර්මාන්තයේ විශිෂ්ටත්වය අත්කර ගැනීම.

## අරමුණු



i. ගෝලීයකරණය වූ ඉදිකිරීම් කර්මාන්තයට මුහුණ දීම සඳහා සමාගම පුරා නවීන, ඵලදායී සහ කාර්යක්ෂම කළමනාකරණ සංස්කෘතියක් සාක්ෂාත් කර ගැනීම
ii. කර්මාන්තයේ තරඟකාරී පාර්ශවයක් වීම සඳහා සියලුම ක්‍රියාවලීන්හි ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම
iii. ඉදිකිරීම් කර්මාන්තයේ CESL වෙළඳපල කොටස 1% කින් වැඩි කිරීම
iv. ව්‍යාපාර නවෝත්පාදනය සහ ව්‍යාපාර විවිධාංගීකරණය තුළින් සමාගමේ ස්ථාවරත්වය සහ ශක්‍යතා වර්ධනය සහතික කිරීම
v. රටේ වත්මන් ආර්ථික සන්දර්භය තුළ තිරසාරභාවය සඳහා සියලුම විශිෂ්ටත්වයේ මධ්‍යස්ථාන (COE) මූල්‍ය ස්ථාවරත්වය සහ සමාගමේ ආයෝජන හැකියාවන් සහතික කිරීම
vi. තිරසාර ඉදිකිරීම් භාවිතයන්හි ප්‍රමුඛයෙකු වීම හා රජයේ නිලධාරීන් සහ මහජනතාව අතර සමාගමේ සන්නාම ප්‍රතිරූපය වැඩිදියුණු කිරීම
vii. කාර්ය මණ්ඩලයට වෘත්තීය අවංකභාවය සහතික කිරීම



## ප්‍රධාන කාර්යයන්

- ඉංජිනේරු සේවා සඳහා එකම එක විසඳුමක්

## ප්‍රගතිය 2024

| අංක | ව්‍යාපෘති නාමය | සංශෝධිත කොන්ත්‍රාත් මුදල (රු. මිලියන) + වැට් බද්ද | ප්‍රගතිය |
|---|---|---|---|
| 1 | සෞඛ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 5,733.43 | 65.3% |
| 2 | කොළඹ 12 මහේස්ත්‍රාත් අධිකරණ සංකීර්ණයේ සැලසුම්, ඉදිකිරීම් සහ අලුත්වැඩියා කිරීම | 3,462.51 | 97.4% |
| 3 | කරාපිටිය ශික්ෂණ රෝහලේ විශේෂිත ළමා රෝග ඒකකයක් ඉදිකිරීම | 3,072.98 | 11.1% |
| 4 | නාරංගොල්ල ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සහ තාක්ෂණ විෂය ධාරාව සඳහා ගුරු පුහුණු මධ්‍යස්ථානය - KOICA විෂය පථය | 2,793.33 | 63.5% |
| 5 | බදුල්ල, පළාත් මහ රෝහලේ දස මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 2,764.88 | 22.0% |
| 6 | යෝජිත පිළිකා ප්‍රතිකාර මධ්‍යස්ථානය ඉදිකිරීම - අදියර II, මහ රෝහල (ශික්ෂණ) - මහනුවර | 2,684.48 | 32.7% |
| 7 | වයඹ විශ්වවිද්‍යාල නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ කුලියාපිටිය පරිශ්‍රයේ යෝජිත ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම | 2,602.08 | 96.2% |
| 8 | කළුතර මහ රෝහලේ වෛද්‍ය වාට්ටු සංකීර්ණය ඉදිකිරීම - දෙවන අදියර | 2,327.73 | 18.7% |
| 9 | කරාපිටිය ශික්ෂණ රෝහලේ මුඛ සෞඛ්‍ය ඒකකයක් ඉදිකිරීම - අදියර 1 | 2,238.01 | 15.2% |
| 10 | රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහලේ නව දස මහල් මහාචාර්ය වාට්ටු සංකීර්ණය සැලසුම් කිරීම, ඉදිකිරීම, අධීක්ෂණය, ක්‍රියාත්මක කිරීම, නිම කිරීම සහ නඩත්තු කිරීම | 2,237.15 | 50.7% |
| 11 | මහනුවර ශික්ෂණ රෝහලේ ඇටමිදුළු බද්ධ කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම | 2,086.92 | 36.7% |

| අංක | ව්‍යාපෘති නාමය | සංශෝධිත කොන්ත්‍රාත් මුදල (රු. මිලියන) + වැට් බද්ද | ප්‍රගතිය |
|---|---|---|---|
| 12 | යාපනයේ යෝජිත නගර ශාලාව ඉදිකිරීම | 1,660.15 | 94.6% |
| 13 | ජාතික ලේඛනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සහ මධ්‍යම වායු සිසිලනය, ගිනි ආරක්ෂණ සහ උසස් ආරක්ෂක පද්ධති ස්ථාපනය කිරීම - අදියර II | 1,330.00 | 38.7% |
| 14 | යාපනයේ හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම - (අදියර II) ශික්ෂණ ඒකකය | 1,224.64 | 87.4% |
| 15 | යෝජිත හෘද රෝග සත්කාර සංකීර්ණය ඉදිකිරීම - ශික්ෂණ රෝහල, රත්නපුර | 1,073.15 | 10.4% |
| 16 | රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා දොළොස් මහල් ගොඩනැගිලි සංකීර්ණය සැලසුම් කිරීම, ඉදිකිරීම, අධීක්ෂණය, ක්‍රියාත්මක කිරීම, නිම කිරීම සහ නඩත්තු කිරීම - ගාල්ල, කරාපිටිය | 1,065.29 | 71.5% |
| 17 | කොළඹ 12 ශ්‍රේෂ්ඨාධිකරණ සංකීර්ණය ප්‍රතිසංස්කරණය කිරීම | 1,019.44 | 80.0% |
| 18 | නාරංගල්ල - ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සහ තාක්ෂණ විෂය ධාරාව සඳහා ගුරු පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම - අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථය | 988.85 | 52.7% |
| 19 | රත්මලාන KDU හි කළමනාකරණ, සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර පීඨයේ (FMSH) යෝජිත ගොඩනැගිල්ලේ සැලසුම් සහ ඉදිකිරීම් වැඩ කටයුතු | 850.41 | 96.5% |
| 20 | යෝජිත ලුනාව ප්‍රාදේශීය රෝහලේ පවුල් වෛද්‍ය සහ අතරමැදි සත්කාර ඒකකය | 849.60 | 27.0% |
| 21 | අනුරාධපුර හෙද පුහුණු පාසලේ අධ්‍යයන පරිපාලන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතුවල ඉතිරි වැඩ කටයුතු | 769.68 | 1.7% |
| 22 | කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ නීති පීඨ (FoL) ගොඩනැගිල්ල සැලසුම් කිරීම සහ ඉදිකිරීම | 747.48 | 95.5% |
| 23 | කරාපිටිය ශික්ෂණ රෝහලේ යෝජිත වකුගඩු රෝග, රුධිර කාන්දුකරණ සහ බද්ධ කිරීමේ ඒකකය ඉදිකිරීම | 713.57 | 100.0% |
| 24 | කරාපිටිය රෝහලේ ශල්‍ය / වෛද්‍ය වාට්ටුව සඳහා එකතු කිරීම් | 698.86 | 28.0% |

| අංක | ව්‍යාපෘති නාමය | සංශෝධිත කොන්ත්‍රාත් මුදල (රු. මිලියන) + වැට් බද්ද | ප්‍රගතිය |
|---|---|---|---|
| 25 | අනුරාධපුර වෛද්‍ය පුහුණු පාසලේ අධ්‍යයන හා පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම (මහල් 6) | 692.71 | 25.4% |
| 26 | අනුරාධපුර ශික්ෂණ රෝහලේ රේඛීය ත්වරණ කාමරය සහ විකිරණ චිකිත්සක අංශ ඉදිකිරීම සඳහා ඉතිරි වැඩ කටයුතු (අදියර - II) | 632.76 | 1.4% |
| 27 | මොනරාගල දිස්ත්‍රික් මහ රෝහලේ ශල්‍ය වාට්ටු සහ ශල්‍යාගාර සංකීර්ණය ඉදිකිරීම | 629.15 | 26.1% |
| 28 | අම්පාර දිස්ත්‍රික් මහ රෝහලේ හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 584.96 | 50.7% |

## වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනය කොත්මලේ (KITI)

කොත්මලේ වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනය වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය යටතේ 2012 වර්ෂයේදී ස්ථාපනය කර වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අවශ්‍ය කරන ඉංජිනේරු සහකාරවරුන් සඳහා තුන් අවුරුදු වාරි තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව පවත්වනු ලබයි.

මීට අමතරව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයාගේ 2017.07.17 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව දේශීය හා ජාත්‍යන්තර මට්ටමේ නේවාසික පුහුණු පාඨමාලා පැවැත්වීමට පහසුකම් සැලසෙන පරිදි මෙම ආයතනය පවත්වාගෙන යාමට අනුමැතිය ලැබී ඇත.

මේ වන විට තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ නියමන්ට අනුව NVQ 06 මට්ටමේ පූර්ණ කාලීන හා සේවාස්ථ පුහුණු පාඨමාලාවන්ද පවත්වනු ලබයි.

### දැක්ම



**ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ජල කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනය හා කුසලතා සංවර්ධනය සිදුකරන ආයතන අතර ප්‍රමුඛයා වීම**

## මෙහෙවර

රාජ්‍ය හා පෞද්ගලික අංශයන් සඳහා වෙනස්වන තාක්ෂණික හා සමාජීය අවශ්‍යතාවයන්ට සරිලන ලෙස තරුණ ප්‍රජාවගේ දැනුම, පහසුකම් හා කුසලතා ප්‍රවර්ධනය කිරීම



## අරමුණු



**i. වෙනස්වන තාක්ෂණික අධ්‍යාපනයට අවශ්‍ය වෘත්තීය හා දිගුකාලීන අධ්‍යාපනය ලබා දෙන ආයතනයක් ලෙස ක්‍රියාකාරීව දායක වීම.**

- තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ නියමයන්ට අනුව නිතිපතා පුහුණු පාඨමාලා පැවැත්වීම
- වාර්ෂිකව ISO 9001:2008 තත්ත්ව කළමනාකරණ පද්ධති වැඩිදියුණු කිරීම හා යාවත්කාලීන කිරීම
- රටේ පවතින අවශ්‍යතාවයන් සපිරෙන පරිදි සේවාස්ථ පුහුණු පාඨමාලා පැවැත්වීම

**ii. පරිසර හිතකාමී ලෙස අධ්‍යාපනය නවෝත්පාදනයන් සහ නිර්මාණශීලීත්වය වැඩිදියුණු කිරීම සඳහා අවස්ථාවන් ඇති කිරීම**

- සේවාස්ථ පුහුණු පාඨමාලා වැඩි දියුණු කිරීම
- ඉදිරි වසර දෙක තුළ **ISO** 14001:2015 ට අනුව පරිසර තත්ත්ව කළමනාකරණ පද්ධති වැඩිදියුණු කිරීම

**iii. වර්තමානයේ රටේ පවතින කාර්මික, ව්‍යාපාරික හා සාමාජීය අවශ්‍යතාවයන්ට සරිලන පරිදි දායකත්වය ලබා දිය හැකි ලෙස තරුණ ප්‍රජාව සවිබල ගැන්වීම**

- සෑම වසරකම ඉදිකිරීම් හා ඉංජිනේරුමය කුසලතාවන් සංවර්ධනය වන පරිදි සේවාස්ථ පුහුණු පාඨමාලාවන් පැවැත්වීම
- ඉදිරි වර්ෂ 03 තුළ ජල සම්පත් කළමනාකරණයට සමගාමී ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ වැඩමුළු, සමුළු පැවැත්වීම
- පවතින අවශ්‍යතාවයන් සපුරාලීමට රාජ්‍ය හා පෞද්ගලික දෙපාර්ශවයේම සහභාගීත්වය යොදා ගැනීම.
- පුහුණුලාභීන් තුළ වෙළඳපොළ හා සාමාජීය වශයෙන් සුදුසු විනය ගොඩනැගීම.



## ප්‍රධාන කාර්යයන්

i. වාරිමාර්ග අංශයට අවැසි වාරිමාර්ග ඉංජිනේරු සහකාරවරුන් (NVQ 6) බිහිකිරීමට අදාල වාරි තාක්ෂණ ඩිප්ලෝමා පැවැත්වීම සහ අනෙකුත් පාඨමාලා පැවැත්වීම.

ii. රජයේ හා පෞද්ගලික අංශයේ සේවා අවශ්‍යතාවය මත සේවාස්ථ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

**සේවාස්ථ පුහුණු වැඩසටහන්වල ප්‍රගතිය**

| අනු අංකය | වැඩසටහනේ නම | පාඨමාළා කාල සීමාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ආදායම (රු. මිළි.) | රජයේ ආදායම් මුදල (රු. මිළි.) |
|---|---|---|---|---|---|
| 1 | SEI Campus | 2024.02.22/25 | 24 | 0.12 | 0.12 |
| 2 | කොළඹ විශ්වවිද්‍යාලය | 2024.03.26/27 | 123 | 0.13 | 0.10 |
| 3 | මහවැලි නිලධාරීන්ගේ සංසදය - මධ්‍යම පළාත | 2024.03.16 සිට 2024.03.17 දක්වා | 19 | 0.02 | 0.02 |
| 4 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව - අනුරාධපුර | 2024.03.21 සිට 2024.03.23 දක්වා | 64 | 0.66 | 0.66 |
| 5 | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය (AAFAUP) | 2024.03.23 | 35 | 0.01 | 0.01 |
| 6 | දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 2024.04.28 සිට 2024.05.04 දක්වා | 31 | 0.40 | 0.06 |
| 7 | අම්පාර පරාසයේ නියෝජ්‍ය වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය | 2024.05.16 - 2024.05.18 | 16 | 0.16 | 0.03 |
| 8 | ග්‍රීන් ටෙක් කන්සල්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් | 2024.07.10/12 | 54 | 0.45 | 0.24 |
| 9 | වාරිමාර්ග අමාත්‍යාංශය | 2024.08.27 /28 | 52 | 0.24 | 0.09 |
| 10 | උඩපළාත ප්‍රජාශක්ති පදනම | 2024.08.18/19 | 36 | 0.12 | 0.07 |
| 11 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | 2024.09.05- 07 | 55 | 0.18 | 0.07 |
| 12 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය (උණ ගස් දින වැඩසටහන) | 2024.09.25 | 75 | 0.02 | 0.01 |
| 13 | උඩපළාත ප්‍රජාශක්ති පදනම | 2024.8.18/19 | 30 | 0.45 | 0.19 |
| 14 | ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 2024.10.10 සිට 2024.10.11 දක්වා | 120 | 0.24 | 0.11 |

| අනු අංකය | වැඩසටහනේ නම | පාඨමාලා කාල සීමාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ආදායම (රු. මිලි.) | රජයේ ආදායම් මුදල (රු. මිලි.) |
|---|---|---|---|---|---|
| 15 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය (රියදුරන් සඳහා පුහුණු වැඩසටහන - I) | 2024.11.01 සිට 2024.11.03 දක්වා | 90 | 0.49 | 0.17 |
| 16 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය (ගණකාධිකාරී වරුන් සඳහා වැඩසටහන) | 2024.11.25 සිට 2024.11.27 දක්වා | 60 | 0.15 | 0.10 |
| 17 | නියුක්ලස් පදනම | 2024.12.05 | 65 | 0.07 | 0.02 |
| 18 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය (රියදුරන් සඳහා පුහුණු වැඩසටහන - II) | 2024.12.06 සිට 2024.12.08 දක්වා | 106 | 0.57 | 0.19 |
| | එකතුව | | | **4.47** | **2.25** |

**කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන්වල ප්‍රගතිය**

| | සංරචක / ක්‍රියාකාරකම් / පාඨමාලාව | කාලසීමාව | | ප්‍රතිපාදන (රු. මිලි.) | මූල්‍ය ප්‍රගතිය | පුහුණුලාභීන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|
| | | ආරම්භක දිනය | අවසාන වූ දිනය | | | ඉලක්කය | සහභාගිත්වය |
| 1. | උසස් ජාතික ඩිප්ලෝමාව - කොන්ත්‍රාත් තාක්ෂණය (4 වන කණ්ඩායම) | 2020.02.10 | 2024.02.16 | 0.18 | 73.4% | 22 | 21 |
| 2. | උසස් ජාතික ඩිප්ලෝමාව - වාරි තාක්ෂණය (5 වන කණ්ඩායම) | 2021.02.21 | 2025.02.01 | 4.59 | 39.0 | 28 | 26 |
| 3. | උසස් ජාතික ඩිප්ලෝමාව - වාරි තාක්ෂණය (6 වන කණ්ඩායම) | 2023.08.19 | 2026.08.19 | 8.27 | 55.6 | 45 | 39 |
| 4. | උසස් ජාතික ඩිප්ලෝමාව - වාරි තාක්ෂණය (7 වන කණ්ඩායම) | 2024.10.29 | 2027.10.29 | 6.76 | 16.4 | 50 | 22 |

**2025 සඳහා යෝජිත / සැලසුම් කළ වැඩ.**

| | සංරචක/ ක්‍රියාකාරකම්/ පාඨමාලාව | වෙන් කිරීම් (රු. මිලි) | අභ්‍යාසලාභීන් සංඛ්‍යාව - ඉලක්කය |
|---|---|---|---|
| 1 | තොරතුරු තාක්ෂණය උසස් ජාතික ඩිප්ලෝමාව - 5 වන කණ්ඩායම (වාචික පරීක්ෂණය) | 0.07 | 27 |
| 2 | තොරතුරු තාක්ෂණය උසස් ජාතික ඩිප්ලෝමාව - 6 වන කණ්ඩායම 3 වන අධ්‍යයන වාරයේ කොටසක්, 4 වන අධ්‍යයන වාරයේ 1 කොටස | 9.68 | 37 |
| 3 | තොරතුරු තාක්ෂණය උසස් ජාතික ඩිප්ලෝමාව - 2 වන අධ්‍යයන වාරයේ 1 කොටස | 10.3 | 22 |
| 4 | තොරතුරු තාක්ෂණය උසස් ජාතික ඩිප්ලෝමාව - 8 වන කණ්ඩායම බඳවා ගැනීම / සමාරම්භක උත්සවය සහ 1 වන අධ්‍යයන වාරය | 7.55 | 50 |
| 5 | QMS පුහුණුව | 1.89 | 12 |
| 6 | කාර්ය මණ්ඩල පුහුණුව | 0.25 | 25 |

**2025 සඳහා යෝජිත සේවාස්ථ පුහුණු වැඩසටහන්**

| | සංරචක/ ක්‍රියාකාරකම්/ පාඨමාලාව | පාඨමාලා කාලය | සහභාගිත්වය |
|---|---|---|---|
| 1 | මධ්‍ය තාක්ෂණ නිලධාරී උසස් ජාතික ඩිප්ලෝමාව | වසර 1 | 25 |
| 2 | පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | දින 07 | 60 |
| 3 | පරිගණක යෙදුම් සහකාර සඳහා සහතිකය | මාස 03 | 60 |
| 4 | පරිගණක යෙදුම් සහකාර සඳහා සහතිකය (නිපුණතා වැඩිදියුණු කිරීම) | මාස 03 | 50 |
| 5 | වාරිමාර්ග සහ ජල කළමනාකරණය පිළිබඳ සහතිකය (මූලික වෘත්තීය කුසලතා) | මාස 03 | 60 |
| 6 | භූගෝලීය තොරතුරු පද්ධති පිළිබඳ සහතිකය (නිපුණතා වැඩිදියුණු කිරීම) | මාස 03 | 60 |
| 7 | ඉංජිනේරු සමීක්ෂණ පිළිබඳ සහතිකය (මූලික වෘත්තීය කුසලතා) | මාස 03 | 60 |
| 8 | ඉදිකිරීම් සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ සහතිකය (නිපුණතා වැඩිදියුණු කිරීම) | මාස 03 | 60 |
| 9 | Autocad හි සහතිකය (නිපුණතා වැඩිදියුණු කිරීම) | මාස 03 | 60 |

**2025 සඳහා කාර්ය මණ්ඩලය සඳහා පුහුණු සැලැසුම**

| | පුහුණුව | සහභාගි කරවා ගැනීමට යෝජිත නිලධාරීන් ගණන | පුහුණු කාල පරිච්ඡේදය |
|---|---|---|---|
| 1 | කාර්යාල ක්‍රම | 25 | දින 01 |
| 2 | ආයතන සංග්‍රහය 1 කොටස | 25 | දින 02 |
| 3 | ආයතන සංග්‍රහය 2 කොටස | 25 | දින 01 |
| 4 | ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය | 25 | දින 01 |
| 5 | ඵලදායීතා සංකල්ප පිළිබඳ | 25 | දින 01 |
| 6 | මනෝවිද්‍යාත්මක වැඩසටහන | 25 | දින 01 |
| 7 | ආතති කළමනාකරණය | 25 | දින 01 |

## ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව (ECSL)

2017 අංක 04 දරණ ශ්‍රී ලංකා ඉංජිනේරු සභා පනත යටතේ ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව (ECSL) ස්ථාපනය කර ඇත.

**මෙම පනත මගින්,**

- ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීමය තත්ත්වය හා චර්යාව පවත්වාගෙන යාම සහ මෙහෙයවීමේ වගකීමටද,
- ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීමටද,
- ඒ හා සම්බන්ධ කාරණා හෝ ඊට අනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සැලසීමටද ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවට බලය පවරනු ලබයි.

**දැක්ම**



**ශ්‍රීලංකාවේ ඉංජිනේරු වෘත්තිකයන් කෙරෙහි මහජන විශ්වාසය තහවුරු කිරීම සහ රටේ සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා ක්‍රියාකාරී දායකයෙකු වීම.**

## මෙහෙවර

**ජාත්‍යන්තරව පිළිගත්, දේශීය වශයෙන් අදාළ ප්‍රමිති, නිපුණතාවය සහ රටේ සංවර්ධනය උදෙසා වෘත්තීමය කැපවීම පවත්වාගෙන යාම හා නීත්‍යානුකූලව පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකාවේ ඉංජිනේරු වෘත්තිකයන් විවිධ කාණ්ඩවල ලියාපදිංචි කිරීම.**



### 2024 වසරේ සිදුකරන ලද ක්‍රියාකාරකම්

**01. ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීම.**

2024 ඔක්තෝම්බර් 31 දින වනවිට ලියාපදිංචි කර තිබෙන ඉංජිනේරු වෘත්තිකයන් ගණන 16,365කි.

**02. විදුලි කාර්මිකයින් ලියාපදිංචි කිරීම.**

ශ්‍රී ලංකාවේ සියළුම විදුලි කාර්මිකයින් ඉංජිනේරු සභාවේ ලියාපදිංචි කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කර ඇත. සුදුසුකම්ලත් විදුලි කාර්මිකයින් ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ඉංජිනේරු කාර්මික කාණ්ඩයේ ලියාපදිංචි කිරීම සඳහා මහජන උපයෝගිතා කොමිසම, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, විදුලිබල මණ්ඩලය හා ලංකා විදුලි සමාගම සමඟ එක්ව අංක 2374/28 හා 2024 මාර්තු 7 දින දරණ ගැසට් නිවේදනය නිකුත් කර කරන ලදී. ඒ අනුව:

- ජනවාරි 01 දින සිට 2029 දෙසැම්බර් 31දක්වා කාලය තුළ විදුලි කාර්මිකයෙකු ලෙස ඊට අදාළ කටයුතුවල නියැළීමට ජාතික වෘත්තීය නිපුණතා සුදුසුකම 3 මට්ටම (NVQ Level 3) අවම සුදුසුකම ලෙස තිබීම අනිවාර්ය වේ.
- 2030 ජනවාරි 01 දිනෙන් පසුව, විදුලි කාර්මික ලෙස ඊට අදාළ කටයුතුවල නියැළීමට අවම වශයෙන් ජාතික වෘත්තීය නිපුණතා සුදුසුකම 4 මට්ටම (NVQ Level 4) සහ ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ලියාපදිංචි වීම අනිවාර්ය වේ.

ශ්‍රී ලංකාවේ විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රය තුළ විදුලි කාර්මික ශිල්පයේ ප්‍රමිතීන් ඉහළ නැංවීම, ප්‍රවේසම සහතික කිරීම සහ උසස් වෘත්තීය මට්ටමක් පවත්වා ගෙන යෑම සඳහා එම වෙනස්කම් සිදුකිරීමට තීරණය කරන ලදී.

විදුලි කාර්මිකයින්හට ජාතික වෘත්තීය නිපුණතා 3 වන හා 4 වන මට්ටම ළඟා කර ගැනීමට රුකුලක් වනු පිණිස මහජන උපයෝගිතා කොමිසම, තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසම සහ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සමග එක්ව් නොමිලේ පාඨමාලා සහ ඇගයීම් පැවැත්වීමට කටයුතු යොදා ඇත.

එයට අමතරව අනෙකුත් ක්ෂේත්‍රවල ඉංජිනේරු කාර්මිකයන් ලියාපදිංචි කිරීම සඳහා වැඩපිළිවෙළක් සකස් කිරීමට විශේෂ කමිටුවක් ද පත් කර ඇත.

**03. ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව, මහජන උපයෝගීතා කොමිෂන් සභාව සමඟ ඇති කරගත් අවබෝධතා ගිවිසුම.**

ඉංජිනේරු කාර්මිකයන්ගේ (විදුලි, වැද්දුම් හා වායු සමීකරණ) තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමඟ අවබෝධතා ගිවිසුමක් ඇති කරගන්නා ලදී. එම සහයෝගිතා වැඩපිළිවෙලට, ඉංජිනේරු කාර්මිකයන්ගේ ගුණාත්මකභාවය හා වෘත්තිමය තත්ත්වය වැඩි දියුණු කිරීම, ඔවුන්ගේ දායකත්වයට සමාජයේ පිළිගැනීමක් ඇති කිරීම, අඛණ්ඩ වෘත්තිමය වැඩිදියුණුව සඳහා අවස්ථා සලසා දීම සහ ඉංජිනේරු කාර්මිකයන්හට ව්‍යාපාරිකයන් වීමට ආධාර කිරීම යන කරුණු ප්‍රධාන වශයෙන් ඇතුළත්වේ.

**04. ශ්‍රී ලංකාවේ සිටින විදේශ ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීම.**

විදේශීය ඉංජිනේරු වෘත්තිකයන් සැමවිටම අදාළ රාජ්‍ය නීති රෙගුලාසි හා ප්‍රමිතීන්වලට අනුකූලව කටයුතු කළ යුතු බවටත් ඉංජිනේරු සභාවේ ලියාපදිංචිය කිසිලෙසකින්වත් එයින් නිදහස් කිරීමක් නොවන බවටත් දක්වන උපදෙස් ලියාපදිංචි සහතිකයේ ඇතුළත් කිරීමට කටයුතු කරන ලදී.

**05. වරලත් ඉංජිනේරුවරුන් සඳහා පිරික්සුම් ලැයිස්තුවක් සකස් කිරීම.**

උසස් තත්ත්වයේ සේවාවක් සහතික කිරීම පිණිස වරලත් ඉංජිනේරුවරුන්ගේ භාවිතය සඳහා සවිස්තරාත්මක පිරික්සුම් ලැයිස්තුවක් සකස් කිරීමට ඉංජිනේරු සභාව කටයුතු කරමින් පවතී.

**06. ඉංජිනේරුවන් සඳහා විනය පරීක්ෂණ ක්‍රියාවලිය.**

ඉංජිනේරුවන්ගේ විෂමාචාර ක්‍රියා සම්බන්ධයෙන් මහජනයාගෙන් ලැබෙන පැමිණිලි සලකා බැලීම සඳහා ක්‍රියාවලියක් සකස් කර තිබේ. මෙම ක්‍රියාවලිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා පියවර සකස් කරමින් පවතී.

## 2025 වසරේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබෙන වැඩසටහන්.

- ලියාපදිංචි කරන ඉංජිනේරු වෘත්තිකයන් සංඛ්‍යාව වැඩිකිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ඉංජිනේරු කාර්මිකයන්ගේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමඟ ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකාව තුළ සේවයේ යෙදී සිටින විදේශීය ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීම සඳහා පුළුල් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.
- දැනට ඉංජිනේරු ක්ෂේත්‍රෙය් සේවය කරන ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීමේදී පැනනැගී ඇති ගැටලු IESL හා IIESL ආයතන සමඟ තවදුරටත් සාකච්ඡා කර හැකිතාක් දුරට විසඳා ගැනීම.

මෙම වැඩසටහන් සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ඉංජිනේරු සභාවේ අරමුදල් වලින් සපයා ගැනීමට සැලසුම් කර තිබේ.

# මහවැලි උපදේශක කාර්යාංශය (MCB)

## දැක්ම



දකුණු ආසියානු කලාපයේ හරිත ප්‍රවේශයන්ගේ තිරසාරභාවයට සහය දෙමින් තිරසාර ලෝකයක ප්‍රමුඛ හරිත ජාතියක් ලෙස නැගී එන දිළිඳුකමින් තොර ශ්‍රී ලංකාවක් අපි අපේක්ෂා කරමු.

## මෙහෙවර

ජීවත්වීමට සුදුසු ලෝකයකට සහාය වෙමින් ශ්‍රී ලංකාව තුළ අන්ත දිළිඳුකම තුරන් කිරීම සහ හවුල් සමෘද්ධිය ප්‍රවර්ධනය කිරීම.



## අරමුණු



i. ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම - සියලුම ව්‍යාපෘති ශ්‍රී ලංකාව සඳහා තිරසාර සහ සමෘද්ධිමත් අනාගතයකට දායක වන බව සහතික කිරීම.

ii. තිරසාර සංවර්ධනය - මහවැලි උපදේශක සේවා කාර්යාංශයේ උපදේශන සේවා, අපගේ මෙහෙයුම්වල සෑම අංශයකටම අති නවීන තාක්‍ෂණික නවෝත්පාදනයන් ඒකාබද්ධ කරමින් තිරසාර සංවර්ධනයක් ඇති කිරීමට කැපවී සිටී.

iii. නවෝත්පාදනය - නව්‍ය, තිරසාර සහ බලපෑම් සහගත ප්‍රතිඵල ලබා දීම සඳහා පෙරළිකාර අදහස් සහ උසස් තාක්ෂණික විසඳුම් හරහා ප්‍රගතිය මෙහෙයවීම.

iv. විශිෂ්ටත්වය - ව්‍යාපෘති භාර ගැනීමට සහ උසස් තත්ත්වයේ නිමැවුමක් ලබා දීමට ඉහළ මට්ටමේ උපදේශකයින් පිරිසක් තබා ගැනීම.

v. සහයෝගීතාව - සහයෝගීතාවයේ සාර්ථකත්වය සහ තිරසාර වර්ධනයක් ඇති කිරීම සඳහා රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශ සහ ජාත්‍යන්තර ප්‍රවීණයන් සමඟ හවුල් වීමෙන් සහයෝගීතාව වර්ධනය කිරීම.



## ප්‍රධාන කාර්යයන්/ ක්ෂේත්‍ර

i. පාරිසරික ඇගයීම්
ii. උපාය මාර්ගික පාරිසරික ඇගයීම් (SEA)
iii. සමාජ බලපෑම් ඇගයීම් (SIAs)
iv. නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලසුම් (RAPs)
v. ඩිජිටල් කෘෂිකර්මය
vi. වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘති සඳහා මිනිස්බල සැපයුම සඳහා බඳවා ගැනීම
vii. කෘෂිකර්මය, ආහාර, සොබාදහම සහ ග්‍රාමීය සංවර්ධනය
viii. දේශගුණික විපර්යාස, ඔරොත්තු දීමේ හැකියාව සහ පරිසරය
ix. බලශක්තිය
x. රාජ්‍ය අංශයේ කළමනාකරණය සහ පාලනය
xi. රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය
xii. මානව හා සමාජ සංවර්ධනය
xiii. තිරසාර සංවර්ධන ඉලක්ක
xiv. ජලය සහ නාගරික සංවර්ධනය
xv. පාරිසරික උපදේශනය
xvi. දැනුම කළමනාකරණය සහ ධාරිතා ගොඩනැගීම
xvii. ජල ඉංජිනේරු සහ උපදේශනය
xviii. අපනයන කෘෂිකර්මය සහ අගය දාම වැඩිදියුණු කිරීම

### 2024 තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන

| අංක. | සපයන ලද සේවාව | ඉටු කරන ලද ක්‍රියාකාරකම | සේවාව සපයන ලද ආයතනය | මුළු වටිනාකම (රු. මිළි) | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|
| | | | | | භෞතික (%) | මූල්‍ය (රු.මිළි) |
| 01. | බලපෑම් තක්සේරු කිරීම | මූලික පාරිසරික විමර්ෂණය (IEE): අම්පාර දිස්ත්‍රික්කයේ යෝජිත ගල්ගේකණ්ඩිය ජලාශ ව්‍යාපෘතිය | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 3.63 | 85 | 3.09 |

| අංක. | සපයන ලද සේවාව | ඉටු කරන ලද ක්‍රියාකාරකම | සේවාව සපයන ලද ආයතනය | මුළු වටිනාකම (රු. මිලි) | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|
| | | | | | භෞතික (%) | මූල්‍ය (රු.මිලි) |
| | | පාරිසරික බලපෑම් තක්සේරුව (EIA): යෝජිත ගිං - නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය | වාරිමාර්ග අමාත්‍යාංශය | 38.85 | 90 | 15.54 |
| | | පාරිසරික බලපෑම් තක්සේරුව (EIA): මාඔය ද්‍රෝණියේ යටිමහන ජලාශ ව්‍යාපෘතිය | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 5.81 | 90 | 5.24 |
| 02. | නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලසුම් | - | | | | |
| 03. | ශක්‍යතා අධ්‍යයන | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන අදියර 2 ව්‍යාපෘතිය යටතේ වාණිජ කෘෂිකර්ම සංවර්ධන (CAD) සඳහා පූර්ව ශක්‍යතා අධ්‍යයනය | වාරිමාර්ග අමාත්‍යාංශය | 8.52 | 45 | 2.56 |
| **01.** මහවැලි උපදේශක සේවා කාර්යාංශය මගින් සපයනු ලබන විශේෂීකරණය වූ සේවාවන් | | | | | | |
| 01. | සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි සකස් කිරීම | මල්වතු ඔය, යාන්ඔය සහ මීඔය ගංගා ද්‍රෝණි සඳහා ගංවතුර කළමනාකරණය සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි (SOPs) සකස් කිරීම සඳහා සහාය සේවාව | CRIWMP වැව්ගම් පුබුදුව | 16.92 | 35 | 5.08 |
| 02. | සමීක්ෂණ සහ සීමා නිර්ණය කිරීම | අනුරාධපුර, වවුනියාව, කුරුණෑගල, පුත්තලම, මන්නාරම, පොළොන්නරුව සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල තෝරාගත් ග්‍රාමීය වාරිමාර්ග පද්ධතිවලට අයත් වන සංරක්ෂණ ප්‍රදේශ මැනීම සහ සීමා නිර්ණය කිරීම සඳහා වන සහාය සේවාව | CRIWMP වැව්ගම් පුබුදුව | 283.45 | 80 | 198.42 |

| අංක. | සපයන ලද සේවාව | ඉටු කරන ලද ක්‍රියාකාරකම | සේවාව සපයන ලද ආයතනය | මුළු වටිනාකම (රු. මිලි) | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|
| | | | | | භෞතික (%) | මූල්‍ය (රු.මිලි) |
| 03. | ඩිජිටල් පද්ධතිය නිර්මාණය කිරීම | "වියළි කලාපීය ගොවීන් සඳහා කාලගුණ උපදේශන පද්ධතිය ස්ථාපිත කිරීමට සහාය වීම සඳහා ඩිජිටල් පද්ධතිය ශක්තිමත් කිරීම" සඳහා වන උපකාරක සේවාව | CRIWMP වැව්ගම් පුබුදුව | 75.85 | 85 | 53.10 |
| 04. | සමීක්ෂණ සහ සැලසුම් සැකසීම | අනුරාධපුර මහකිරින්දේගම, පුත්තලම කුන්තනියාගම සහ වවුනියාවේ කප්පච්චිකුලම් ග්‍රාමීය වාරිමාර්ග පද්ධති වැඩිදියුණු කිරීම සඳහා සමීක්ෂණ සහ සැලසුම් සැකසීම සඳහා වන උපකාරක සේවාව | CRIWMP වැව්ගම් පුබුදුව | 57.55 | 100 | 57.55 |
| 05. | දත්ත සමුදාය සහ ජංගම යෙදුම් සංවර්ධනය | භූ-අවකාශ දත්ත සමුදාය සකස් කිරීම සහ ජංගම යෙදුම් සැකසීම සඳහා සේවාව | CRIWMP වැව්ගම් පුබුදුව | 3.74 | 100 | 3.74 |

- **2025 වර්ෂය තුළ දීද මෙම ව්‍යාපෘතිවල ඉතිරි වැඩ අඛණ්ඩව ක්‍රියාත්මක වේ.**

# වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති
## நீர்ப்பாசன அமைச்சின் ஊடாக நடைமுறைப்படுத்தப்படும் கருத்திட்டங்கள்
## Projects Implemented under the Ministry of Irrigation

**1. මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන/ மகாவலி நீர் பாதுகாப்பு முதலீட்டு நிகழ்ச்சித் திட்டம்/ Mahaweli Water Security Investment Program (MIWSIP)**





වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය/ வட மேல்மாகாண கால்வாய் கருத்திட்டம்/ North Western Province Canal Project (NWPCP





උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය/ வட மத்திய மாகாண கால்வாய்/ North Central Province Canal Project (NCPCP)





මිනිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය/ மினிபே இடக் கரை கால்வாய் மறு சீரமைப்பு /Minipe Left Bank Canal Rehabilitation Project (MLBCRP)

### 3. මොරගහකන්ද කළුගඟ ජලාශය ව්‍යාපෘතිය/ மொரகஹகந்த களு கங்கை நீர்த்தேக்க கருத்திட்டம்/ Moragahakanda Kaluganga Reservoir Project



මොරගහකන්ද ජලාශය/ மொரகஹகந்த நீர்த்தேக்கம்/
Moragahakanda Reservoir




කළුගඟ ජලාශය/களு கங்கை நீர்த்தேக்கம்/
Kaluganga Reservoir





ගුරුවෙල නැවත පදිංචි කිරීමේ ප්‍රදේශය/ குருவெல முள்குடியேற்ற பிரதேசம்/ Guruwela resettlement area

### 4. ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය /ஒருங்கிணைந்த நீரேந்து மற்றும் நீர்வளங்கள் முகாமைத்துவ கருத்திட்டம் / Integrated Watershed and Water Resource Management Project (IWWRMP)



කල්මඩු යෝජනා ක්‍රමයේ ප්‍රතිසංස්කරණය කිරීම - මූලස්ථායි / கல்மடு திட்டத்தில் சீர்திருத்தங்கள் - மூலஸ்தை / Rehabilitation of Kalmadu Scheme Headworks



මුහදන්කුලම් යෝජනා ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම / முகத்தான்குளம் திட்டத்தை சீரமைத்தல் / Rehabilitation of Muhathankulam Scheme





යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණ වැඩ කටයුතු / உள்கட்டமைப்பு சீரமைப்பு பணிகள் / Rehabilitation Works of Infrastructures

**6. නකල්ස් කඳුවැටියේ අවදානමට ලක්ව ඇති ගංගා ද්‍රෝණි, දිය ඇළි ආශ්‍රිත ප්‍රදේශ සහ පහළ ජල පෝෂක ප්‍රදේශයේ වාසය කරන ගොවීන් සහ වැවිලි ප්‍රජාවගේ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ ශක්තිය වැඩි දියුණු කිරීම (හරිත දේශගුණික අරමුදල) / இலங்கையில் நகல்ஸ் மலைத் தொடரின் நீரேந்து பிரதேசத்தில் அனர்த்தத்துக்கு உள்ளாகக் கூடிய ஆற்றுப் படுக்கைகளில், நீரேந்துப் பிரதேசங்கள் மற்றும் தாழ் ஆற்றுப் படுக்கைகளில் குடியேறியுள்ள விவசாயிகளினதும், விவசாயக் குடி மக்களினதும் காலநிலைக்கு முகங் கொடுக்கும் திறனை வலுவூட்டுதல் - (GCF நகல்ஸ் கருத்திட்டம்) / Strengthening Climate Resilience of Subsistence Farmers and Agricultural Plantation Communities residing in the vulnerable river basins, watershed areas and downstream of the Knuckles Mountain Range Catchment of Sri Lanka - (GCF Knuckles Project)**



පිටවල පතන ප්‍රදේශයේ රුක් තවාන් සංවර්ධනය / பிடவல பத்தனை பிரதேசத்தில் மர நாற்றங்கால் அபிவிருத்தி / Development of tree nurseries in Pitawala Pathana area



රංගල ප්‍රදේශයේ කෝපි අතුරු බෝග වගාව සහ පාංශු සංරක්ෂණය / ரங்கலா பகுதியில் காபி ஊடுபயிர் மற்றும் மண் பாதுகாப்பு / Coffee intercropping and soil conservation in Rangala area



පාංශු වර්ණාවලීක්ෂ රසායනාගාර උපකරණ සැපයීම / மண் நிறமாலை ஆய்வக உபகரணங்களை வழங்குதல் / Provision of soil spectroscopic laboratory equipment



ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සමඟ ජල සාම්පල එකතු කිරීම සහ ජල තත්ත්ව පරීක්ෂාව / இலங்கை அணுசக்தி வாரியத்துடன் நீர் மாதிரி சேகரிப்பு மற்றும் நீர் தர சோதனை / Water sample collection and water quality testing with Sri Lanka Atomic Energy Board

# ක්‍රියාත්මක ආයතන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති / වැඩසටහන්
# செயற்படும் நிறுவனத்தின் ஊடாக நடைமுறைப்படுத்தப்படும் கருத்திட்டங்கள்/ நிகழ்ச்சிகள்
# Projects / Programmes Implemented under the Implementing Institutions

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව
## நீர்ப்பாசன திணைக்களம்
## Irrigation Department

### 1. යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය/யான் ஓயா நீர்த்தேக்கத் திட்டம்/ Yan Oya Reservoir Project



සවරාරු අමුණ වැඩිදියුණු කිරීම / சவராறு அணைக்கட்டு மேம்பாடு / Improvements to Savararu Anicuit



ඉස්සන් වැව වගා භූමි සංවර්ධනය / இறால் பண்ணை நிலத்தை மேம்படுத்துதல்/ Issanwewa Irrigable area development

### 2. මොරාණ ජලාශය/ மொரான நீர்த்தேக்கம்/ Morana Reservoir



ප්‍රධාන ඇළ බැම්ම මාර්ගයෙහි සංවර්ධන කටයුතු / பிரதான அணைக்கரை சாலையில் வளர்ச்சி பணிகள்/ Development works on the main embankment road



මොරාණ ජලාශ ව්‍යාපෘතිය / மொரானா நீர்த்தேக்க திட்டம் / Morana Reservoir Project

### 3. ඇල්ල වැව ජලාශය/ எல்ல வாவி நீர்த்தேக்கம்/ Ella Wewa Reservoir





සොරොව්ව සහ ප්‍රධාන බැම්මේ දකුණු ඉවුරෙහි ඉදිකිරීම / பிரதான கரையின் வலது கரையில் மதகு மற்றும் கட்டுமானம் / Sluice structure and Right Bank of Main Bund

**2. උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය/ உமா ஒய பல் நோக்கு அபிவிருத்தி கருத்திட்டம்/ Uma Oya Multipurpose Development Project**

උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය - ජනතා අයිතියට පැවරීම / உமா ஒய பல் நோக்கு அபிவிருத்தி கருத்திட்டம் - பொது உடைமைக்கு மாற்றவும் / Uma Oya Multipurpose Development Project - Transfer to public ownership







පුහුල්පොල වේල්ල / புஹுல்பொல அணைக்கட்டு / Puhulpola Dam



ඩයරබා ජලාශය/ டயரபா அணைக்கட்டு / Dyaraba Dam



පෙරආර උමග /பெற அரா சுரங்கப்பாதை/Headrace Tunnel




භූගත බලාගාරය/நிலத்தடி மின் நிலையம் /Underground power house

4. උමාඔය පහළ නිම්න සංවර්ධනය /உமா ஓய பல்நோக்கு அபிவிருத்தி / **Uma Oya Downstream Development**





උමා ඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘති කටයුතු / உமா ஓயா கீழ்நிலை அபிவிருத்திதிட்டம்/ Uma Oya Downstream Development Project

5. හිඹිලියාකඩ වාරි යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය/ ஹிம்பிலியகட நீர்ப்பாசன உட்கட்டமைப்பு அபிவிருத்திதிட்டம்/ **Himbiliyakada Irrigation Infrastructure Development Project**





හිඹිලියාකඩ වැව හා වැව් බැම් ප්‍රතිසංස්කරණය කිරීම/ஹிம்பிலியகட குளம் மற்றும் குளக்கரையை புனரமைத்தல்/ Rehabilitation of Himbiliyakada tank and tank bund

## වාරිමාර්ග කළමනාකරණ අංශය
### நீர்ப்பாசன முகாமைத்துவ பிரிவு
## Irrigation Management Division

2024/25 මහ කන්න රැස්වීම / 2023/24 பருவ கூட்டம் / 2023/24 Maha Seasonal Meeting



රාජාංගනය ව්‍යාපාරය / ராஜாங்கனா திட்டம் / Rajanganaya Project



බතලගොඩ ව්‍යාපාරය / பதலகொட திட்டம் / Bathalagoda Project

නිරන්තර නඩත්තු වැඩසටහන / நீர்ப்பாசன துணை அமைப்பின் வழக்கமான பராமரிப்பு / Regular maintenance of Irrigation sub system

කෘෂි නිෂ්පාදනය/ விவசாய உற்பத்தி / Agricultural Production





3වන කන්නයේ මුං වගාව / 3வது பருவ பயறு திட்டம் 3rd Season Green Gram cultivation



"සිරි දළදා යල් අස්වනු පූජාව" / "ஸ்ரீ தலதா யல் அஸ்வானு பூஜை" / "Siri Daladha Yal Aswanu Pujawa"



වාරි බල ප්‍රදේශ මට්ටමින් යල් අස්වනු පූජාව / பாசனப் பகுதி அளவில் யல் அஸ்வானு பூஜை / Yal Aswanu Puja irrigation sector wise

## ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

## இலங்கை மகாவலி அதிகாரசபை

## Mahaweli Authority of Sri Lanka

**මහවැලි කලාපවල අතහැර දැමූ ඉඩම් ප්‍රයෝජනයට ගනිමින් කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන 10ක් පිහිටුවීම / மகாவலி வலயங்களில் கைவிடப்பட்ட காணிகளைப் பயன்படுத்திய வண்ணம் விவசாயத் தொழில் முனைவு தொடர்பாக 10 கிராமங்களை நிலை நாட்டுதல் / Establishment of 10 Agro-entrepreneurship villages, utilizing abandoned lands in Mahaweli Zones**



අනෙකුත් ක්ෂේත්‍ර බෝග වගා වපසරිය ඉහල නැංවීම (මිරිස්) /ஏனைய திடல் பயிர்களின் பரப்பை அதிகரிப்பது (மிளகாய்)/ Increasing the area under other field crops (Chili)



ගෝවා නිෂ්පාදන වගාව ප්‍රවර්ධනය/ கோவா உற்பத்தியை ஊக்குவித்தல்/ Promotion of Cabbage production



කහ වගාව ප්‍රවර්ධනය/ மஞ்சள் பயிர் செய்கை ஊக்குவித்தல் / Promotion of Turmeric cultivation



පැළ නිෂ්පාදනය (මහවැලි තවාන්, පාසල් ළමුන් හා ගොවීන් මඟින්)/ கன்று உற்பத்தி (மகாவலி நாற்றங்கால்,பாடசாலை மாணவர்கள் மற்றும் விவசாயிகல் ஊடக / Plants production (By Mahaweli nurseries, school children and farmers)

## ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය
## மத்திய பொறியியல் ஆலோசனைப் பணியகம்
## Central Engineering Consultancy Bureau (CECB)





අකුරේගොඩ ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය (DHQC). / பாதுகாப்பு தலைமையகவளாகம் (கட்டடக்கலை, பொறியியல் மற்றும் அளவு கணக்கெடுப்புபணிகள்). / Defense Head Quarters Complex (Architectural, Engineering And Quantity Surveying Works), Akuregoda





නාවික ජැටිය ඉදිකිරීම - ත්‍රිකුණාමලය / ஜட்டி கட்டுமானம் - திருகோணமலை / Construction of Navel Jatty - Trincomalee






කොළඹ මහනගර ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය, අරුවක්කාරු / கொழும்பு பெருநகர திடக்கழிவு முகாமை திட்டம், அருவக்காறு / Metro Colombo Solid Waste Management Project